

# ඉසිවරුන් දුටු
# මගේ බව ගමන 1

අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත
අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය
මහනාහිමියන් සමග මා පැවැත්වූ
රූපවාහිනී සාකච්ඡා සහ
උන්වහන්සේ විසින් ප්‍රකාශයට පත් කළ ලිපි ලේඛන ඇසුරෙනි.

මෛත්‍රී රත්නායකගේ සංස්කරණයකි.

Scanned by TapScanner

# ඉසිවරුන් දුටු මගේ බව ගමන (I)

අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත
අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය
මහ නාහිමියන් සමඟ මා පැවැත්වූ
රූපවාහිනී සාකච්ජා සහ
උන්වහන්සේ විසින් ප්‍රකාශයට පත් කළ ලිපි ලේඛන
ඇසුරෙනි.

බදුල්ලේ මෛත්‍රී රත්නායකගේ සංස්කරණයකි.
කර්තෘ ප්‍රකාශනයකි.

# ඉසිවරුන් දුටු මගේ බව ගමන - (1)

අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රය මහ නාහිමියන් සමග මා පැවැත්වූ රූපවාහිනී සාකච්ඡා සහ උන්වහන්සේ විසින් ප්‍රකාශයට පත් කළ ලිපි ලේඛන ඇසුරෙනි.

**බදුල්ලේ මෛත්‍රී රත්නායකගේ සංස්කරණයකි.**

පළමු මුද්‍රණය - 2017 අගෝස්තු
දෙවන මුද්‍රණය - 2017 සැප්තැම්බර්
තෙවන මුද්‍රණය - 2017 නොවැම්බර්
සිවුවන මුද්‍රණය - 2018 මැයි

**ISBN**- 978-955-42360-0-4

**පිට කවර නිර්මාණය**
බදුල්ලේ මෛත්‍රී රත්නායක

**පරිගනක කටයුතු**
ඉනෝකා දිසානායක
තේජා අතපත්තු
සුරේඛා නිල්මිණි

**ප්‍රකාශනය**
මෛත්‍රී රත්නායක පදනම
20/ඒ මඟුරුවීල පාර
ගෝනවල (බ/ප)
කැලණිය - ශ්‍රී ලංකාව

**දුරකථනය - 0112 917572**
**071 9633422**

**මුද්‍රණය**
ඉමාෂි ප්‍රකාශන
විජේරාම, නුගේගොඩ.

# කතෘගේ වෙනත් කෘති - සිනමා (කෙටි චිත්‍රපට)

| | |
|---|---|
| පහන් තරුව | මිමි 35 සුදු කළු |
| වාසනා මඟ | මිමි 35 සුදු කළු |
| සෙවනැල්ල | මිමි 35 සුදු කළු |
| අසන නිරිඳෝ වෙන කොයින්දා | මිමි 35 සුදු කළු |
| පියාපත් ලදිමි | මිමි 35 සුදු කළු |
| සංගණනයි ඔබයි | මිමි 35 සුදු කළු |
| යොවුන් පුරය ( 1) | මිමි 35 සුදු කළු |
| යොවුන් පුරය( 2 ) | මිමි 35 සුදු කළු |
| යොවුන් පුරය( 3 ) | මිමි 35 සුදු කළු |
| බුලත් හුරුල්ලක් | මිමි 35 සුදු කළු |
| සිලිඳුලාගේ ලෝකයට හිරු පායයි | මිමි 35 සුදු කළු |
| ජයග්‍රහණය | මිමි 35 සුදු කළු |
| විජයග්‍රහණයට මාවත | මිමි 35 සුදු කළු |
| කොලරා | මිමි 35 සුදු කළු |
| සිහිනයක මල් පිපුනි | මිමි 16 වර්ණ |

**වීඩියෝ වාර්තා චිත්‍රපට :**

නිම්නයේ නිධානය    තවත් සිහිනයක්    හිසට සෙවනක්

ජයග්‍රහණය **(කොටස් 7 කින් යුත් වාර්තා වෘතාන්තයකි.)**

ආවර්ජනා    සෙවනයි පිළිසරණයි

ඉසිවරුන් දුටු බව ගමන    උතුරට සහනයයි පිළිසරණයි

කිම බැඳිවල යන්නේ    පුතුනි බලන් යොමා නුවන්

මිහිගැබට ගිය ගමනක්

**ශාස්ත්‍රීය විචාර :**

කාලගුණ අනාවැකි සහ ජෝතිෂ්‍යය

මේඝ දූත විචාරය    මේඝ දූතය

**කෙටි කතා :**

පෙරහැර    කිරිඅම්මා    මනුස්සකම

**වේදිකා නාට්‍ය :**


නෙළුම් බණ්ඩාරගේ ලෝකය    මනෝකාය    නාට්‍යයක්    කිරි අම්මා

**ගුවන් විදුලි නාට්‍ය**

ඉසිවරුන් දුටු බව ගමන    තණ්හාය ජායති සෝකෝ    ආලෝකෝ උදපාදී



Scanned by TapScanner


ආචාර්ය අත්තනායක එම් හේරත්

# පෙරවදන

ගෙමුනු රත්නායක සැදැහැතා මට හමු වූයේ 1976
වර්ෂයේ එක්තරා දවසක දී බදුල්ලේ ධර්මදූත
විද්‍යාලයේ දී ය. එතුමා සාරසවි අධ්‍යාපනය
ලබමින්, අප විද්‍යාලයට ගුරුවරයෙකු ලෙස ආවේය.
සා. විද්‍යාත්මක ගුරුවරයෙකු ලෙසත් සාම්ප්‍රදායික
ධ්‍යානයක කුමාරයෙකු ලෙසත් හෙම්බත්ව සිටි අපට
එතුමාගේ ආගමනය සුවිශේෂ විය. මේ ලෝකයේ
අත්තනායක එම්. හේරත් ඇදුරුතුමාගේ වියට
විසතුමා එතුමා ය. රටේ ජාතියක් ආධ්‍යාත්මික
වූ උරුමයක් එතුමා මට හුරුපුරුදු කළේ ය.
ඉසිවරුන් දුටු මගේ බව ගමන කෘතියට
පෙරවදනක් ලියන්නට මට හැකි වීම භාග්‍යයක්.
වීදු මට අධ්‍යාපනයට එක දුන් ගෞරවය
මාසික ගිණුම දී ඇදුරු ශිෂ්‍යයන්ගේ කිරීමක
වා මනට සඳහන් දෙසවන් ඉමහත් ඇදුරු
ගෞරවයකින්, අද මට අධ්‍යාපනයට එක
හිත දුන් එතුමා අද ලෝකයේ ම ඉහළම
නව ලෙස ඔබමන ස්වයංකාර උරුමයට එක
හිත දෙමින් සිටින්නේ ය. ප්‍රිය ඇදුරුතුමන්
වා, මනට කෙසේ අපි ලෝකයට හඳුන්වා
දෙන්න ද?

(අත්තනායක එම්. හේරත්)
මහාචාර්ය ...

මහාචාර්ය අත්තනායක එම්. හේරත්
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

# අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් පිලිබඳවයි...

| | |
|---|---|
| **උපත** | - 1896 අගෝස්තු මස 22 සෙනසුරාදා බලංගොඩ කිරිඳිගල දී. |
| **මව්පියන්** | |
| **පියා** | - නාරංගොඩ ආරච්චිගේ මෙතියස් අප්පුහාමි මහත්මා |
| **මව** | - බෙන්තර ආරච්චිගේ හීන්මැණිකේ මහත්මිය |
| **පැවිදිවීම** | - 1911 මාර්තු මස 02 දින උඩුමුල්ලේ ශ්‍රීනන්දාරාමයේදී |
| **ගුරුහිමියන් වහන්සේ** | - විනයාචාර්ය ආභිධම්මක අති පූජ්‍ය දෙනිහේනේ සිලා නන්ද නා හිමියන් වහන්සේ |
| **උපසම්පදා වීම** | : 1916 ජුලි මස 14 වන දින බලංගොඩ ඕලුගහ උදකුක්ඛේප සීමා මාලකයේදී. |
| **උපාධ්‍යයන් වහන්සේ** | : මහවලතැන්නේ ශ්‍රී චන්ද්‍රසේකරාමධිපති අති පූජ්‍ය දාමහන ධම්මානන්ද නා හිමියන් වහන්සේ |

# ගෞරව සම්මාන උපාධි

| | |
|---|---|
| **අභිධජ මහා රට්ඨගුරු** | බුරුම රජය |
| | **(සංඝ රාජ පදවියකි.)** |
| **අග්ගමහා පණ්ඩිත** | බුරුම රජය |
| **මහා නායක** | අමරපුර නිකාය |
| **උප කුලපති** | විද්‍යෝදය විශ්වවිද්‍යාලය |
| | (වර්තමාන ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) |
| **සාහිත්‍ය ශූරී** | විද්‍යෝදය විශ්වවිද්‍යාලය |
| | (වර්තමාන ජයවර්ධනපුරවිශ්වවිද්‍යාලය ) |
| **සාහිත්‍ය චක්‍රවර්ති** | විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය |
| | (වර්තමාන කැලණිය විශ්වවිද්‍යාලය) |
| **සාහිත්‍ය ශූරී** | සබරගමුව විශ්වවිද්‍යාලය |
| **මහාචාර්ය** | මහායාන අධ්‍යයන අංශය |
| | විද්‍යෝදය විශ්ව විද්‍යාලය |
| | (වර්තමාන ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ) |

**මහාචාර්ය බෞද්ධ අධ්‍යයන අංශයේ**

| | |
|---|---|
| **විනේතෘ** | විද්‍යෝදය විශ්ව විද්‍යාලය |
| | (වර්තමාන ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ) |

බෞද්ධ ධර්මීය ප්‍රචාරක නා හිමිනමකි

කීර්තිධර දේශකයාණන් වහන්සේ නමකි.

**භාෂා ඥානය පිළිබඳ විශාරදත්වය**

1. සිංහල 2.ඉංග්‍රීසි 3.පාලි 4.සංස්කෘත 5.ලතින් 6.ජර්මන් 7. තෙළිගු 8. බුරුම බස

| | |
|---|---|
| **අපවත්වීම** | 1998 ජුලි මස 18 දින ජයවර්ධනපුර |
| | මහ රෝහලේදී |
| | (දහවල් 12.35 - ඉරු දින) |

Scanned by TapScanner

# නිවන් සුව අත්වේවා....!


ඉසිවරුන් දුටු බව ගමන නම් වූ වීඩියෝ වාර්තා චිත්‍රපටය නිපදවීමේදී සම්මුඛ සාකච්ඡා ලබා දීමෙන් සහ නන් අයුරින් උදව් උපකාර කළ බොහෝ දෙනෙකු මේ වනවිට මෙම භවයෙන් සමුගෙන ඇත. ඒ හැම ගෞරවයෙන් සිහිපත් කරමින් මෙම සටහන ගෞරව නමස්කාර පූර්වකව පූජා කරමි.

- ❖ අපවත් වී වදාල අභිධජ මහා රට්ඨගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රය මහ නා හිමියන් වහන්සේට
- ❖ ලෝක පූජිත තාරකා විද්‍යාඥ ආතර් සී. ක්ලාක් ශ්‍රීමතාණන්ට.
- ❖ ලංකා රක්ෂණ ආයතනයේ සභාපතිව සිටි මහාචාර්ය ලීනස් ද සිල්වා ශ්‍රීමතාණන්ට.
- ❖ කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිව සිටි මහාචාර්ය නන්දදාස කෝදාගොඩ ශ්‍රීමතාණන්ට.
- ❖ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය නන්දසේන රත්නපාල ශ්‍රීමතාණන්ට.
- ❖ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්.එම්. සිරිසෝම ශ්‍රීමතාණන්ට.
- ❖ හිටපු මහ දිසාපති ඩී. එච්. අර්සකුලසූරිය ශ්‍රීමතාණන්ට.
- ❖ මුදල් අමාත්‍යාංශයේ ප්‍රවෘත්ති අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ජනමාධ්‍යවේදී ප්‍රභාත් මානවසිංහ ශ්‍රීමතාණන්ට

Scanned by TapScanner

- ❖ උපාලි පුවත්පත් සමූහයේ ''දිවයින'' පුවත්පතේ ප්‍රවෘත්ති කර්තෘ දයාරත්න රණසිංහ ශ්‍රීමතාණන්ට.
- ❖ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හිටපු සහකාර අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ජන මාධ්‍යවේදී එච්.එම්.ගුණසේකර ශ්‍රීමතාණන්ට.
- ❖ වියත් ලේඛක පුවතිසි අලගියවන්න ශ්‍රීමතාණන්ට.
- ❖ වියත් ජනමාධ්‍යවේදී අරූල් රාජා ශ්‍රීමතාණන්ට.
- ❖ මුදල් අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ වීඩියෝකරණ ශිල්පී සමන් රංගනාත් ද සිල්වා මහත්මාට.
- ❖ ශ්‍රී කෞෂික අගස්තියර් නාඩි ජ්‍යෝතිෂ්‍යය ආයතනයේ නාඩි වාක්‍ය කියවීමෙන් සහය දුන් ශ්‍රී චන්ද්‍රසේකරන් මහත්මාට.

# කාලාම සූත්‍රය



''මා අනුස්සවේන, මා පරම්පරාය, මා ඉතිකිරාය,
මා පිටක සම්පදානේන, මා තක්ක හේතු,
මා නාය හේතු, මා බබ්බ රූපකාය, මා දිට්ඨී විජ්ජා
නක්බත්තියා, මා සුමනා ගරෝතීති.''

මා කියූ පමණින්වත්,
පරම්පරාවෙන් පැවත එන පමණින් වත්,
සූත්‍ර,විනය,අභිධර්ම යන පිටක ග්‍රන්ථවල සඳහන් වූ පමණින්වත්
මෙය නිවැරදි යැයි පිළි නොගන්න.
ඔබගේ තර්කයට වැටහෙන්නේ නම් පමණක් ද
තම බුද්ධියට ගෝචර වන්නේ නම් පමණක් ද පිළිගන්න.

(ගෞතම බුදුන් වහන්සේ)

# මගෙන් වදනක්,

කුඩා කල සිටම විවිධ විෂයයන් අලලා ලියැවුණ පත පොත කියවීමට මම මහත් අභිරුචියක් දැක්වීමි. දහවන පන්තිය පමණ වනවිට එවකට මා ඉගෙනීම කළ බදුල්ල මහා විද්‍යාලයේ පුස්තකාලයේ ඇති පොත් රැසක්ම කියවා තිබිණි. එක් අවස්ථාවක සිදු වූ සිදුවීමක් මගේ මතකයේ තවමත් රැඳී පවතී. පුස්තකාලයේ එක් අල්මාරියක ලස්සනට පෙළ ගස්වා තිබූ කවුරුත් අත නොගැසූ පොත් පෙළක් මා නෙත ගැටුනි.

ඒ ත්‍රිපිටක පොත් පෙලයි. එම පොත් සියල්ලම කියවා අවසන් කළ යුතු යැයි මට සිතක් පහළ විය. පොතක් ගතිමි. එය ත්‍රිපිටකයට අයත් විනය පිටකයේ පාරාජිකා පාලියට අයත් පොතක් විය. විවේක ඇති විටෙක පන්තියේ අන්තිම පෙළට වී පොත කියවමින් සිටියෙමි. අලුත පාසලට පත් වූ ගුරු ස්වාමීන් වහන්සේ මා කරා පැමිණ මගේ අතින් පොත උදුරා ගෙන පොත දෙස බලා ''තමුන් මොකටද මේ පොත් කියවන්නේ'' කියා කන හරහා පහරක් ගසා පොත රැගෙන ගිය සේක. එදා පටන් මට ත්‍රිපිටකය කියවීම එපා විය. ඒ පාසල් සමයේදීය.

පොත් කියවීම හැරුණු විට මගේ සිත් ගත් තවත් විෂයයන් කිහිපයක් විය. **භූත විද්‍යාව, මනෝ විද්‍යාව, ජ්‍යෝතිෂ්‍යය, හස්ත රේඛා විද්‍යාව, මලවුන් කැඳවීම,වැනි පත පොත කියවීමට ද ඒ පිළිබඳ කෙරෙන කටයුතු නිරීක්ෂණය කිරීමට ද මම මහත් සේ ඇලුම් කළෙමි. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන ස්ථානවලට** ගොස් ඒවා නිරීක්ෂණය කිරීමටද මම උත්සුක වුණෙමි.

ඒවායේ සත්‍ය අසත්‍යතාව සෙවීම මගේ පරමාර්ථය නොවූ අතර ඒ පිළිබඳ විමසිලිමත්ව නිරීක්ෂණය කිරීම මගේ සිරිත විය.

දිනක් රසවාහිනී සඟරාවක පළ වූ අති පූජ්‍ය අග්ග මහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රය මහානායක ස්වාමීන් වහන්සේ විසින් රචිත **''අරුම පුදුම නාඩි වාක්‍ය''** නම් වූ ලිපිය කියවීමට මට අවස්ථාව ලැබුණි. ඒ වනවිට අති පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රය මහ නාහිමියන් මා කිසි දිනෙක දැක නොතිබිණි. කතා බහ කර නොතිබිණි. උන්වහන්සේ විසින් රචිත පත පොත ලිපි ලේඛන පමණක් කියවා තිබිණි.

එහෙත් උන්වහන්සේ පිළිබඳ මා තුළ කුඩා කළ සිටම පැවතියේ අසීමිත ගෞරවයකි. ආදරයකි. භක්තියකි.

**''අරුම පුදුම නාඩි වාක්‍ය''** ලිපිය කියවීමෙන් පසු මේ පිළිබඳ කරුණු සෙවීමට මට සිතක් පහල විය. ලංකාවේ විවිධ පළාත්වලට ගිය අවස්ථා දී මේ පිළිබඳ කරුණු සෙවූ නමුත් **''නාඩි වාක්‍ය''** කියවන්නන් පිළිබඳ කිසිදු හෝඩුවාවක් හෝ සොයා මට ගැනීමට නොහැකි විය.

වසරකට වරක් දෙවරක් ඉන්දියාවේ සිට නැව් මගින් ''නාඩි වාක්‍ය'' කියවන්නන් යාපනයට පැමිණෙන බවත්, යාපනයේ රැඳී සිට ඔවුන්ගේ සේවය ලබා ගැනීමට ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් පැමිණෙන අයට ''නාඩි වාක්‍ය'' කියවන බවටද ආරංචියක් මට ලැබිණි.

ද්‍රවිඩ ජනතාව කලින් වෙන් කරවා ගත් දිනවල යාපනයට ගොස් මෙම ''නාඩි වාක්‍ය'' කියවා ගන්නා බවටද ආරංචි විය.'නාඩි වාක්‍ය'' කොළඹ වෙසෙන ද්‍රවිඩ පවුල්වල අය අතර බෙහෙවින් ප්‍රචලිතව ඇති බව ද දැන ගන්නට ලැබුණි. මා යාපනයට ගිය අවස්ථාවක ''නාඩි වාක්‍ය''

කියවන්නන් පිළිබඳ සෙවූ විට දැන ගන්නට ලැබුණේ ඔවුන් ඒ වන විටත් ආපසු ඉන්දියාවට ගොස් ඇති බවයි.

**ද්‍රවිඩ ජනතාව මෙම ක්‍රමය හැඳින් වූයේ කාණ්ඩම් කියවීම නමිනි.**

1988 දී පමණ නාඩි කියවන්නන් කොළඹ කොල්ලුපිටියේ වෙසෙන බවට ලද ආරංචිය අනුව මම ඔවුන් සොයා ගියෙමි. කොල්ලුපිටියේ නිවෙසක් කුලියට ගෙන සිටි නාඩි කියවන පිරිස මට හමුවිය.

පසුව මේ පිරිස කොල්ලුපිටියේ විජිලන්ඩ් හෝටලයේ රැඳී සිටිමින් සිය සේවා කටයුතු කළහ. දිනකට තුන් හාරසියයක පමණ පිරිසක් නාඩි වාක්‍ය ඇසීමට පැමිණෙන අතර නාඩි වාක්‍ය කියවීමේ අවස්ථාව දිනකට සලසා දිය හැකිව තිබුණේ ඉන් 20 කට හෝ උපරිම 25 කට පමණි.

එහෙයින් මෙම අවස්ථාව ලබා ගැනීම සඳහා බොහෝ විට අවුරුද්දක්, සමහර විට අවුරුදු දෙකක් පමණ ගත වූ අය ද මට හමුවිය. මට එම අවස්ථාව උදා වූයේ වසර එක හමාරකට පමණ පසුවය.

මා සහ මගේ පවුලේ අයගේ ද තවත් මගේ හිතවතුන්ටද සම්භාවනීය පුද්ගලයින්ට ද මෙම අවස්ථාව ලබාදීමට මට හැකි විය. වසර දෙකකට වැඩි කාලයක් කොල්ලුපිටියේ විජිලන්ඩ් හෝටලයේ රැඳී සිටිමින් නාඩි වාක්‍ය කියවීමට පැමිණෙන විවිධ පුද්ගලයින් හා ඔවුන්ගේ අදහස් හා මති මතාන්තර ද නාඩි වාක්‍ය ගැන, පෙර අත්දැකීම් පිළිබඳව අන් අයගේ අදහස් සෙවීමටත් මට අවස්ථාව ලැබුණි. මෙම කාර්යයේ දී අගස්ති කෞෂික නාඩි ආයතනයේ ආචාර්ය ජයසංඛර් මහතාත් එම කාර්ය



Scanned by TapScanner

මණ්ඩලයෙනුත් ලද නොමඳ සහාය මම ස්තුති පූර්වකව සිහිපත් කරමි. ජයසංබර් මහතා ඇතැම් වැදගත් පුද්ගලයින් හා කාන්තාවන් මට හඳුන්වා දෙමින් මගේ කටයුතුවලට බෙහෙවින් උදව් කළ බව නැවතත් සිහිපත් කරමි.

මෙම දෙවසර තුල නාඩි වාක්‍ය ඇසීමට එවකට සිටි ජනාධිපතිතුමා, මැති ඇමැතිවරුන්, විදේශීය රාජ්‍ය දූත මණ්ඩල ප්‍රධානීන්, විවිධ රටවලින් මෙරටට පැමිණෙන සංචාරකයින්, මෙරට ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින්, පසුකාලීනව ඉතා ජනප්‍රිය වූ ප්‍රසිද්ධ කලාකරුවන්, අධ්‍යක්ෂවරුන්, පරිපාලන ලේකම්වරුන්, දිසාපතිවරුන් හා විවිධ තරාතිරමේ නිලධාරීන් ද සාමාන්‍ය ජනයා ද පැමිණෙන ආකාරය මට දක්නට ලැබුණි.

බෞද්ධ භික්ෂූන් වහන්සේ, මුස්ලිම් හා කතෝලික දේවගැතිවරුන් ද කන්‍යා සොයුරියන්ද මෙම නාඩි වාක්‍ය කියවා ගැනීමට පැමිණ සිටිනු බොහෝ අවස්ථාවල දැකගැනීමට මට හැකි විය.

එහෙත් ඒ කිසිවෙකු හෝ නාඩි වාක්‍ය පිළිබඳ ප්‍රසිද්ධියේ අදහස් දැක්වීම ප්‍රතික්ෂේප කළ ද පෞද්ගලිකව මා හා තොරතුරු බෙදා ගත් අතර ඔවුන් ඒවා ප්‍රසිද්ධ නොකරන ලෙසටද ඉල්ලීමක් කළේය.

එවකට සාමාන්‍ය මන්ත්‍රීවරයෙකුව සිටි මා මිත්‍රයෙකු සේ එකල සැලකූ වර්තමානයේ මහා ප්‍රබල දේශපාලනඥයෙකු නාඩි වාක්‍ය කියවීමට මා හරහා අවස්ථාව ලබාගත් අතර එකී මන්ත්‍රීවරයාට එවකට පැවති තදබල අපල හේතුවෙන් ජීවිත හානි සිදුවීමට ඉඩ ඇති බවත් එය වළක්වා ගැනීමට කළයුතු පුද පූජා පිළිබඳවත් නාඩි වාක්‍ය මගින් ප්‍රකාශ කරනු ලැබිණි. සිදුවිය හැකි හානිය අවම කර ගැනීමට එකී පුද පූජා කැමැත්තෙන් හෝ අකමැත්තෙන් කරන ලෙසට ඒ මන්ත්‍රීවරයාට මම දැන්වීමි.



Scanned by TapScanner

ඒ අනුව සියලුම පුද පූජා **මෝදර කාලි කෝවිලේ දී නාඩි** වාක්‍යවල කියා ඇති ආකාරයටම සිදු කෙරිණි.

පසුකාලීනව එම මන්ත්‍රීවරයා දේශපාලන කටයුතු වල නිරතව සිටියදී සතුරන්ගේ පහරදීමකට මැදි වූ අතර තවත් විටෙක ත්‍රස්ත ප්‍රහාරයකට ද ලක්විය. එම සිදුවීම්වලින් ජීවිතයට හානි නොවූ අතර අදත් ඒ මන්ත්‍රීවරයා ප්‍රබල දේශපාලන භූමිකාවක නිරතව සිටී.

නාඩි වාක්‍යකරුවන් ඇසුරු කරමින් මා ලද අත්දැකීම් හා විද්වතුන්ගේ සහභාගීත්වයෙන් විමර්ශනය කොට වීඩියෝ වාර්තා  චිත්‍රපටයක් කිරීමට මා තුළ බලවත් ආශාවක් ඇතිවිය. මා මිත්‍ර ප්‍රභාත් මානවසිංහයන් ද මෙම අදහසට මහත් සේ උනන්දුවක් දැක්වීය. එය මා ලද භාග්‍යයක් විය. අපගේ පළමු සැලසුම වූයේ විවිධ ක්ෂේත්‍රයන්ගෙන් තෝරාගත් විද්වතුන් සමූහයකට නාඩි වාක්‍ය කියවා ගැනීමේ අවස්ථාව සලසා දී ඔවුන්ගේ නිර්ව්‍යාජ අදහස් වීඩියෝ ගත කිරීමයි.

ඒ වන විටත් නාඩි වාක්‍ය කියවා අත්දැකීම් සම්භාරයක් ලබා සිටි **අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමියන් විශේෂඥ විද්වතා ලෙස තෝරා ගත්තෙමු. තාරකා ශාස්ත්‍රය පිළිබඳ ලෝක ප්‍රකට විද්වතෙකු වූ ආතර් සී. ක්ලාක් මහතා ද, වෛද්‍ය විද්‍යා අංශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මහතා ද, විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ පීඨාධිපති මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ද, ශ්‍රී ලංකා ජනරජයේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්.එම්. සිරිසෝම මහතා ද, කොළඹ  විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අංශයේ මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න මහතා ද, හේතුඵලවාදී සංගමය වෙනුවෙන් මහාචාර්ය කාලෝ ෆොන්සේකා  මහතා ද අපි තෝරා ගතිමු.**

මෙම විද්වතුන් හමුවීමේ අවසර ලබා ගැනීමත්, වේලාව වෙන් කර ගැනීමේ කටයුතුත් මා වෙත පැවරිණි. විද්වතුන් නාඩි වාක්‍ය පිළිබඳ පළ කළ අදහස් හා මතයන් **''ඉසිවරුන් දුටු බව ගමන (2)''**නමින් දෙවනුව පළ කිරීමට අපේක්ෂිත ග්‍රන්ථයෙන් ඔබට කියවීමේ අවස්ථාව හිමිවෙනු ඇත.

මේ අනුව පළමු පියවර වශයෙන් නාඩි වාක්‍ය කියවන පිරිස හා ඔවුන් නාඩි වාක්‍ය කියවන විවිධ අවස්ථාවන් අපි රූපගත කළෙමු. ඉන්පසු ඔවුන් සමග සම්මුඛ සාකච්ඡාවන් සිංහල හා ඉංග්‍රීසි බසින් රූපගත කළෙමු. පරිවර්තකයා ලෙස මාධ්‍යවේදී අරුල්රාජා මහතා ද, ප්‍රවීණ මාධ්‍යවේදී සුගත් ලයනල් ජයසිංහ මහතා ද මෙකී රූපගත කිරීම්වලට සම්බන්ධ වූහ.

ඒ ඇසුරෙන් **''ඉසිවරුන් දුටු බව ගමන''** නමින් විනාඩි 30 කෙටි වාර්තා චිත්‍රපටයක් අපි නිපදවීමු.

අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් හමුවීමට යාම අති විශේෂ සිදුවීමක් වශයෙන් දැක්වීම මැනවැයි සිතේ. ඒ පිළිබඳ වූ සියලු සිදුවීම් ඉදිරි පරිච්ඡේදවලදී ඔබට කියවීමට හැකි වෙයි. **''ඉසිවරුන් දුටු මගේ බව ගමන''**නම් වූ මෙම කෘතිය අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගෙ ාඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් සමග මා විවිධ අවස්ථාවල බලන්ගොඩදී හා බත්තරමුල්ලේ වික්‍රමසිංහපුර චිත්තවිවේකාශ්‍රමයේදී පටිගත කළ හා උන්වහන්සේ විවිධ අවස්ථාවලදී පෞද්ගලිකව හමුවීමෙන් පටිගත කළ සාකච්ඡා සහ පටිගත කළ නොහැකි වූ අවස්ථාවලදී නාඩි වාක්‍ය පිළිබඳ මහජනතාවගෙන් ලැබුණු ගැටළු හා ඊට උන්වහන්සේ දුන් පිළිතුරු සටහන් ඇසුරෙන් මේ කෘතිය සම්පාදනය කළෙමි.

**''ඉසිවරුන් දුටු බව ගමන''** **හෙවත්** **''නාඩි''** නම් වූ කෙටි



Scanned by TapScanner

චිත්‍රපටය ද අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් සමග ස්වාධීන රූපවාහිනී සේවයේ ක්‍රීඩා විස්තර කථනය (ඉංග්‍රීසි)(1992 ) කළ අතුල රත්නායක මහතා සම්බන්ධ කර ගනිමින් කරන ලද ඉංග්‍රීසි සාකච්ඡාව පමණක් දැනට ආරක්ෂිතව පවතී.

නාහිමියන් සමග සාකච්ඡාවන් පටිගත කළ තවත් කැසට් පට 20ක් පමණ පුස් බැඳීම නිසා පාවිච්චියට ගත නොහැකි තත්ත්වයක පවතී. ඒවා ශුද්ධ කර ගත හැකි නම් වටිනා ප්‍රකාශන ඒ කැසට් පටවල අන්තර්ගතව ඇති බව සඳහන් කරමි.

අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් අපවත් වූ අවස්ථාවේ උන්වහන්සේ පිළිබඳ පටිගත කළ කිසිදු වැඩ සටහනක් ජාතික රූපවාහිනී නාළිකාවල නොවිණි.

අප පටිගත කළ වැඩ සටහන් ඇතුළත් වීඩියෝ කැසට් පට 02ක් කිසියම් ජාතික නාළිකාවක නිෂ්පාදිකාවක විසින් ප්‍රභාත් මානවසිංහ මහතාගෙන් ඉල්ලා ගෙන ගොස් තිබුණි . ඒ කැසට් පටවල අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් විසින් කළ ඉතා වටිනා ප්‍රකාශවලින් යුතු බව පමණක් සිහිවන විට මා තුළ බලවත් වේදනාවක් ඇතිවෙයි.

ප්‍රභාත් මානවසිංහ මහතාගේ අභාවයෙන් පසු මෙම කැසට්පට දෙක සොයා ගැනීමට මම මහත් ආයාසයක් දැරුවෙමි. එහෙත් ඒ මහඟු වස්තු සොයා ගැනීමට මට නොහැකි විය.

මේ ග්‍රන්ථය ඔබ වෙතට පත්වන්නේ රූපවාහිනී වීඩියෝ පටිගත කිරීම් අතුරතුර මා ලබාගත් කෙටි සටහන් උපයෝගී කරගෙනය. ''නාඩි වාක්‍ය'' පිළිබඳව විවිධ අන්දමින් සහාය දුන් බොහෝ දෙනා මේ වනවිටත් මෙම භවයෙන් සමුගෙන

ඇති අතර ජීවතුන් අතර සිටින්නේ මා පමණය.

මේ තොරතුරු දත් මහාචාර්ය ලීනස් ද සිල්වා මහතා කියා සිටියේ ලෝකයට මේ පරම දැනුම් සම්භාරය ගෙන යාමේ කාර්යය මා වෙත පැවරී ඇති බවකි.

එය එසේ නම් මේ කෘතිය සියලු ලෝ සතුනට මම පුදමි. මා පමණක් දැන සිටි ඇතැම් කරුණු හා සිදුවීම් ලෝකයට හෙළි කරන ලෙස මා මිත්‍රයින් හා විද්වතුන් කළ ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් මෙම කෘතිය ඔබ අතට පත්වෙයි.

මෙවැනි කෘතියක් කිරීම සඳහා මා පෙළඹූ වූ මහාචාර්ය ලීනස් ද සිල්වා මහතා ද, බිරිඳ නන්දා,පුතු සපුමල්,ජටිල,සජිත් සහ දියණි උත්පලා, සංජීවා සහ මා මිත්‍ර ආරිය බණ්ඩාර සමරකෝන් යුවළද,හර්බට් වීරසිංහ යුවළද ,බුලත්සිංහල යුවළද,සිහිපත් වෙයි.

**මහ නා හිමියන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා නොයෙක් අයුරින් ආධාර උපකාර කළ අති පූජ්‍ය මැදබැද්දේ ගුණරතන ස්වාමීන් වහන්සේද ඡායාරූප ගැනීමට දායක වූ ලංකා බැංකුවේ හිටපු විධායක නිලධාරි විජේසේකර මහත්මා ද කාරුණාපූර්වකව සිහිපත් කරමි.**

මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීමේදී ඉත සිතින් සහාය වූ **ඉමාෂි ප්‍රකාශන ආයතනයේ අධිපති විමල් දිසානායක ශූරීන්ද,** කාර්ය මණ්ඩලයද මෙත් සිතින් සිහිපත් කරමි. මෙම කෘතිය පරිගණක ගත කොට නිම කිරීමට දායක වූ ඉනෝකා දිසානායක, තේජා අතපත්තු හා සුරේඛා නිල්මිණි දියණියන් ද මම සිහිපත් කරමි.

දිවංගත සියලුම සම්පත්දායකයින්ට මම නිවන් සුව පතමි!

බදුල්ලේ මෛත්‍රී රත්නායක (සංස්කාරක)

# විශේෂ සටහන

නාඩි වාක්‍ය පිළිබඳව අපි විටින් විට අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමියන් සමග සාකච්ඡා කළෙමු. මෙම සාකච්ඡාවන් සඳහා මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති) දිවංගත ප්‍රභාත් මානවසිංහ මහතා ද, දිවයින පුවත් පතේ ප්‍රවෘත්ති කර්තෘව සිටි දිවංගත දයාරත්න රණසිංහ මහතා ද සහභාගි වූහ.

සිංහල බසින් රූපවාහිනි සාකච්ඡාව මෙහෙය වූයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා නිවේදකව සිටි සුගත් ලයනල් ජයසිංහ මහතාය. ඉංග්‍රීසි බසින් සාකච්ඡාව මෙහෙයවූයේ එවකට ස්වාධීන රූපවාහිනි සේවයේ ක්‍රීඩා වාර්තාකරු ලෙස සේවය කළ අතුල රත්නායක මහතා ය.

ඇතැම් අවශ්‍ය කරුණු සහ ගැටලු සහිත තැන් පිළිබඳ විමසන ලද්දේ ම විසිනි. එකී සාකච්ඡා වෙන් වෙන් වශයෙන් දැක්වීමෙන් පාඨක ඔබ තුළ ඇතිවිය හැකි ව්‍යාකූල තත්ත්වයන් මඟ හැරීම සඳහා අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නා හිමියන්ගෙන් අප අසන ලද සියලු ප්‍රශ්න සහ උන්වහන්සේ දුන් පිළිතුරු සරලව පාඨක ඔබගේ පහසුව සඳහා මෙසේ ප්‍රශ්න සහ පිළිතුරු වශයෙන් කැටි කොට දක්වන ලද බව කරුණාවෙන් සලකන්න.

ඇතැම් අවස්ථාවල මවිසින් පෞද්ගලිකව විමසන ලද ප්‍රශ්න සහ ඊට මහ නා හිමියන් දුන් පිළිතුරුද වෙන වෙනම දක්වන ලද බව කරුණාවෙන් සලකන්න.


මෙම විෂය පිළිබද විශේෂ සිදුවීම් සහ අත්දැකීම් රැසක් ද ඇතුළත් වන බව කරුණාපූර්වකව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ග්‍රන්ථය පළ කිරීමේහිලා මගේ අපේක්ෂාව වූයේ පොදු ජනතාව **මෙම ඉන්දියානු නාඩි වාක්‍ය ජ්‍යෝතිෂ්‍යය ක්‍රමය කියවීමට යොමු කරවීම හෝ පෙළඹවීම නොවේ.**

මෙවන් **විශේෂ විශ්මිත ශාස්ත්‍ර ක්‍රමයක්** අප්‍රකටව අවුරුදු දහස් ගණනක් තුළ නොකඩවා, නොනැසී, පැවතීම පිළිබඳව **පාඨකයින් දැනුවත් කරවීමේ අරමුණින් බව සඳහන් කරනු කැමැත්තෙමි.**

බදුල්ලේ මෛත්‍රී රත්නායක (සංස්කාරක)

## පූජා වේවා !



අපවත් වී වදාල

අභිධජ මහා රට්ඨ ගුරු

අග්ග මහා පණ්ඩිත

අමරපුර නිකායේ මහා නායක

අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය

මහ නාහිමියන් ගේ ශ්‍රී නාමයට

පුජා කරමි

පුජාම වේවා!

Scanned by TapScanner

මීන් වසර **5000 - 6000**කට පෙර සිටි
මහා අභිඥාලාභී ඍෂිවරුන් ද
මහ නාහිමියන් අනාගතයේ දී
සම්මා සම්බුද්ධත්වයට පත්වන බව ප්‍රකාශ කර ඇත.



Scanned by TapScanner

**අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් වහන්සේගෙන් විමසන ලද ප්‍රශ්න සහ උන්වහන්සේ විසින් දෙන ලද පිළිතුරු....**

**ප්‍රශ්නය :**

අවසර ස්වාමීනි, සමාව අයැද සිටිනවා අප ඔබ වහන්සේගෙන් දීර්ඝ වශයෙන් දැන ගැනීමට බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය පිළිබඳව හෝ වෙනත් සමයාන්තර ධර්මයන්, දර්ශනයන් හෝ පිළිබඳව නොවෙයි.

ස්වාමීනි, ඔබ වහන්සේ විසින් විටින් විට පොත්පත් සඟරා සහ වෙනත් මාධ්‍යයන් ඔස්සේ ප්‍රකාශ කරන ලද විශේෂ විෂයක් පිළිබඳවයි.ඒ **''නාඩි වාක්‍ය''** ගැනයි.

ස්වාමීනි, මොනවද මේ ''නාඩි වාක්‍ය'' කියන්නේ. පළමු කොට ඔබ වහන්සේගෙන් නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා මේ **''නාඩි වාක්‍ය''** කියන වචනය පිළිබඳ අර්ථ දැක්වීමක් කරන ලෙසට ස්වාමීනි.

**නාහිමි:**

හොඳයි.. **නාඩි** කියන වචනය අපේ රටේ බොහෝ දෙනෙක් බොහෝ කාලයක ඉඳලා අහල පුරුදු දන්න වචනයක්.

''නාඩි'' කියන වචනය ඇහෙන කොට මුන්නැහේලට වුනත් සිහියට එන්නේ අපේ සිංහල වෙද මහත්තයෙක් නැත්නම් දොස්තර මහත්තයෙක්, අපේ අත අල්ල ගෙන ඇස් දෙක පියා ගෙන නිහඬව අපේ හෘද වස්තුවේ ශබ්දයට කන්දෙන අවස්ථාවක්. ''නාඩි'' කියන වචනයට තවත් අර්ථ තියනවා.



Scanned by TapScanner

ඒත් මෙතන ''නාඩි'' කියන වචනය නැත්නම් ''නාඩි වාක්‍ය''ය කියන වචනයට විශේෂ තේරුමක් තියනවා. මම මේ පිළිබඳ නාඩි වාක්‍ය කියැවීම තුළින්ම විමසලා බැලුවා.

**එහි සඳහන් වන්නේ ''නාඩි'' කියලා කියන්නේ ඍෂිවරයා හමුවීමට වේලාව පැමිණි තැනැත්තා යන්නයි.**

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමීනි, අවසරයි ඒ කරුණ තවදුරටත් පැහැදිලි කළොත්..?

**නාහිමි:**

හොඳයි මම පැහැදිලි කරන්නම්. මං කීවා මුන්නැහේට නාඩි වාක්‍ය කියන්නේ ඍෂිවරයා හමුවීමට වේලාව පැමිණි තැනැත්තා කියලා. කොහොමද කෙනෙක් ඒ ගැන දැන ගන්නේ. මේක සුවිශේෂි අවස්ථාවක්.

නාඩි වාක්‍ය ග්‍රන්ථවල කියලා තියෙනවා කිසියම් කෙනෙකුට මේ නාඩි වාක්‍ය ගැන විස්තර පොත් පත් මාර්ග යෙන් හෝ වෙනත් ඕනෑම ආරංචි මාර්ගයකින් දැන ගන්නට ලැබුණොත් ඒ ආශ්‍රයෙන් ,

**ඒ තැනැත්තාට හිතුණොත්''මං මේ ගැන හොයලා බලන්න ඕනෑ. විස්තර දැන ගන්න ඕනෑ'' කියලා. ඒ කියන්නේ ඒ තැනැත්තා ඍෂිවරයා හමුවීමට වේලාව පැමිණි තැනැත්තායි.**

ඔහුගේ නාඩි වාක්‍යය ලියැවිලා තියෙනවා. **ඒ තැනැත්තාට නාඩි වාක්‍යය දැන ගැනීමේ වාසනාව හිමිවෙලා තියෙනවා. වාසනාව උදාවෙලා තියෙනවා.**

කිසියම් පුද්ගලයෙක් නාඩි වාක්‍යය ගැන විස්තර දැන ගන්නට ලැබිලා ඒ තැනැත්තා හිතුවොත් **''මේවා බොරු.**

**මේවා ගැන හොයලා බලලා ඇති වැඩේ මොකක්ද'' කියලා** ඒ කියන්නේ ඒ තැනැත්තාගේ නාඩි වාක්‍ය ලියැවිලා නැහැ.

**ඒ තැනැත්තාට තමන් ගැන, තමන්ගේ අතීතය ගැන, වර්තමානය සහ අනාගතය, අනාගතයේ ඉදිරි භව ගමන සකස් කර ගත යුතු ක්‍රමය ගැන දැන ගැනීමේ වාසනාව අහිමි තැනැත්තෙක්.**

## ප්‍රශ්නය :

ස්වාමීනි. ඔබ වහන්සේ ප්‍රකාශ කළා මේ නාඩි වාක්‍ය කියලා කියන්නේ ඍෂිවරයා හමුවීමට වේලාව පැමිණි තැනැත්තා කියලා. කවුද නායක හාමුදුරුවනේ මේ ඍෂිවරු කියන්නේ? කොහෙද මේ අය ඉන්නේ.? මොකක්ද මේ අයගේ විශේෂත්වය හාමුදුරුවනේ?

## නාහිමි :

බොහොම හොඳයි. මං තේරුම් කරලා දෙන්නම්. ඍෂිවරු කියන්නේ විශේෂ සත්ව කොට්ඨාශයක් නෙවෙයි. සමහරු හිතාගෙන ඉන්නේ ඍෂිවරු කියන්නේ කුරුල්ලන් වගේ අහසේ එහා මෙහා යන විශේෂ අවයව තියෙන පිරිසක් කියලා. ඍෂිවරු කියන්නෙත් අපි වගේම මව්කුසකින් බිහිවෙලා පොළවේ පය ගහලා ජීවත් වුණු, ජීවත් වෙන පිරිසක්.මවගෙන් කිරි උරා බීලා හැදුනු වැඩුනු මිනිසුන් පිරිසක්. සාමාන්‍ය මිනිසුන් වගේ නෙවෙයි,

ඒ තැනැත්තන්ගේ ඇවතුම් පැවතුම් වෙනස්. මේ ඇත්තන් බොහෝ වේලාවට මිනිස් වාසයෙන් ඈත් වෙලා, **ඈත හිමාලයේ වන අරණයන්හී සඳුන් තුරු සෙවනේ තනිකඩව ඉඳ භාවනානුයෝගීව ධ්‍යාන වඩන අයයි.** මේ අය බොහෝ කාලයක් භාවනානුයෝගීව දැහැන් ගතව ඉන්න කොට ඒ ඇත්තන් අනුගමනය කරන භාවනා ක්‍රමය අනුව

විවිධ ශක්තීන් ඒ ඇත්තන්ට ලැබෙනවා.

මම කලක් ඉන්දියාවේ හිමාලය කිට්ටුව තියෙන ඍෂිකේසි කියන ආශ්‍රමයට වෙලා ඉන්දියානු භාවනා ක්‍රමය පුරුදු පුහුණු වුණා. ඒ අවස්ථාවේ මටත් විටින් විට ඍෂිවරයින් හමුවුණා.

නගරයේ ඉන්න පිරිස වගේ නෙවෙයි ඒ ඇත්තෝ. දැලි රැවුල් කොණ්ඩ වැඩුණු හැඩපලු ගෙතුනු ඇත්තන්. දැක්ක හැටියේම හිතෙනවා මේ ඇත්තන් නං යෝගියෝ කියලා.

ඔවුන් දියුණු කරලා තියන ධ්‍යාන බලයෙන් හිමාල අඩවියේ තිබෙන දැඩි ශීතලට මුහුණ දෙමින් ධ්‍යාන ගතවීමේ ශක්තිය, හැකියාව ඔවුන්ට තියෙනවා.නාඩි වාක්‍ය ප්‍රකාශයට පත් කළ ඍෂිවරුන් මං විශ්වාස කරනවා බොහෝ දෙනෙක් උතුරු ඉන්දියාවේ ජීවත් වෙලා, වනගත සඳුන් රුක් සෙවනේ ආශ්‍රමවල ගල් තලා මත ඉඳගෙන ධ්‍යාන බලයෙන් මේ නාඩි වාක්‍ය ප්‍රකාශ කරන්න ඇතැයි කියලා.

මේ ධ්‍යාන බලයෙන් සිත දියුණු කල මේ ඍෂිවරුන්ට ශක්තිය තිබුණා මං හිතන්නේ **අවුරුදු පනස් දහසකට වැඩි අතීතයක්, වර්තමානයත්, අනාගතයත් තමාගේ ධ්‍යාන බලයෙන් දකින්න. ලෝකයේ සිදුවන දේ ඒ මොහොතේදීම දකින්නට.** තවත් වසර පනස් දහසකට අධික අනාගතයක් තම ඍෂි ඥානයෙන් දකින්නට ශක්තිය තිබුණා.

මේ ශක්තිය තමන් ප්‍රගුණ කළ ධ්‍යාන ක්‍රමය අනුව, ශක්තිය අනුව, වෙනස් වෙනස් අන්දමට අතීතය, වර්තමානය, අනාගතය දැකීමේ ශක්තිය තිබුණා.

**මේ ඍෂිවරු තමන්ගේ අභිඥා බලයෙන් මේ ලෝකේ බිහිවෙන මිනිසුන් ගැන බලලා, ඒවා ශ්ලෝක විදිහට කියවා තිබෙනවා.**

**ප්‍රශ්නය:**

ස්වාමීනි, නාඩි වාක්‍යය ප්‍රකාශ කළ ඍෂිවරුන් ගැන අපි දැන ගන්න කැමතියි.

**නාහිමි :**

මං කියන්නම්, මීට අවුරුදු පන් දහසකට, හය දහසකට පෙර එනම් කලියුගය ආරම්භයට පෙර ඉන්දියාවේ ජීවත් වුණා ඍෂිවරුන් පිරිසක්. සමහර විට දෙතුන් සියක් විතර වෙන්න ඇති. මේ ඇත්තෝ යෝග භාවනා බලයෙන් සිත දියුණු කරපු ඇත්තෝ.

මං කලින් කීවා වගේ ඒ ඇත්තන්ට හැකියාව තිබුනා අවුරුදු පනස් දහසක් අතීතය දකින්න, ඒ මොහොතේ ලෝකයේ සිදුවන දේ දකින්න.ඉදිරියේ අවුරුදු පනස් දහසක් අනාගතය දකින්න. ඒ අය ලෝකයේ විශේෂ මිනිසුන් ගැන තම අභිඥා බලයෙන් බලලා, ඒ අය ගැන විස්තර ශ්ලෝක විදිහට සකස් කරලා තම ගෝලයන්ට කට පාඩම් කෙරෙව්වා. ඉගැන්නුවා.

**සමහර ඍෂිවරු තමන්ගේ භෞතික ශරීරය අත් හැරලා මනෝකායෙන් ජීවත් වෙලා මෙම විස්තර තම ගෝලයන්ට ඉගැන්නුවා.**

මං තවත් විශේෂ කාරණයක් කියන්නම්. මේ විශ්වයේ පුදුම බලවේග ශක්තීන් තියනවා. ඒවා අපට පෙනෙන්නේ නැහැ. අපි දකින්නෙත් නැහැ. එම නිසා බොහෝ දෙනා විශ්වාස කරන්නෙත් නැහැ. උදාහරණයක් විදිහට කාකභුජන්දර නාඩි වාක්‍ය ක්‍රමය ගැන මම පැහැදිලි කරන්නම්.

කාකභුජන්දර කියලා මහා බලවත් සිද්ධ යෝගියෙක් හිටියා.ඒ මීට අවුරුදු පන් දහසකට ඉස්සර. ඒ කාකයර්



Scanned by TapScanner

කියන සිද්ධ යෝගියා තමයි කාකභුජන්දර නාඩි වාක්‍ය ඉගැන්නුවේ.මේ සිද්ධ යෝගියා ඊට අවුරුදු දෙදහසකට පසුව නැවත මේ ලෝකයට බිහිවෙලා තමන් මීට පෙර ප්‍රකාශ කළ කාකයර් නාඩි වාක්‍යයේ තිබූ ඇතැම් දෑ නැවත සංශෝධනය කරලා ඇතැම් අනවශ්‍ය දේවල් ඉවත් කරලා තියනවා.

**මේ කට වචනයෙන් කියපු දේවල නෙවෙයි.ඒ සිද්ධිය එකී නාඩි වාක්‍යයේම දක්වලා තියනවා.**

තවත් කාරණායක් මං පැහැදිලි කරන්නම්. පරම විඥාකදානාර්ථවාදින්ගේ මතයක් තියෙනවා ලෝකය පාලනය කරන මාස්ටර්වරුන් පිරිසක් ඉන්නවා කියලා. ඒ අය විටින් විට මේ මනුස්ස ලෝකයේ පහළ වෙලා ලෝකය යහ මඟට ගන්න කටයුතු කරනවා.

මේ එක් මාස්ටර් කෙනෙක් මට මතක් වෙනවා. **ඒ තමයි මාස්ටර් ''කුටුම්''.** මේ ඇත්තා අවුරුදු දහස් ගණනක් වයසක ඇත්තෙක්. මාස්ටර් කුටුම් තවමත් ඉන්නවා. ඒ කතාව ඇත්තක් කියලා අනගාරික ධර්මපාලතුමා මාත් එක්කල කීවා මට මතකයි. මේ ගැන මටත් පෞද්ගලික අත්දැකීමක් තියනවා.

දවසක් මං ආනන්ද කොලීජියේ ඉන්න කාලේ භවස භාවනා යෝගීව ඉන්න කොට, මට මාස්ටර් කුටුම් පෙනුනා. ඒ ඇත්තා දැක්ක හැටියේ මට හිතුණා මේ මාස්ටර් කුටුම් කියලා. මං එතුමා ගැන මොකුත්ම දැනගෙන හිටියේ නැහැ. මට එතුමා දකින්න ඕනකමක් තිබුණොත් නැහැ. දැක්ක හැටියෙම මට දැනුනා මේ ඉන්නේ මාස්ටර් කුටුම් තමයි කියලා.

ඒ අනුව මාත් පිළිගන්නවා විශ්වයේ මාස්ටර්වරුන් පිරිසක් ඉන්නවා කියලා. **''රක්කොක්සි මොරින් ජටාලකුල''**

නමින් හැඳින්වෙන සෘෂින් වහන්සේලා ලෝකාර්ථය සලසමින් තවමත් මාස්ටර්වරුන් විදිහට විශ්ව බලවේග වශයෙන් ඉන්නවා. තවත් අතිරේක කාරණයක් මම කියන්නම්.

දකුණු ඉන්දියාවේ පලනි කියන නගරයේ ස්කන්ධ කුමාර නමින් දේවාලයක් තියනවා කතරගම දෙවියන්ට කැප කරපු. මේ දේවාලයේ ආවතේව කරමින් සිටින්නේ මීට අවුරුදු පන්දහසකට, හය දහසකට පෙර සිටි (භෝග හෙවත් පෝගර්) නම් මහා සෘෂිවරයායි. මේ භවයෙන් ඉකුත් වූ පසු (මැරුණු පසු) එම සෘෂිවරයා මෙම ස්කන්ධ කුමාර දේවාලයේ ආව තේව කටයුතුවල නිරතව සිටි බව සඳහන් වෙනවා.

නාඩි වාක්‍ය ගැන මුන්නැහේ අහපු ප්‍රශ්නයට අතිරේකව මේ කරුණු ටික මං කීවේ සෘෂිවරුන් මේ ලෝකයෙන් බැහැර වුනත් ඒ ඇත්තන්ගේ භාවනානුයෝගී බලය, ශක්තිය විශ්වයේ බලවේග වශයෙන් රැඳී සිටිමින් තවදුරටත් මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි දයානුකම්පාවෙන් උදව් උපකාර කරමින් සිටිනවා.

කලි යුග ආරම්භයට පෙර සෘෂිවරුන් 18 දෙනෙක් මේ අන්දමට නාඩි වාක්‍ය ප්‍රකාශයට පත් කරලා විශ්ව බලවේග වශයෙන් ඉන්නවා.

**ප්‍රශ්නය:**

පින්වත් ස්වාමීනි. මුලින්ම නාඩි වාක්‍ය ප්‍රකාශ කරල තියෙන්නේ මොන භාෂාවෙන්ද? ලේඛන ගතවුණේ කොහොමද? කොයි කාලෙද කියලා නමස්කාර පූර්වකව ඔබ වහන්සේගෙන් දැන ගන්න පුළුවන්ද ස්වාමීනි.

## නාඩිම්:

මීට අවුරුදු පන් දහසකට හය දහසකට පෙර ජීවත් වූ මහා බලසම්පන්න සිද්ධි යෝගීන් පිරිසක් විසින් තමයි මෙම නාඩි වාක්‍ය ප්‍රකාශයට පත් කරළා තියෙන්නෙ ශ්ලෝක විදිහට.

**මේ ශ්ලෝක ගෝලයින් කට පාඩමින් පවත්වාගෙන ඇවිල්ලා තමයි ලේඛන ගත වුණේ.**

මට දැන ගන්න ලැබුණු විදිහට, මේ නාඩි වාක්‍ය ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ ඉන්දියානු ආදි වෛදික භාෂා වලින්. ඊට පස්සේ මේ ප්‍රකාශන සංස්කෘත භාෂාවලට පරිවර්තනය වෙලා තියනවා. කාලය පැහැදිලි නැහැ.

දැන් ඉන්දියාව පුරා විවිධ භාෂා වලින් ලියැවුණු නාඩි වාක්‍ය තියෙනවා. දෙමළ, තෙලිඟු, සංස්කෘත, මලයාලම් ආදී භාෂාවලින් ලියැවුණු නාඩි වාක්‍ය ගැන මට අහන්න ලැබුණා. ''පෝකර් 7000'' නාඩි රචනා කරලා තියෙන්නේ දෙමළ භාෂාවෙන්. **මදුරාසිය, කුසිනාරානුවර, ලක්නව්, ත්‍රිවට්ටම්, බරණැස** ආදී ප්‍රදේශවල නාඩි වාක්‍ය කියවන ස්ථානවලත්, පුස්තකාලවලත් මෙම නාඩි වාක්‍ය ඇතුළත් ග්‍රන්ථ තියෙනවා.

**මෙම නාඩි ක්‍රමයේ ඇති විශේෂත්වය තමයි එහි ජෝතිෂ්‍යය කරුණු, යන්ත්‍ර මන්ත්‍ර, ගුප්ත විද්‍යා ආදී බොහෝ දෑ ඇතුළත්. ඒත් ඔබට ඒවා කියවන්න බැහැ.**

නාඩි වාක්‍ය කියවීම එක් එක් ගුරු කුලයට අයත් ගුරු මුෂ්ටි වශයෙන් තියෙන්නේ. ගුරු මුෂ්ටිය එම පරපුරෙන් පරපුරට ගෙන යනවා. පිට අයට මේ කියවීමේ කලාව ඉගෙන ගන්න අවස්ථාවක් නැහැ.



Scanned by TapScanner

**ප්‍රශ්නය :**

නාඩි වාක්‍ය ලේඛණ ගත වූයේ කවදාද, කොහොමද කියන ප්‍රශ්නයට පිළිතුරු දැනගන්න කැමතියි ස්වාමීනි.

**නා හිමි:**

ඒක සිද්ධ වුණේ මෙහෙමයි. මීට අවුරුදු 2000කට ඉස්සර ඉන්දියාවේ **තංජෝර් නමින් මහ රජ කෙනෙක්** හිටියා. මේ රජතුමා මේ ශාස්ත්‍රයේ තියෙන වටිනාකම තේරුම් අරගෙන ඉන්දියාවේ සෑම පළාතකම හිටිය වියත් බ්‍රාහ්මණ පඬිවරු තමන්ගේ මාළිගාවට කැඳවලා අවශ්‍ය පහසුකම් දීලා, නවත්වා ගෙන නාඩි වාක්‍ය ලේඛණ ගත කරලා තියෙනවා.ඒවා ඒ අවස්ථාවේදීම වෙනත් භාෂාවලට පරිවර්තනය කරලත් තියෙනවා. එහෙම තමයි නාඩි වාක්‍ය තල් පත්වල ලියැවුණේ.

තංජෝර් මහ රජතුමා තමන්ගේ මාළිගය අසළම පුස්තකාලයක් හදලා එම නාඩි වාක්‍ය ඇතුළත් තල්පත් තැන්පත් කළා. ආරක්ෂා කළා.දෙමළ, මලයාලම්, තෙලිඟු ආදී භාෂාවලට පරිවර්තනය වුණේ මෙම කාලයේදී කියල මම හිතනවා.

කාලයක් යන විට එම රජ පෙළපතේ එක් තරුණ කුමාරයෙක් බටහිර අධ්‍යාපනය ලබා සියරට පැමිණ මෙම ඉපැරණි පත පොතෙහි වටිනාකම අගය තේරුම් නොගෙන මෙම සියලුම පොත් පුස්තකාලය වටා ඉදිකර තිබූ, කිඹුලන් විසින් ආරක්ෂා කරනු ලැබූ දිය අගලට විසි කරලා දාලා තියෙනවා.

ඉන්පසු එම රජතුමා පුස්තකාල ගොඩනැගිල්ල තමන්ගේ අන්තඃපුරය සඳහා භාවිත කළ බව කියැවෙනවා.



Scanned by TapScanner

මේ සිද්ධිය දැනගත් බ්‍රාහ්මණ පඬිවරු තමන්ගේ ජීවිත ගැනවත් නොසලකා දියට පැන මෙම තල්පත් මිටි විශාල කොටසක් බේරා ගෙන තිබෙනවා.

එක් එක් බ්‍රාහ්මණ පවුල් අයත් කරගත් තල්පත් මිටි තම උරුමය වශයෙන් රැකගෙන ආවා. ඉන්දියාව විදේශ බලවේග වලට යට වුණාට පස්සේ ඒ පාලකයෝ මෙම වටිනා තල්පත් තමන්ගේ මව් රටවලට අරගෙන ගියා.ත්‍රිවංද්‍රම් රාජකීය පුස්තකාලයේ රැකගෙන තිබූන නාඩි වාක්‍යය ඇතුලත් තල්පත් කෝටි ගණනක් එංගලන්තය, ඇමරිකාව, ප්‍රංශය ආදී රටවලට පැහැර ගෙන ගොස් තිබෙනවා. **මේ සිද්ධිය (CELESTIAL - INDIA) නම් පොතේ** සඳහන් වෙනවා.

**මේ නාඩි වාක්‍ය දෙමළ, කර්නාටක තෙළිඟු, සංස්කෘත ආදී භාෂාවලින් රචිත නාඩි ග්‍රන්ථයි.**

**ඔවුන් මේවා තමන්ගේ පුස්තකාලවල එක් රැස් කළත් මිනිස් වර්ගයාට ඉන් කවදාවත් එලක් සෙතක් වෙන්නේ නෑ.** හේතුව එම ලේඛන කියවිය හැකි කිසිවෙක් ඒ රටවල නැහැ.

**ඒ ලේඛන කියවීමට විශේෂ කේත ක්‍රමයක් තියනවා. ඒ ක්‍රමය දන්නේ ඒ ඒ බ්‍රාහ්මණ පවුල්වල අය විතරයි.** ඒ ශිල්පය දෙන්නෙත් ඒ ඒ පරම්පරාවල ශිල්පය හැදෑරීමට කුසලතා ඇති අයට පමණයි. මේ ශිල්පය ගුරු මුෂ්ටිය වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට රැක ගෙන යනවා.

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමිනී. ඔවුන් මෙම නාඩි තල්පත් කියවීම ඉගෙන ගත්තේ කොහොමද ස්වාමිනී.



Scanned by TapScanner

## නා හිමි :

ඉන්දියාව අන්තිමට පාලනය කළේ ඉංග්‍රීසීන්. ඒ කාලය වනවිටත් මෙම තල්පත් කියවන ක්‍රමය එකී බමුණන් දැනගෙන ඉඳලා නෑ. එක බ්‍රාහ්මණ පඬිවරයෙක් මෙම තල්පත් කියවන ක්‍රමය පිළිබඳව හෝඩුවාවක් ලැබිලා නාඩි වාක්‍ය කියවන යතුර, ක්‍රමය, තේරුම් ගෙන නාඩි වාක්‍ය කියවීම ආරම්භ කරල තියෙනවා.

මුල් නාඩි වාක්‍ය තුළින් එකී බ්‍රාහ්මණ පඬිවරයාට උපදෙස් ලැබිලා තියෙන්නේ විදේශිකයන් රටින් පිටවන තුරු නාඩි කියවීම නොකළයුතු බවට.

ඒ බ්‍රාහ්මණ පඬිවරුන් හරි නීතිගරුකයි. අවංකයි. මේ බ්‍රාහ්මණ පඬිවරුන් අද උනත් හඳුන්වන්නේ **"පණ්ඩිත" කියන ගෞරව පදය මුලට යොදලා.** නාඩි වාක්‍ය තුළින් දීලා තියෙන උපදෙස් කිසිම විටෙක ඒ ඇත්තෝ කවදාවත් කඩ කරන්නේ නෑ. උපදෙස්වලට ගරු කරනවා.

## ප්‍රශ්නය :

ස්වාමීනි, ඔබ වහන්සේ ප්‍රකාශ කළා තල්පත් කෝටි ගණනක් එංගලන්තය, ප්‍රංශය, ඇමරිකාව ආදී රටවලට ගෙන ගියා කියලා. සැබවින්ම මේවා එච්චරම වැදගත්ද? මේවායේ තියෙන්නේ මොනවද කියලා ඔබ වහන්සේට දළ අදහසක් කියන්න පුලුවන් ද ස්වාමීනි.

## නාහිමි:

හොඳයි මං කියන්නම්. මේ ගෙන ගිය නාඩි වාක්‍ය ග්‍රන්ථ කාටවත් කියවන්න ලැබුණේ නැති නිසා ඒවායේ අන්තර්ගතය ගැන කියන්න බැහැ.

ඒත් දැනට ඉතිරි වෙලා තියෙන නාඩි වාක්‍ය පොත්පත්

දිහා බැලුවහම ඒවායේ සඳහන් වෙලා තියෙන කරුණු පිළිබඳව පුදුම හිතෙනනවා.

**උදාහරණයක් වශයෙන් මුන්නැහේට අවශ්‍ය ඕනෑම කාරණයක් පිළිබඳව විස්තර විමසුවොත් ඊට පිළිතුරු මුන්නැහේට ලැබෙනවා. ඇතැම් අවස්ථාවල වර්තමානයේ ලියැවෙන හා අනාගතයේ ලියැවෙන පත පොත ගැනත් ඒවායේ කතෘවරුන් ගැනත් කියැවෙනවා.**

මේ කාරණයට අවශ්‍ය කරුණු අසවල් පොතේ අසවල් පිටුවේ තියෙනවා. වර්තමානයේ පළවන පතපොත ගැනත්, අනාගතයේ පළවන පත පොත ගැනත් කියැවෙනවා.

**මේවා කියල තියෙන්නේ මීට අවුරුදු 5000කට 6000කට ඉහත ජීවත් වුණු සෘෂිවරුන් විසින්.**

මට අහන්න ලැබුණු ආරංචියක් මට මතක් වුණා. මේකේ සත්‍ය අසත්‍යතාව ගැන මට හරියට කියන්න බැහැ. විස්තරය මෙහෙමයි.

මෙම නාඩි වාක්‍ය තල්පත් වලින් කොටසක් ඊශ්‍රායලයට ගෙනිහිල්ලා තියෙනවා. එක්තරා තරුණ ඉන්දියානු නාඩි කියවන්නෙක් ඊශ්‍රායලයේදී මේ නාඩි වාක්‍යවලින් කොටසක් කියවලා තේරුම් කරලා තියෙනවා.ඒ තල්පත්වල තිබුණු ශිල්ප ක්‍රම ඊශ්‍රායලය විසින් දැනගෙන මේ වනවිට අති නවීන ගුවන් යානා, යුධ උපකරණ නිපද වූ බව කියැවෙනවා. කෙටි කාලයක් රැඳී සිටි මේ තරුණ නාඩි කියවන්නා ඊශ්‍රායලයෙන් පිටව ගිය බවත් කියැවෙනවා.

ඒ ප්‍රවෘත්තිය ඇත්ත නම් ඊශ්‍රායලය සතුව තිබූ ඉතා කුඩා නාඩි වාක්‍ය පොත් ප්‍රමාණයෙන් මේ පුංචි රට මේ තරම් බලවත් තත්ත්වයකට පත්වුණා. අද වුණත් අරාබිකරයේ මැද පිහිටි මේ කුඩා පුංචි රට බලවත්ව ඉන්නේ ඒ විස්තර දැනගෙන සිටි නිසා වෙන්නට පුළුවන්.

**ඒ අනුව මට හිතෙනවා දැනට ප්‍රංශය, ඇමරිකාව, එංගලන්තය යන රටවල පුස්තකාලවල ඇති නොකියවූ නාඩි වාක්‍ය තල්පත්වල කොච්චර නම් ඥාණ සම්භාරයක්, දැනුම් සම්භාරයක් ගැබ්වෙලා ඇත්දැයි හිතා ගන්නත් අමාරුයි. සමහර විට අන්තර් ග්‍රහ ලෝක තරණය , විශ්ව ගවේෂණය සඳහා සුදුසු උපදෙස් තාක්ෂණය, යන්ත්‍ර සූත්‍ර සකස් කර ගන්නා ශිල්පය මෙම නාඩි වාක්‍ය තුළ ගැබ් වෙලා ඇති කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා.**

**ප්‍රශ්නය :**

පිංවත් ස්වාමීනි, මට වෙනත් විදිහක ප්‍රශ්නයක් ඔබ වහන්සේගෙන් විමසන්න අවශ්‍යයි. ලංකාවේ අපට මුලින්ම **නාඩි වාක්‍ය ක්‍රමය ගැන දැන ගන්නට ලැබුණේ මහාලිංගම් නමැති පඬිවරයාගෙන්. මහාලිංගම් මහත්තයා ලංකාවේ** සිටි සෑම ජන නායකයෙකුටම, ප්‍රභූන් රැසකටම තමන්ගේ භාරයේ තිබූ **''සප්ත ඍෂි''** නාඩි වාක්‍ය ක්‍රමය තුළින් අනාවැකි කියලා තියෙනවා.

ඊට පස්සේ අපට නාඩි වාක්‍ය ගැන අත්දැකීම් ලැබුණේ දැනට ලංකාවේ පදිංචි වෙලා නාඩි වාක්‍ය කියන **''අගස්ති කෞෂික නාඩි වාක්‍ය''** ක්‍රමය ගැන.

කෙටි කලක් ලංකාවේ රැඳී සිටි නාඩි කියවන්නෙක් සූර්ය නාඩි ක්‍රමය හඳුන්වා දුන්නා. **මෙම නාඩි වාක්‍ය ක්‍රමයේ ඇති විශේෂත්වය වන්නේ ස්වාමිනී මෙම නාඩි වාක්‍ය ලියා** තිබුණේ තඹ පත්වලයි.

මේ හැරුණු විට ඔබ වහන්සේ දන්නා වෙනත් නාඩි ක්‍රම ගැන කරුණාවෙන් අප වෙත පැහැදිලි කර දෙන ලෙස මම ගෞරව නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා.



Scanned by TapScanner

**නාහිමි:**

හොඳයි, මේ ගැන මට දීර්ඝ විස්තරයක් කියන්න පුළුවන්. මං හුඟක් කෙටි කරලා විස්තර කියන්නම්. **නාඩි වාක්‍ය කියන්නේ මහා පුළුල් පරාසයක පැතිරුණ ශාස්ත්‍ර ක්‍රමයක්.**

හරියට සප්ත මහා සාගරය වගේ. අපි දන්නේ, අපට දැන ගන්නට පුළුවන් වෙන්නේ ඉන් එක් බිංදුවක් විතර ප්‍රමාණයක්. මුන්නැහේ අහලා තියෙන **ජ්‍යෝතිෂ්‍ය, ආයුර්වේද, හස්ත රේඛා, ශබ්ද විද්‍යා කොයිතරම් ගැඹුරු පුළුල් පරාසයක්** දක්වා විහිදෙන ශාස්ත්‍රයන් ද කියලා අමුතුවෙන්ම කියන්න ඕනේ නැහැ. මේ ගැන මං පස්සේ පැහැදිලි කරන්නම්.

**නාඩි වාක්‍ය කියන්නේ මේ ශාස්ත්‍රයේ අග්‍රඵලය. මූල බීජය. මේ හැම දෙයක්ම ධ්‍යානලාභී ඍෂිවරුන් විසින් තමන්ගේ ධ්‍යාන සුවයෙන් ඉන්නා වේලාවේ දැනගත් විස්තරයි.** එක් එක් ඍෂිවරයා විසින් භාෂිත නාඩි වාක්‍ය ඒ ඍෂිවරයා නමින් හැඳින්වෙනවා.

කාකභුජන්දර නමින් හැඳින් වූ නාඩි වාක්‍ය ප්‍රකාශ කර ඇත්තේ කාකයර් නම් ඍෂිවරයා විසින්. **මේ හැරුණු විට කෞමාර නාඩිය, බුද්ධ නාඩිය, සූර්යය සංහිතා නාඩිය, කුජ, ගුරු, ශුක්‍ර, ශනි, ශුකර්ම් පෙරිය, චන්ද්‍ර කලා නාඩිය,අගස්ති කෞෂික නාඩිය, සත්‍ය සංහිතා නාඩිය, අගස්ති කෞෂික නාඩිය, කමලමුණි නාඩිය, ශිව පාර්වතී නාඩිය, සප්ත ඍෂි නාඩිය, ශුක්‍ර සංහිතා නාඩිය ආදී වශයෙන් නාඩි ක්‍රම රාශියක් තියනවා. සමහර නාඩි ක්‍රම දීර්ඝ වශයෙනුත්, සමහර නාඩි ක්‍රම ශේෂ වශයෙනුත් පවතිනවා.**



Scanned by TapScanner

## ප්‍රශ්නය :

ස්වාමීනි, මේ නාඩි වාක්‍ය ලියැවිලා තියෙන්නේ සම්පූර්ණයෙන් ශ්ලෝක වශයෙන් ද නැත්නම් ප්‍රකාශන වශයෙන් ද ඔබ වහන්සේ දුටු විශේෂතා මොනවාද ස්වාමීනි,


## නාහිමි :

බොහෝ නාඩි වාක්‍ය ලියැවිලා තියෙන්නේ ශ්ලෝක වශයෙන් එක දිගටම කියැවෙන විදිහට. **ඒත් සමහර වාක්‍ය දෙබස් විදිහටත්, සාමූහික සාකච්ඡා වශයෙනුත් විස්තර කෙරෙන අවස්ථා මම දුටුවා.**

**උදාහරණයක් විදිහට කිසියම් පුද්ගලයෙකු උපන් වෙලාවේ ග්‍රහයන් පිහිටලා තියෙන ක්‍රමය පිළිබඳව යම් පටලැවිලි පැහැදිලි නැති තත්ත්වයක් ඇති වුණොත් ඍෂිවරුන් දෙදෙනෙක්, නැත්නම් තුන් දෙනෙක්, ඍෂිවරුන් හත්දෙනෙක් සාකච්ඡා කළ නාඩි ක්‍රමයක් තියනවා.**

සප්ත ඍෂි කියන්නේ ඒ විදිහට හත් දෙනෙක් එකතු වෙලා ප්‍රකාශ කළ නාඩි වාක්‍ය ක්‍රමයයි.ශිව පාර්වතී නාඩි වාක්‍ය කියන්නේ ශිව සහ පාර්වතී යන දෙවිවරුන් දෙදෙනා එකතු වෙලා ප්‍රකාශ කළ නාඩි වාක්‍ය ක්‍රමයයි.

ශිව පාර්වතී දෙවිවරුන් දෙදෙනාගේ සංවාද සහිත නාඩි වාක්‍යයක් ක්‍රමයක් ද තියෙනවා. කර්දම භෘගු, ප්‍රහ්ලාද, බලි, ජනක කියන ඍෂිවරුන් පස්දෙනෙක් එකතු වෙලා පවත්වන ලද සාකච්ඡා ඇතුළත් නාඩි වාක්‍යය ක්‍රමයක් ද තියෙනවා.



මහ නා හිමියන්ගේ නාඩි පත්‍ර ආචාර්ය ජයශංකර් මහතා මෙම පොතේ කතුවරයාට පැහැදිලි කළ අවස්ථාව..



Scanned by TapScanner

මේ සංවාද මණ්ඩලයේ සභාපති ලෙස සූර්ය නම් දිව්‍ය පුත්‍රයෙක් කටයුතු කරලා තියෙනවා. එම නිසා එම නාඩි වාක්‍ය සූර්ය නාඩි නමින් හැඳින්වෙනවා. සූර්ය සංහිතා නාඩි වාක්‍යය චන්ද්‍ර කලා නාඩිය නමින් හැඳින්වෙන නාඩි ක්‍රමයක් ද තියෙනවා. සංස්කෘත බසින් ලියැවෙලා තියෙන්නේ.

මෙම නාඩි ක්‍රමය මහා බ්‍රාහ්මයා විසින් ප්‍රකාශිත බව එම නාඩි වාක්‍යවල ඇති ශ්ලෝකයක දැක්වෙනවා. සංවාද පිළිබඳ කියන කොට, බ්‍රහ්මයා, ඍෂිවරුන් අතර සංවාදත්, පාර්වතී ඍෂිවරුන් අතර සංවාදත් සහ ඍෂිවරුන්, ඍෂිවරුන් අතර ඇති වූ සංවාදත් දක්නට ලැබෙනවා. තවත් විශේෂ නාඩි ක්‍රමයක් තියෙනවා.

එය හැඳින්වෙන්නේ **අගස්ති කමලමුණි** වාක්‍ය කියන නමින් රේඛා ශාස්ත්‍රය මුල්කර ගෙන නිබන්ධනය වෙලා තියෙනවා.

මෙම නාඩි ක්‍රමයේ ඇති විශේෂත්වය තමයි අතේ රේඛා දෙස බලා ඊට අනුරූපව ඇති නාඩි ග්‍රන්ථ සොයා විස්තර කථනය කරනවා. ශ්‍රී ක්‍රිෂ්ණ දෙවියන් විසින් සහදේව ඍෂිවරයාට නාඩි වාක්‍ය ඉගැන්වූ බව එකී නාඩි ග්‍රන්ථවල සටහන් වෙලා තියෙනවා.

**කමලමුණි නම් වූ තවත් නාඩි වාක්‍ය ක්‍රමයක් තියෙනවා.**

**මෙම ක්‍රමයේ ඇති පුදුම සහගත බව නම් කෙනෙකුගේ දකුණු අතේ, මහපටඟිල්ලෙන් ලබා ගන්නා සටහන් විමර්ශනය කරලා ජීවියාගේ නම මව්පියන්ගේ, බිරිඳගේ නම, අනියම් බිරිඳක් ඉන්නවා නම් ඇගේ නම් ගම් ද ඇතුළත් පූර්ණ විස්තරයක් ද ඔහු හෝ ඇය ජීවත් වන පළාත ද කියැවෙනවා. මේ ආදි වශයෙන් නාඩි වාක්‍ය විධි සිය ගණනකට අධික සංඛ්‍යාවක් තියෙනවා.**




Scanned by TapScanner



මහා නා හිමියෝ සමාධිගතව සිටින මොහොතක ඡායාරූපයක්

Scanned by TapScanner





Scanned by TapScanner

**ප්‍රශ්නය :**

සෘෂිවරුන් කුමන කරුණු පාදක කරගෙන ද මෙම නාඩි වාක්‍ය ප්‍රකාශ කරලා තියෙන්නේ ස්වාමීනි,

**නාහිමි :**

හොඳයි, බුද්ධෝත්පාද කාලයට පෙර ඉඳලම එනම්, කලියුග කාලයේ ආරම්භයේ ඉඳලම ඉන්දියාවේ තිබුණා **මහා පුරුෂ ලක්ෂණ විද්‍යාව, නම් ශාස්ත්‍ර ක්‍රමයක් මහා භාරතයේ පුරාණයේ ඉඳලම පැවතිලා තියෙනවා.** සුද්ධාවාස නම් දෙවියන් විසින් බමුණු වෙසින් ඉඳලා මහා පුරුෂ ලක්ෂණ විද්‍යාව බුද්ධ මන්ත්‍ර විදිහට උගන්වලා තියෙනවා.මේවා වේද ග්‍රන්ථවලටත් ඇතුළත් වෙලා තියෙනවා.

**මේ පිළිබඳව දික්සඟිය අටුවාවේද සඳහන් වෙනවා.** බුදුන් වහන්සේගේ කාලයේ මේ ශාස්ත්‍රය බොහෝ බ්‍රාහ්මණ පඬිවරුන් දැන සිටි බව බෝසත් උපතේ දී මහා පුරුෂ ලක්ෂණ, දේහ ලක්ෂණ දිහා බලලා, මේ තැනැත්තා බුදු වන බවට කර ඇති ප්‍රකාශයෙන් පැහැදිලියි.

බුදුන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් යුක්ත උත්තමයෙක්. දෙතිස් මහා පුරුෂ ලක්ෂණ කියන්නේ මහා පුරුෂ ලක්ෂණ තිස් දෙකක් තිබුණ කියන එකයි.

මම බුදුන් වහන්සේ ගැන නාඩි වාක්‍ය තුළින් විමසලා බලපු වෙලාවේ එහි බුදුන් වහන්සේ ගැන කියැවුණේ **''මහා සෘෂි ගෞතම'' කියලා.**

මේ ගැන මං පස්සේ විස්තර කියන්නම්. නාඩි වාක්‍ය ලියැවෙලා තියෙන්නේ කෙනෙකුගේ මහා පුරුෂ ලක්ෂණ එකක් හෝ වැඩි ගණනක් තියනවා නම් විතරයි.

**ඒ අනුව ඔබට නාඩි වාක්‍ය කියවා ගැනීමේ වාසනාව**



Scanned by TapScanner

**ලැබුණා නම්, ඔබ තුළ මහා පුරුෂ ලක්ෂණ එකක් හෝ කිහිපයක්** තියෙන පිංවතෙක්.

මහා පුරුෂ ලක්ෂණ ශරීර අංග ඇතුළතින් පමණක් නෙවෙයි, මනසින්, ගති ලක්ෂණ ද ඇතුළත්. මෙත්තා, කරුණා, මුදිතා උපේක්ෂා ආදී ගුණයන්ද මහා පුරුෂ ලක්ෂණවලට ඇතුළත් වෙනවා. මේ මහා පුරුෂ ලක්ෂණ විද්‍යාව බුද්ධ පරිනිර්වාණයෙන් පසු අභාවයට ගිය බව හැඟෙනවා.

**බෝධි සත්වයන්ගේ පමණක් නෙවෙයි, බෝධි සත්වයාණන් වහන්සේගේ මව් දෙමව්පියන් ද මහා පුරුෂ ලක්ෂණවලින් යුක්ත අයයි. ඒ අයගේ ද අංග සම්පූර්ණ විස්තර නාඩි වාක්‍යවල ලියැවිලා තියෙනවා.**

**ප්‍රශ්නය :**

ස්වාමීනි, ඔබ වහන්සේ ප්‍රකාශ කළා ජ්‍යෝතිෂ්‍ය, ආයුර්වේදය මේ ලොවට දායාද කළේ මේ ඍෂිවරුන් වහන්සේලා කියලා. ඒ පිළිබඳව අපි දැන ගන්න කැමතියි ස්වාමීනි.

**නාහිමි :**

අද කාලයේ අපේ ජ්‍යෝතීර්ෂ්‍යවේදීන් නොයෙක් තාක්ෂණ උපකරණ පාවිච්චි කරලා තමයි ජීවිත විස්තර පැහැදිලි කරලා දෙන්නේ.

ඒත් මීට අවුරුදු 5000කට 6000කට පෙර මෙවැනි උපකරණ කිසිවක් තිබුණේ නැහැ. ඍෂින් වහන්සේලා මේ සියලු විස්තර ඔවුන්ගේ අධි මානසික බලයෙන් ඍෂි බලයෙන් තමයි විස්තර පුරෝකතනය කළේ.

**මෙම ඍෂීන් වහන්සේලාට ශක්තිය හැකියාව තිබුණා වෙනත් ඕනෑම වස්තුවකට තමන්ගේ මනෝකායෙන් ආරූඪ**

**වෙලා ඒ වස්තුවේ ඇති භෞතික ස්වභාවය විස්තර කරන්න, විග්‍රහ කරන්න.**

ඒ විදිහට ඍෂින් වහන්සේලා වෙනත් ග්‍රහලෝක හිරු, සඳු, බ්‍රහස්පති, සිකුරු ආදී ග්‍රහ වස්තූන්ට ආරූඪ වෙලා ඒ ග්‍රහ ලෝකවලින් පිටවන තරංග ප්‍රමාණය ඉන් මේ ලෝකයට පමණක් නෙවෙයි, ඒ ඒ ග්‍රහලෝක කෙරෙහි ඇතිවන බලපෑමද විස්තර කරලා තියෙනවා.

**සත්ව කොට්ඨාශවලට පමණක් නෙවෙයි, ගහකොළ, මල්, පළතුරු ආදීයටත්, ග්‍රහලෝක වලන් ඇතිවන බලපෑම** ගැනත් විස්තර කරලා තියෙනවා. ග්‍රහ වස්තූන්ගේ බලපෑම වගේම මේ ලෝකයේ තියෙන ගහකොළ පිළිබඳවත් ඍෂින් වහන්සේලා විස්තර කරලා තියෙනවා.

කිසියම් ගහකට, පැළෑටියකට උන්වහන්සේලා ආරූඪ වෙලා ඒ ගසේ පොත්තෙන්, අරටුවෙන්, මුල්වලින් මල්වලින් , පොතුවලින්, ගෙඩිවලින් කොළ වලින් මේ ආදී සියලු විස්තර ග්‍රහණය කරගෙන, උකහා ගෙන ඉන් ඇතිවන ශක්තිය පිළිබඳ අවබෝධයක් ලබාගෙන ඒ ආශ්‍රයෙන් විවිධ රෝගවලට ඖෂධ වර්ග නිපදවන ආකාරයත් තේරුම් කරලා දිලා තියෙනවා.

**අද පවතින ආයුර්වේද ඇතුළු සියලු වෛද්‍ය ක්‍රමවල නිර්මාතෘවරුන් වන්නේ මහා බල සම්පන්න ඍෂිවරුන්.** අද වගේ රසායනාගාර නොතිබුණ ඒ කාලයේ ඒ ඒ ගස්වල කොළ පොතු, නැටි, මුල් නියමිත මාත්‍රාවට සකස් කරලා, කියන විස්තර නාඩි ග්‍රන්ථවල සඳහන් වෙනවා. **''පෝකර් 7000'' නමින් හැඳින්වෙන නාඩි වාක්‍යයේ ජ්‍යෝතිෂ්‍ය පිළිබඳ කරුණු පමණක් නෙවෙයි, ඊට අදාළ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ද ගුප්ත කරුණු පිළිබඳව ද සඳහන් වනවා.**

නාඩි වාක්‍යවල ඇතුළත් ඖෂධ කාණ්ඩය තුළින්

මනුෂ්‍යයින්ට කලින් කලට හැදෙන විවිධ රෝගාබාධවලට අවශ්‍ය ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාර ක්‍රම කියැවෙනවා. හදවත් රෝග, දියවැඩියාව, ක්ෂයරෝගය, අර්ශස් ආදී විවිධ රෝගයන් සඳහා ගතයුතු ප්‍රතිකාර ගැන සඳහන් වනවා.

විශේෂයෙන් සඳහන් කළයුතු දෙයක් තමයි ඇස්වල ඇති වන කාච රෝගවලට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර එම පොත් වල සඳහන් වෙනවා.

**මේ නාඩි ග්‍රන්ථ පරිශීලනය කළොත් අපේ දේශීය වෛද්‍ය ක්‍රමය ඉතා ඉහළ තලයකට ගෙන එන්නට පුළුවන් වෙයි කියලා මට හිතෙනවා.**

### ප්‍රශ්නය:

අවසරයි ස්වාමිනී, නාඩි වාක්‍ය කියවපු ඇතැම් දෙනාට තියෙන ප්‍රශ්නයක් තමයි, ඇතැම් විට කියා ඇති දේ සිදුවෙන්නේ නැහැ. ඇතැම් විට ප්‍රමාද වී කියූ දේවල් සිදුවෙනවා. මේ විදිහට වැරදීම් සිදුවෙන්නේ කොහොමද ස්වාමීනි.

### නාහිමි:

ඔය වගේ සිද්ධි මීට පෙර කීපදෙනෙක්ම මගෙන් ඇහුවා. මේ ගැන මම නාඩි කියවීම් තුළින්ම විමසුවා. මීට ඉස්සර වෙලා මම කියපු විදිහට මීට අවුරුදු 5000කට 6000කට පෙර සිටි සෘෂින් වහන්සේලා තමයි මේ අනාගත වාක්‍ය ''නාඩි වාක්‍ය'' කියලා තියෙන්නේ.

මේ ඇත්තෝ තමන්ගේ ගෝලයන්ට මේ නාඩි වාක්‍ය ශ්ලෝක වශයෙන් කට පාඩම් කරවලා තමයි මෙම නාඩි වාක්‍ය පරම්පරාවෙන් පරම්පරාවට රැකගෙන ඇවිල්ලා තියෙන්නේ. කට පාඩමින් ගෙන එන කොට වැරදීම් සිදුවීමට තියෙන ඉඩකඩ වැඩියි.

කොටින්ම මුලින්ම කටපාඩම් කරපු කෙනා වැරදි වචනයක්, වැරදි වාක්‍යයක් පාඩම් කරගෙන තිබුණා නම් ඊළඟ කෙනා පාඩම් කරන්නේත් එම වැරදි වචනයයි.වැරදි වාක්‍යයයි ඔය විදිහට පරම්පරාවෙන් පරම්පරාවට එනකොට වැරදීම් වැඩි වෙනවා.

**ප්‍රශ්නය :**

ස්වාමීනි එතකොට ලේඛන ගත කරන කොටත් වැරදීම් සිද්ධ වෙනවද?

**නා හිමි:**

මං මීට පෙර කීවා වගේ මෙම නාඩි ශාස්ත්‍රය මුලින්ම ලේඛන ගත කරවලා තියෙන්නේ මීට අවුරුදු 2500 කට පමණ පෙර සිටි තංජෝර් රජතුමා විසින් කියල. මෙම ශාස්ත්‍රවල තියෙන වටිනාකම තේරුම් ගෙන රට පුරා නාඩි කියවමින් සිටි බ්‍රාහ්මණ වංශිකයින් තංජෝර් මාළිගාවට කැඳවලා මෙම නාඩි වාක්‍ය තල්පත්වල ලේඛන ගත කළා. විවිධ භාෂාවලින් මෙම නාඩි වාක්‍ය ලියැවිලා තියෙනවා.

මෙහෙම ලියන අවස්ථාවේත් වැරදීම් සිද්ධ වෙන්න පුළුවන්. මේවා ලියැවිලා තියෙන්නේ ඉතා සියුම් තිත් සහ ඉරිකෑලි විදිහට.

මේ පිළිබඳ මං පස්සේ විස්තර කියන්නම්. නැවත විවිධ භාෂාවලට පරිවර්තනය කරන කොටත් වැරදීම් සිදුවන්න පුළුවන්. අර්ථය වෙනස් වෙන්න පුළුවන්.

නාඩි වාක්‍ය කියවන අවස්ථාවේදීත් ඒවා තේරුම් කරලා දෙන තැනැත්තා අතිනුත් වැරදි සිද්ධ වෙන්න පුළුවන්. නැවතත් නාඩි වාක්‍ය විස්තර කොපි පොත්වලට, කැසට් පටවලට, ගන්න කොටත් වැරදි සිද්ධ වෙන්න පුළුවන්.

**ප්‍රශ්නය:**

එතකොට ස්වාමීනි, අපට ලැබෙන නාඩි වාක්‍ය කියැවීම වැරදි නම් අපි කොහොමද නිවැරදිම නාඩි වාක්‍ය ලබා ගන්නේ.

**නාහිමි :**


වැරදි නාඩි කියැවීමක් තමන්ට ලැබිලා තියෙනවා කියලා හිතෙනවා නම්, ඒකටත් පිළියමක් නාඩි වාක්‍ය තුළම තියෙනවා.

නාඩි වාක්‍යවල එක විශේෂ කාණ්ඩයක් තියෙනවා, **ප්‍රශ්න කාණ්ඩම් කියලා. මේ කාණ්ඩය තුළින් මමත් අවස්ථා ගණනාවකදීම තොරතුරු විමසලා බැලුවා.ඒ ක්‍රමයෙන් තමන්ගේ නාඩි වාක්‍යයේ සඳහන් සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගන්නට පුළුවන්.**


තව දෙයක් මට කියන්න තියනවා. බුදුන් වහන්සේ වදාළ ධර්මය උන්වහන්සේ පිරිනිවන් පාලා මාස තුනක් වෙන කොට යම් යම් භික්ෂූන් වහන්සේලා විසින් වැරදි අර්ථකථන දීමට උත්සාහ දැරුවා.

ඒ අවස්ථාවේ කාශ්‍යප මහරහතන් වහන්සේ, මහරහතුන් වහන්සේලා පමණක් සම්බන්ධ කරගෙන ප්‍රථම ධර්ම සංඝායනාවක් පවත්වලා ධර්මය කොටස්වලට බෙදලා එක් එක් භික්ෂු සමූහයාට ඒ කොටස් කට පාඩම් කරමින් රැක ගැනීමේ වගකීම පැවරුවා. මේ අවස්ථාවේ මට මතක් වෙනවා ආනන්ද මහ රහතන් වහන්සේගේ කාර්යභාරය.

**මේ සංඝායනාවට සහභාගිවීමට අවසරය තිබුණේ මහ රහතන් වහන්සේලාට පමණයි.**



මේ කාණ්ඩය තුළින් මමත් අවස්ථා ගණනාවකදීම තොරතුරු විමසලා බැලුවා.ඒ ක්‍රමයෙන් තමන්ගේ නාඩි වාක්‍යයේ සඳහන් සත්‍ය අසත්‍යතාව තහවුරු කර ගන්නට පුළුවන්.



මං මේ කරුණ කිව්වේ බුද්ධ භාෂිතය නිවැරදිව රැක ගැනීම සඳහා බොහෝ සේ භික්ෂුන් වහන්සේලා,රජවරු, ජනාධිපතිවරු, අගමැතිවරු කටයුතු කරලා තියෙනවා කියන එක පෙන්නන්න.



1955 දී බුරුමයේ පැවති සංගායනාවට සහභාගි වූ භික්ෂූන් වහන්සේලා සමග ආනන්ද මෛත්‍රය නා හිමියන් පෙනී සිටි ඡායාරූපයකි.



බලංගොඩ ශ්‍රී නන්දාරාම විහාරස්ථානයේදී නා හිමියන් සමග කරන ලද රූපවාහිනි සාකච්ඡාවක් පටිගත කරන අවස්ථාවකි.

මේ වනවිටත් ධර්ම භාණ්ඩාගාරික විරුදාවලිය ලබා සිටි ආනන්ද හාමුදුරුවෝ රහත් භාවය ලබා සිටියේ නැහැ. උන්වහන්සේ අසූ හාර දහසක් වූ ධර්මස්කන්ධය සිතින් දරාගෙන රැකගෙන ආව හාමුදුරුවෝ.සංඝයනාවට සහභාගිවීමට අවශ්‍යම තැනැත්තා වුණේ ආනන්ද හාමුදුරුවෝයි.

උන්වහන්සේ දිවා රාත්‍රී භාවනායෝගීව සිට මහත් ආයාසයක් දරලා සංඝායනාවට පෙර මහ රහත් භාවයට පත්වෙලා සංඝායනාවට සහභාගී වුනා.

විවිධ අවස්ථාවල නැවත නැවතත් සංඝායනා පවත්වමින් බුද්ධ දේශනාව මහ සඟ පරපුර විසින් රැක ගත්තා .

මම එක සිද්ධියක් කියන්නම්. 1955 දී බුරුමයේ පැවැත්වුණු සංඝායනාවට මමත් සහභාගි වුණා. එතන එක වචනයක් පිළිබඳව දින ගණනාවක් මහා තෙරුන් වහන්සේලා වාද විවාද කළා. බුරුම පත පොතේ සඳහන් වුණේ **"පත්ථ පත්ථ මූකලන්"** කියල මෙහි මූකලන් යන වචනය වැරදියි. මං පැහැදිලි කළා එය **"පත්ථ පත්ථ පුලකං"** වශයෙන් නිවැරදි විය යුතුයි කියලා.

තර්ක විතර්ක කරලා පතපොතින් ශබ්ද නිඝණ්ඩු ආදී දේවලින් මං කරුණු උපුටලා පෙන්නුවාට පස්සේ බුරුම ජනාධිපතිතුමා, අගමැතිතුමා එය නිවැරදි බව පිළි ගත්තා.

මං මේ කරුණ කිව්වේ බුද්ධ භාෂිතය නිවැරදිව රැක ගැනීම සඳහා බොහෝ සේ භික්ෂූන් වහන්සේලා,රජවරු, ජනාධිපතිවරු, අගමැතිවරු කටයුතු කරලා තියෙනවා කියන එක පෙන්නන්න.

නමුත් නාඩි වාක්‍යවල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීමට කිසිවෙක් හෝ හිටියේ නැහැ. ඒත්, බුදුන්වහන්සේ

උපදින්නට අවුරුදු 3000කට පෙර ප්‍රකාශිත නාඩි වාක්‍ය කිසිම අවස්ථාවක සංශෝධනවලට භාජනය කරලා නැහැ. එම නිසා යම් යම් අඩු ලුහුඬුකම් ඇතිවිය හැකියි.

ඒත් ඒවා නිවැරදි කර ගැනීමේ ක්‍රමය ප්‍රශ්න කාණ්ඩ තුළින් උදාවෙලා තියෙන නිසා මේ පිළිබඳ කිසිම කෙනෙකුට සැකයක් ඇති කර ගත යුතු නැහැ.

**ප්‍රශ්නය :**

මේ ප්‍රශ්නයටම සම්බන්ධ කරලා තවත් ගැටලුවක් විසඳා ගැනීමට තියෙනවා ස්වාමීනි, ලංකාවේ ඉන්න අයට නාඩි වාක්‍ය කියවා ගැනීමේ භාග්‍ය උදාවෙලා තියෙන්නේ දැනට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිය ලබාගෙන සිටින අගස්තියර් කෞෂික නාඩි වාක්‍ය කියවන්නන්ගේ උපකාරයෙන්.

මේ අය විටින් විට ඉන්දියාවට ගිහිල්ලා සමහරුන්ගේ නාඩි වාක්‍ය ඇතුළත් තල්පත් ගෙනාවා. ඒ ආශ්‍රයෙන් නාඩි වාක්‍ය කියවනවා.

ඒත් ස්වාමීනි, මේ නාඩි වාක්‍ය කියවන ක්‍රමය නිසා බොහෝ දෙනා කියනවා අපෙන්ම ප්‍රශ්න අහලා. අපෙන්ම විස්තර ලබාගෙන නැවතත් ඒ විස්තර අපටම කියනවා කියලා. මේ ගැන ඔවුන් තුළ සැකයක් තියනවා. මේ ප්‍රශ්නයට ඔබ වහන්සේගේ පිළිතුර මොකක්ද ස්වාමීනී,

**නාහිමි :**

ඔය ප්‍රශ්නය මගෙන් මීට පෙර කීපදෙනෙක්ම අහලා තියනවා. මට පළමුවෙන්ම කියන්න තියෙන්නේ අපේ මිනිස්සු නිමිති බලන්න යන්නෙත්, **සාස්තර අහන්න යන්නෙත් හිතේ සැකයක් තියාගෙන.** තමන් සාස්තර අහන්න ගියා කියලා තවත් කෙනෙකුට කීවම ඒ ඇත්තෝ ඉස්සරලම අහන්නේ හරියට කියවුනාද කියලා.

ඕක ගැන පුදුම වෙන්න දෙයක් නැහැ මහත්තයෝ. අපේ බුද්ධ දේශනාවේ මූලික ඉගැන්වීම තමයි චතුරාර්ය සත්‍යය. ඒ කියන්නේ **දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග කියන කොටස්. දුක, දුක ඉපදීමට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය, ඉන් ලබන ඵලය කියලනේ.අපේ බෞද්ධයෝ මේ පරම සත්‍ය ගැනත් සැක හිතනවනේ. ප්‍රශ්න කරනවනේ.**

අහපු ප්‍රශ්නෙට පිළිතුර මෙහෙමයි. ඔය නාඩි වාක්‍ය ගැන සැක කරන බොහෝ දෙනා ඒ ගැන දන්නේ නැහැ. හරි අවබෝධයක් නැහැ. විස්තර දන්නෙත් නැහැ. ඒ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ.

**මාත් මුල්ම දවසේ නාඩි වාක්‍ය ගැන සැක හිතින්** තමයි හිටියේ.එම නිසා මම අනුන් කරන මේ ප්‍රශ්න කිරීම් ගැන පුදුම වෙන්නේ නැහැ. ඒක සාධාරණයි.

මුන්නැහේ කීවා අපෙන්ම ප්‍රශ්න අහලා අපෙන්ම උත්තර අරගෙන, නැවත අපටම කියනවා කියලා. ඒ අගස්ති කෞෂික නාඩි වාක්‍ය ක්‍රමය.

ඔබට මේ නාඩි වාක්‍ය කොලේ තියෙන භාෂාව කියවන්න පුළුවන් නම් තමන්ගේ නාඩි වාක්‍ය ඇතුළත් පිටපත තමුන්ටම සොයා ගන්න පුලුවන්. මේ නාඩි වාක්‍ය කියවන්නන් කරන්නේ නාඩි වාක්‍ය තල්පතේ ඇති භාෂාව ඔබ නොදන්නා නිසා ඒවා කියවන එකයි. ඔබේ නාඩි වාක්‍ය තල්පත ඔබට සොයා ගැනීමට උදව් කිරීමයි.

සමහර විට දෙමළෙන් ඇති ඒ වාක්‍ය පරිවර්තනය කරන කොට පරිවර්තකයා ඒ ප්‍රකාශය ප්‍රශ්නයක් විදිහට ඔබෙන් අහනවා වෙන්න ඇති. **නමුත් මුල් ග්‍රන්ථවල එහෙම ප්‍රශ්නයක් වශයෙන් නෙවෙයි තියෙන්නේ. ශ්ලෝක විදිහටයි තියෙන්නෙ. මේ එක නාඩි වාක්‍ය ක්‍රමයක් පමණයි.**



Scanned by TapScanner

මුල් කාණ්ඩය සොයා ගත්තට පස්සේ ඉතිරි සියලුම විස්තර වර්තමානය, අනාගතය, පෙර භවය, මතුභවය, මරණය සිදුවන දිනය, විවාහ වන කාලය, විවාහ වෙන්නේ කුමන පළාතකින්ද ආදි හැම දෙයක්ම ඔබෙන් විස්තර අහලා දැනගෙන නෙවෙයි ඒ ඇත්තෝ කියන්නේ.

මේ කාණ්ඩයේ දැක්වෙන දේවල් ඒ ඇත්තෝ කියන්නේ තල්පතේ ඇති විස්තරයි. තව නාඩි ක්‍රමයක් තියෙනවා,

ඔබ ඒ ඇත්තන්ට ඔබේ කේන්ද්‍ර පිටපත දුන්නම ඒ ඇත්තෝ ඒ ඇත්තන්ගේ පුස්තකාලයෙන් ඒ කේන්ද්‍රයට ගැළපෙන තල්පත් මිටියෙන් ඔබේ නම, දෙමව්පියන්ගේ නම්, බිරිඳගේ නම ආදිය කියවනවා. අනියම් බිරිඳක් ඉන්නවා නම් ඇයගේ නමත් කියනවා.

**ඔබ එක වචනයක්වත් කිවයුතු නැහැ.**

තවත් නාඩි ක්‍රමයක් තියනවා මට මතකයි **කමලමුණි නාඩි වාක්‍ය. ඒ නාඩි වාක්‍ය කියවා ගැනීමට යන තැනැත්තා තමන්ගේ මාහපටැඟිල්ලේ සලකුණ පමණයි දෙන්නට ඕනෑ කරන්නේ.**

එහි සඳහන් රේඛා සලකා බලලා ඒ අය විස්තර කියනවා. මං ගැන කියනවා නම් මගේ අතේ ඇති රේඛාව ගැන බලලයි මට විස්තර කිව්වේ. මේ පිළිබඳව මං පසුවට දීර්ඝ විස්තරයක් කියන්නම්.

කමල මූර්ති නාඩි වාක්‍යයෙන් ද මම නාඩි කියෙව්වා. ඒ මගේ දකුණු අතේ මාපටඟිල්ලෙන් සටහන් ලබාගෙන.මට සම්පූර්ණ විස්තරයක් දුන්නා. **එක වචනයක්වත් ඔවුන් මගෙන් ඇහුවේ නැහැ. අනෙක් අයගෙනුත් ඒ වගේමයි. ප්‍රශ්න කිසිවක් අහන්නේ නැහැ.**

පිරිමි පාර්ශ්වයේ දකුණු මාපටැඟිල්ලේ සටහනකුත්,

කාන්තා පාර්ශ්වයේ වම් මහපටඟිල්ලේ සටහනකුත් ලබාගෙන විස්තර කියනවා.

**මේ ක්‍රමය නම් මට හරිම පුදුමයි. විශ්මිතයි.**

## ප්‍රශ්නය :

ස්වාමිනී, සමහරුන්ට තමාගේ විවාහය පිළිබඳ කියැවෙන හත්වෙනි පරිච්ඡේදය ගැන විමසුවහම කෙළින්ම විවාහ වන අයගේ නම හෝ පදිංචි ස්ථානය පිළිබඳ කියන්නේ නැහැ. ඉන්න දිශාව, ගෙදර තොරතුරු මාර්ග සලකුණු, නමත් කියන්නේ ව්‍යංගයෙන්. ඍෂිවරුන් ඇයි මේ ප්‍රශ්න කෙළින්ම නොකියන්නේ.

## නාහිමි :

මේක හරි සංකීර්ණ ප්‍රශ්නයක් මහත්මයා, ඉන්දියාව කියන්නේ මහ විශාල රටක්. විවිධ ජාතිවල, කුලවල භාෂා කතා කරන පිරිසක් ඉන්න රටක්. කුලවාදය ඉන්දියාවේ තදින්ම තියනවා. **සමහර විට ඍෂින් වහන්සේලා විවාහය වගේ දේවල් කෙළින්ම නොකියා, ව්‍යංගයෙන් කියලා තියෙන්නේ ආරක්ෂාව නිසා වෙන්න පුළුවන්.**

උදාහරණයක් වශයෙන් එක උසස් කුලයක කෙනෙකුගේ විවාහය කර්මානුරූපීව සිද්ධ වෙන්නේ තියෙන්නේ ඉතාම පහත් කුලයක කෙනෙකු සමග නම් අනිවාර්යයෙන්ම ඒ තැනැත්තා හෝ තැනැත්තිය සොයා ගෙන ගිහිල්ලා ඒ පවුලේ ඇත්තෝ ඒ තැනැත්තා විනාශ කරනවා ඒ විවාහ අවස්ථාව නැති කිරීමට, එම අවස්ථාව වෙනස් කරන්න,

එම නිසයි මේ විදිහට වාක්‍ය නාඩි කියන්න ඇත්තේ. ඉස්සර අපේ රටේ රාජ කුමාරවරු සැඩොල් කාන්තාවන් විවාහ කරගත් අවස්ථාවන් තියනවානේ. සාලිය කුමාරයාගේ



Scanned by TapScanner

කතාව වුණත් මේ පිළිබඳ උදාහරණයක් හැටියට ගන්න පුළුවන්.

මට තවත් කරුණක් මුන්නැහේට කියන්න තියනවා. සමහර අයගේ නාඩි වාක්‍ය කියවා ගෙන යනකොට, **රටේ පාලකයා වන අතුරු අන්තරා සහ රටේ ඇතිවන අර්බුද පිළිබඳවත් සඳහන් වනවා.**

මේක විශේෂ අවස්ථාවක්. **ඔබේ රටේ නායකයා මේ වසරේ දී මිය යනවා. ඊට පස්සේ ඔබේ කාර්යය ඉටුවෙනවා කියලා. සමහර නාඩි වාක්‍යවලින් කිය වෙනවා.**

මේවා අධ්‍යයනය කළොත් රටක ඉරණම පිළිබඳ පූර්ව දැන ගැනීමක් ලබාගෙන රටට සෙතක් වන අයුරින් කටයුතු කිරීමේ අවස්ථාවක් තියෙනවා.

### සංස්කාරකගේ සටහන

මෙවැනි අවස්ථා දෙකක් මගේ විමර්ශනයේදී දුනගත හැකි විය. ''ඉසිවරුන් දුටු බව ගමන (2)'' නම් වූ දෙවැනි කෘතියෙහි මේ පිළිබඳ විස්තර ඇතුළත් වේ.

## ප්‍රශ්නය :

ස්වාමිනී, අපි දීර්ඝ වශයෙන් කතා කළේ, නාඩි වාක්‍ය, නාඩි වාක්‍ය ක්‍රම, ඒවා ලියැවුණේ කොහොමද, අපි නාඩි වාක්‍ය ලබා ගන්න ක්‍රම ආදිය පිළිබඳවයි. දැන් ස්වාමිනී, මේ නාඩි වාක්‍ය අපි දැන ගත්තේ ඔබ වහන්සේ විසින් පතපොත සඟරාවලට ලියන ලද ලිපි ලේඛන නිසයි. ස්වාමිනී, අවසරයි, නාඩි වාක්‍ය පිළිබඳ ඔබ වහන්සේගේ පෞද්ගලික අත්දැකීම් මොනවද?

**නාහිමි :**

හොඳයි, මෙහෙමයි සිද්ධ වුණේ. මට ඕන කරලා තිබුණා මගේ ජන්ම පත්‍රය, කේන්ද්‍ර කොපිය නිවැරදිව සකස් කර ගන්න. නාඩි වාක්‍ය මූලාශ්‍රයෙන් ඔවුන් මගේ ජන්ම පත්‍රය, කේන්ද්‍රය නිවැරදිව ලබා දුන්නා. උපන් දිනය ආදී විස්තර සමූහයක්.

**මේ දක්වා ඔවුන් විසින් මා ගැන කියා තිබූ අනාගත වාක්‍ය සියල්ල ඉතාම නිවැරදියි. සත්‍යයි. (1992)**

**ප්‍රශ්නය :**

නාඩි වාක්‍ය ඔබ වහන්සේ විසින්ම අත්දැකීමෙන්ම ලබා ගත්තද ස්වාමීනි.

**නා හිමි :**


හොඳයි මම මේ සියලු කතන්දරය විස්තරය ඔබට කියන්නම්. මුලින්ම මම නාඩි වාක්‍ය ගැන වැඩි විස්තර මුකුත් දැනගෙන හිටියේ නැහැ. ඒ ගැන යම්තම් අහලා තිබුණා විතරයි.

**නමුත් මම ඒවා විශ්වාස කළේ නැහැ.**

වරක් 1951 දී කල්කටාවේ මලබාර් පලතේ පදිංචි වෙලා ඉන්න මගේ මිත්‍ර බෞද්ධ නීතිඥයෙක් වන මන්ජන් රාමන්ලාල් මහත්මයාගේ ආරාධනාවක් පිට කල්කටාවට යන අතරතුර මදුරාසියේ මහාබෝධි සමාගමට අයත් මධ්‍යස්ථානයේ නතර වුණා.

ඒ දවස්වල එම ආයතනයේ භාරකාරයා හැටියට සිටියේ පූජ්‍ය නීලවක්කේ සෝමානන්ද හාමුදුරුවෝ. අපි රාත්‍රී කාලයේ එක එක දේවල් ගැන කතා කරමින් ඉන්න කොට මං ඇහුවා උන්වහන්සේගෙන්, උන්වහන්සේ දන්න දක්ෂ

ජ්‍යෝතිර්වේදියෙක් එහෙම ඉන්නවද කියල මගේ කේන්ද්‍රය නිවැරදිව හදා ගන්න පුළුවන්. උන්වහන්සේ මගෙන් ඇහුවා ඇයි එහෙම කෙනෙක් ගැන අහන්නේ කියලා.



මට ඕනෑ කරල තිබුණා මගේ ජන්ම පත්‍රය කේන්ද්‍ර කොපිය නිවැරදිව ලබා ගන්න.

මං කිව්වා මම ටිකක් ජ්‍යෝතිෂ්‍ය ගැන දන්නවා. මගේ දැනීමේ හැටියට මගේ කේන්දරය මට පිළිගන්න අමාරුයි. මගේ කේන්දරය හරි මදියි. කේන්දරයේ මොකක් හරි වරදක් තියෙනවා. ඒක මට නිවැරදි කර ගන්න ඕනෑ කියල. **එතකොට උන්වහන්සේ කිව්වා ඇයි ඕකට ඔච්චර කරදර වෙන්නේ. ශාස්ත්‍රකාරයන් පස්සේ යන්නේ.**

**ඔබ වහන්සේ කෙළින්ම නාඩි වාක්‍ය කියන මධ්‍යස්ථානයට ගියාම නිවැරදි කේන්දරය ගන්න පුළුවන් කියලා. මං ඇහුවා** මොනවද නාඩි වාක්‍ය කියන්නේ කියලා. උන්වහන්සේ කිව්වා පුරාණයේ සිටි ඍෂිවරුන් විසින් ප්‍රකාශයට පත් කරලා තියෙන නියම සත්‍ය අනාගත වාක්‍ය සමූහයක් කියලා. මේ

ඍෂිවරු ජීවත් වෙලා ඉඳලා තියෙන්නේ ඉන්දියාවේ මීට අවුරුදු 5000 කට 6000කට ඉස්සර කාලෙයි.

සමහර විට ඔබ වහන්සේගේ නමත් ඒ අතර තියෙන්න පුළුවන්. ඔබ වහන්සේගේ කේන්දර පිටපතත් ලබා ගන්න පුළුවන් කියලා උන්වහන්සේ කිව්වා. **ඒත් මං සිටියේ සැකෙන්.** මං ඇහුවා කොහොමද, කවදද යන්න පුළුවන් කියලා. උන්වහන්සේ කිව්වා හොඳයි හෙට උදේ හීල් දානෙන් පස්සේ අපි එයා හමුවෙන්න යමු කියලා. අපි දෙන්න ගියා ඒ අය හමුවෙන්න.

අපි ගියේ මදුරාසියේ රායි පෙටා රෝඩ් කියන පැත්තට. එම ස්ථානයේ බෝඩ් එකක් ගහලා තිබුණා. **''කෞමාර නාඩි ජ්‍යෝතිෂ්‍ය මධ්‍යස්ථානය''''කෞමාර නාඩි ඇස්ලොජිකල් බියුරෝ''** ( **KAWMAARI NAADI ASTROLOGICAL BUREAU** ) කියලා. මේ ස්ථානය තිබුණේ මදුරාසියේ රායි පෙටා රෝඩ් පොලීසිය ළඟ.

අපි ඒ ස්ථානයට ඇතුළු වුණා.ඒක විශාල ශාලාවක්. අපි දැක්කා මනුස්සයෙක් බිම එළාගත්ත පැදුරක් උඩ ඉඳගෙන තවත් මනුස්සයෙක් එක්ක කතා කරකර ඉන්නවා. මේ මනුස්සයා බොහෝම සරල සාමාන්‍ය දෙමළ මනුස්සයෙක්.හරියට නාඩාර් කෙනෙකු වගේ.

මේ වගේ මනුෂ්‍යයෙකුට මේ වගේ ශ්‍රේෂ්ඨ වැඩක් කරන්න පුළුවන්ද කියල **මට විශාල සැකයක් මතු වුණා.** මං හිතුවා කමක් නෑ ගිහිං බලමු කියලා. අපි ඇතුළට ගියා. ඔහු දෙමළෙන් කතා කළා. ඒ තැනැත්තාට හොඳට දෙමළ කතා කරන්න පුළුවන්.

**නීලවක්කේ හාමුදුරුවෝ මා ගැන මොකුත්ම කිව්වේ නෑ. මේ හාමුදුරුවන්ට නිවැරදි කේන්දර කොපිය ලබා ගන්න ඕන කියලා විතරයි කිව්වේ.**



Scanned by TapScanner

ඒ තැනැත්තාට ටිකක් ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්. ඔහු මගෙන් ඇහුවා කේන්දරයක් නැද්ද කියලා. මං කිව්වා මට කේන්දරයක් තියෙනවා. ඒත් ඒක මට සැකයි කියලා. ඔහු මට කිව්වා,

මට සහතික කරලා කියන්න බැහැ ඔබ වහන්සේගේ කේන්දර පිටපත මගේ ලිපි ලේඛණ අතරේ තිබෙනවද කියලා. මට හම්බ වුණොත් දෙන්න පුළුවන්. ඔබ වහන්සේගේ කේන්දර පිටපතයි, ජීවිත විස්තරයයි සියලුම දේ. ඒකට මං සෙවීමේ ගාස්තුව හැටියට රුපියල් පහක් ගන්නවා. කේන්දර කොපිය ලැබුණත් නැතත් මේ සෙවීමේ ගාස්තුව ආපහු දෙන්නේ නැහැ කියල.


මං කිව්වා කමක් නෑ. මං රුපියල් පහක් දුන්නා. ඊට පස්සේ **ඒ තැනැත්තා මගේ දකුණු අතේ අල්ල පරීක්ෂා කරන්න පටන් ගත්තා.**

**ප්‍රශ්නය:**

ඒ ඔබ වහන්සේගේ පළමු අත්දැකීමද ස්වාමීනි ?


**නාහිමි :**

ඔව් ඒ මගේ පළමුවෙනි අත්දැකීම. ඒ වගේ අත්දැකීමක් මට මීට පෙර කිසිදිනෙක ලැබිලා නැහැ. ඒ තැනැත්තා මගේ අල්ල පරීක්ෂා කරමින් ඉඳලා කිව්වා **ඔබ වහන්සේගේ අතේ ''සරිත්තෝම්බර් සර්වමාල්'' රේඛාව තියෙනවා කියලා.** ඊට පස්සේ ඔහු කාමරයට ගිහිල්ලා පරණ කුඩා තල්පත් මිටියක් ගෙනල්ලා පිටු පෙරළන්න පටන් ගත්තා. ''සරිත්තෝම්බර් සර්වමාල් රේඛාව'' හම්බ වෙනකල්.





නාඩි තල්පත් කියවන අවස්ථාවක්



වසර 700 කට වඩා පැරණි නාඩි තල්පත්

**ප්‍රශ්නය :**

ඒ අර පරණ තල්පත් මිටියෙන්ම ද ස්වාමීනි,

**නාහිමි :**

ඔව් පරණ තල් අත් පිටපතකින්. මම තේරුම් ගත්තා ඒක **ලියලා තිබුණේ අ, ආ, ඉ,ඊ කියන අකාරාදි පිළිවෙළට කියලා.**

පිටු පෙරළමින් සිටි ඔහුට හම්බ වුණා අර නම තියෙන පිටුව. ''සරිත්තෝම්බර් සර්වමාල්'' කියන රේඛාව තියෙන කොළේ. ඊට පස්සේ ඒ කොළේ තියෙන දේවල් කියවන්න පටන් ගත්තා. **මේ රේඛාවේ හැටියට ඔබේ නම ''කුංචන්''මහත්තයන්.**

**ප්‍රශ්නය :**

කුංචන් මහත්තයන් කියලා?

**නාහිමි :**

මං පුංචි කාලේ කුඩා දරුවෙක් විදිහට ඉන්න කොට මට කතා කෙරුවේ **පුංචි මහත්තයා කියලා.** ඒකෙන් මං ඉගෙන ගත්ත දෙයක් තමයි පුංචි කියන වචනය දෙමළෙන් කුංචන් කියන වචනයෙන් ආව කියල

**ඔබට තවත් දෙවැනි නමකුත් තියෙනවා. ඒ මොකක්ද කියලා මං ඇහැව්වා. ''විලියම්''** මං පුංචි දවස්වල අනෙක් අය අතරේ ගැවසෙන කොට මට විහිළුවට වගේ විලියම් කියලා කතා කෙරුවා. **ඒක තමයි දෙවැනි නම.**

ඊළඟට ඔහු කිව්වා ඔබට තවත් තුන්වැනි නමකුත් තියෙනවා කියලා.

**''සරණ ගවේශී''ඒ මොහොත වනතුරු කිසිම කෙනෙක් ඒ නම දැනගෙන සිටියේ නැහැ.**

අඩුම තරමින් නීලවක්කේ සෝමානන්ද හාමුදුරුවෝවත් ඒ නම දැනගෙන හිටියේ නෑ.

මේ නම මට තැබුවේ මගේ උපාධ්‍යන් වහන්සේ විසින් **ඒ නම දැනගෙන හිටියේ අපි දෙන්නා විතරයි.**

**ප්‍රශ්නය :**

ඔබ වහන්සේට මේ අත්දැකීම් ලබාගන්න පුළුවන් වුණේ දකුණු ඉන්දියාවේදීද ස්වාමීනි,

**නාහිමි :**

ඔව් පළමු වතාවට.



Scanned by TapScanner



මගේ ප්‍රාර්ථනාව වන්නේ සම්මා සම්බුද්ධත්වයට පත්වෙලා නිවන් අවබෝධ කර ගැන්මය්.

**ප්‍රශ්නය :**

ඊට පස්සේ ඇත්තටම මොකද වුණේ ස්වාමීනි ?

**නාහිමි :**

ඊට පස්සේ ආයිත් ඔහු කිව්වා, **ඔබට හතරවෙනි නමකුත් තියෙනවා ''ආනන්ද මෛත්‍රය''කියලා.** මං කිව්වා හරි කියලා. ඒ සියල්ල ඇත්තයි, සත්තයි කියලා.

එහෙනම් ඔබගේ මවගේ නම **''සින්න මානික්කම්''** මගේ අම්මගේ නම **''හීන් මැණිකේ''** ඊට පස්සේ ඔහු ඇහුවා මේ සියල්ලම ඇත්තද කියලා. මං කිව්වා හරි කියලා.

එහෙනම් ඔබගේ පියාගේ නම **''මදියන් අප්පන්සාමි''** මං කිව්වා හරි කියලා. මොකද මගේ පියාගේ නම **''මැතියෙස් අප්පුහාමි''** මේ සියලුම දේ හරි ද කියලා ඔහු ඇහුවා. මං

කිව්වා හරි කියලා. ඊට පස්සේ ඔහු කිව්වා මට ඔබගේ කේන්දරය දෙන්න පුළුවන් කියලා. ඒ වෙනුවෙන් මං රුපියක් විස්සක් අය කරනවා කියලා.

**ප්‍රශ්නය :**

**<u>ඔබ වහන්සේ විශ්වාස කරනවාද මේ සියල්ලම ඇත්ත කියලා?</u>**

**නා හිමි :**


**<u>ඔව් සියලුම දේ ඇත්ත.</u>**

ඊට පස්සේ ඔහු දිග තල්පත් මිටියක් ගෙනාවා. ඔහු මට කිව්වා මේවා කොපි කරලා දෙන්න කොපි පොතක් ගෙනත් දෙන්න කියලා. මගේ නාඩි කියවීමේ විස්තරය ලියලා දෙන්න කියලා. මං ළඟම තියෙන කඩේකට ගිහිල්ලා කොපි පොතක් ඒ අයට ගෙනත් දුන්නා. ඒ සමගම රුපියල් විස්සකුත් දුන්නා. ඊට පස්සේ ඒ පැරණි තල්පත් පිටපතෙන් විස්තර කොපි කරන්න පටන් ගත්තා.


ඔහු මේ තල්පත් පිටපත්වල ඇති දෙය කියව්වේ කුඩා දේ ලොකු කරලා බලන කන්ණාඩියකින්. ''මැග්නිෆයින් ග්ලාස්'' එකක ආධාරයෙන්. මාත් කිට්ටු වෙලා තල්පත් පරීක්ෂා කළා.

ඒත් ඒවා මට කියව ගන්න බැරි වුණා. මං දැක්කේ තිත් වගයක් විතරයි. මං ඒ අයගේ මැග්නිෆයින් කන්ණාඩිය ඉල්ලාගෙන බැලුවා. ඒත් මං දැක්කේ තිත් විතරයි.

**මට පුදුම හිතුණා මීට අවුරුදු දහස් ගණනකට ඉස්සර හිටිය මිනිස්සු මේ තරම් කුඩා අකුරු ලිව්ව එක ගැන.**



'ඔබගේ නම තංගම්මා.'



ඉතා පැරණි නාඩි වාක්‍ය තල්පත් මිටි සමූහයක්

## ප්‍රශ්නය :

නායක හාමුදුරුවනේ.. ඔබ වහන්සේ මේ ලබපු අත්දැකීම් අනුසාරයෙන් අපට පැහැදිලි කරලා දෙන්න පුළුවන්ද මේ අය සිත් කියවීම තුළින් මේ නාඩි වාක්‍ය කියවනවා කියලා. **ඒ වගේම ස්වාමීනි, ලොව පහළ වූ ශාස්තෲන් වහන්සේලා ගැනත් හොයලා බැලුවද? ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ වැනි ශාස්තෲන් වහන්සේලා ගැන.**

## නාහිමි :

හොඳයි පළමුව කියන්න ඕන මේක සිත් කියවීමක් නෙවෙයි. ඔහු ඒ අන්තයේ දක්ෂයෙක් නෙවෙයි. ඔහු සාමාන්‍යයෙන් පැරණි ලිය කියවිලි වල තිබෙන දේ කොපි කරලා ඒවා වර්තමාන භාෂාවට පරිවර්තනය කරනවා. දෙමළ, ඉංග්‍රීසි භාෂාවලට ඔහු මේ සියලු අනාගත කියවීම් ලබා දෙන්නේ ඔහුගේ දැනීම තුළින් නොවෙයි. මේ සියලු අනාගත වාක්‍ය කියවීම් ඔහු ලබා දෙන්නේ තල්පත්වල ඇති දේ පිටපත් කරලා අනාගත වාක්‍ය තේරුම් කරලා දෙනවා.

**මේ අනාගත වාක්‍ය ඉතාම නිවැරදියි.**

**සත්‍යයයි.**

මේ කියවීම් ඔහුගේ දැනීම තුළින් නොවෙයි කියන්නේ. මෙහි මොන විදියකින්වත් සිත් කියවීමක් සිදුවන්නේ නැහැ. අන් අයගේ සිත් කියවීම් එනම් ටෙලිපති වගේ කියවීමක් ද මෙහි නැහැ.

ඔහු මගේ ජීවිත විස්තරයත්, සත්‍ය කේන්ද්‍රයත් ඔහු මට දුන්නා. **මගේ නාඩි වාක්‍යවලට අනුව මම ඉපදිලා තියෙන්නේ වෘෂභ ලග්නයෙන්.** ඒ මත පිහිටා මගේ ජීවිතය පිළිබඳ විස්තර රාශියක් ඒ අය දුන්නා.

**ප්‍රශ්නය :**

**ස්වාමීනි, නාඩි වාක්‍ය ගැන ඔබ වහන්සේට වෙන විශේෂයමක් කියන්න තියෙනවාද?**

**නා හිමි:**

හොඳයි, මං ඔබට කියන්නම්. කල්පනා කළ යුතු ඉතාම වැදගත් නිශ්චිත දෙයක් **ඔවුන් ළඟ තියෙනවා විශේෂ පොත් වර්ගයක් මනෝමයෙන් ප්‍රශ්නවලට උත්තර දෙන. ඔබ ඔබගේ ප්‍රශ්නය ඔවුන්ට කියන්න ඕන නැහැ. ප්‍රශ්නය ඔවුන්ගෙන් අහන්න ඕන නැහැ.**

**ඔබට තියෙන්නේ ප්‍රශ්නය හිතන එක විතරයි.** ඒ සමගම ඔබේ කේන්ද්‍ර කොපිය ඔහුට දෙන්න ඕන. ඒ ක්‍රමයට කියන්නේ **තනි කාණ්ඩ** නැත්නම් **''ප්‍රත්‍යය කාණ්ඩ''** කියලා. මේ ක්‍රමයෙන් මම හුඟක් විස්තර කීප අවස්ථාවකදීම ලබා ගත්තා. **සමහර පුද්ගලයන් ගැන විස්තර ලබා ගැනීමට කීප අවස්ථාවකදීම ගියා. එම තනි කාණ්ඩම් ඇසුරෙන් විස්තර ලබා ගත්තා.**

එක දවසක් මට හිතුනා **බුදුන් වහන්සේගේ ජීවිත විස්තරය ලබා ගන්න ඕන කියලා.**

මට දැන ගන්න ඕන වෙලා තිබුණේ අපේ බෞද්ධයන් බුද්ධ කාලය ගැන දරණ මතය ද යුරෝපින්ගේ මතය ද නිවැරදි කියලා දැන ගන්න.

එහෙම හිතලා බුදුන් වහන්සේගේ ජීවිත විස්තරය තනි කණ්ඩාම් ආශ්‍රයෙන් ලබා ගන්න ඕන කියලා හිතාගෙන මං මගේ කේන්දර පිටපත ඒ තැනැත්තාට දුන්නා. ඔහු ඔහුගේ තනි කණ්ඩම් පොත මගේ කේන්දර පිටපත හමුවන තෙක් පෙරලුවා.

ඔහු පිටු පෙරලලා බලලා මගේ කේන්දර පිටපත සොයා ගත්තා. ඔහු ඊට පස්සේ මගේ සියළු විස්තර කියන්න පටන් ගත්තා ඉන් පස්සේ ඔහු කිව්වා ඔබ හිතාගෙන ආවේ **"මහා ඍෂි ගෞතමගේ චරිතය ලබා ගන්නට නොවේද" ?** කියලා. ඒ වචන තමයි ඔහු පාවිච්චි කළේ. මම කිව්වා ඔව් කියල

හොඳයි ඒ විස්තරය මෙහේ තියෙනවා. රුපියල් විස්සක් ගෙවන්න. මම රුපියල් විස්සක් දුන්නා. ඔහු බුදුන් වහන්සේගේ ජීවිත විස්තරය සැකෙවින් මට කොපි කරලා දුන්නා.

**එහි සඳහන් වී තිබුණා බුදුන් වහන්සේ තුන් පාරක් ලංකාවට වඩින බව.**

බුදුන් වහන්සේගේ කේන්දර සටහනත්, උත්පත්ති ග්‍රහ සටහනත්,මට දුන්නා. මට දුන්න කේන්දර සටහනට අනුව බුදුන් වහන්සේ කටක ලග්නයෙන් තමයි උත්පත්තිය ලබල තියෙන්නේ.ගුරු පලවැන්නේ, සිංහ නවංශකය.පළවැන්නේ ඉන්නේ ගුරු.



Scanned by TapScanner

බුදුන් වහන්සේගේ ආයු කාලය කෞමර නාඩී ප්‍රත්‍යෙ කණ්ඩයට අනුව **අවුරුදු 80 මාස 10 දින 15 බව සඳහන් වෙනවා. බුදුන් වහන්සේගේ පරිනිර්වානය සිදු වෙන්නේ වෙසක් මස පුන් පොහෝ දවසේ ඉරිදා දිනෙක මධ්‍යාහන් කාලයේ බවයි කියවුනේ.**

**බුදුන් වහන්සේ උප්පත්තිය ලබන්න අවුරුදු තුන් දහසකට හාර දහසකට ඉස්සර හිටි ඍෂීන් වහන්සේලා තමයි මේවා ප්‍රකාශන කරල තියෙන්නේ .**

වැදගත් කාරණයක් තියෙනවා කියන්න. ශ්‍රී ලංකාවේ දින වකවානු එනම් 543 බී.සී. ගණන නිවැරදියි. ඒ අනුව මම සම්පූර්ණ කියවීම් පිටපතක් ලබා ගත්තා. **ඒ සියල්ල අපේ ශ්‍රී ලංකාවේ පාලි පිටපත් ග්‍රන්ථවලට එකඟයි.** කිසිම වෙනසක් නැහැ සමහරු කියනවා වගේ අතිශයෝක්තියෙන් හෝ වැඩිපුර දේවල් එකතු කරලා නැහැ.

බුදුන් වහන්සේ ගැන අපේ පොත්පත්වල ඇති දේ අතිශෝක්තියෙන් ලියවුණු දේවල් කියලා සමහරු වැරදි විදිහට හිතනවා.ඒ කාණ්ඩම් වලින් කියවපු දේ නිවැරදියි. කිසි දෙයක් අමුතුවෙන් එකතු වෙලා හෝ අතිශෝක්තියෙන් කියවපු කිසිම දෙයක් නැහැ.


**තවත් අවස්ථාවක මට හිතුණා ජේසුතුමාගේ ජීවිත විස්තරය ලබාගත යුතුයි කියලා. මම ජේසුතුමා ගැන සිහි කරගෙන මගේ කේන්ද්‍ර පිටපත දුන්නා. ඔහු ඔහුගේ පොත පෙරළලා බැලුවා.**

එහිදී ඔහු පොත් පෙරළලා බැලුවේ මං පැමිණි දිනය පාදක කර ගෙනයි. ඔහු පොත් පෙරළමින්, පරීක්ෂා කරමින් මා පිළිබඳව පෙරදී කියාපු විස්තර ඉඳලා කිව්වා.

ඊට පස්සේ ඔහු කීවා **ඔබ හිතාගෙන ආවේ ''මරියා මගන්''ගැන කියලා ඒ කියන්නේ ''මේරිගේ පුතා'' කියලා.**

මම කිව්වා ඔව් කියලා.

ඒ විස්තරය මෙහි තියෙනවා. මම රුපියල් විස්සක් ගෙව්වා. **ඔහු එම විස්තරය කොපි කරලා දුන්නා ඔහුගේම අත් අකුරින්ම ඒ කොපිය මා ළඟ තියෙනවා.** ඒ විස්තරය ලියන ගමන්ම එහි සඳහන් දේ ඉංග්‍රීසියට පරිවර්තනය කරලා කිව්වා. ඒ අනුව ජේසුතුමා පෝසත් පවුලක කෙනෙක් නෙවෙයි.



මහනා හිමියන් විසින් විවිධ අවස්ථාවලදී විවිධ පුද්ගලයන් හා සිද්ධීන් පිළිබඳ ලබාගත් නාඩි විස්තර මෙම ග්‍රන්ථ දෙකෙහි ගොනු කර ඇත.

## ප්‍රශ්නය:

දුප්පත් පවුලක කෙනෙක්.?

## නාහිමි :

මේ ජේසු දරුවට අවශ්‍ය වෙලා තිබුණා තමන් අදහන ආගම පිළිබඳ මුල් ඉගැන්වීම් පිළිබඳ දැන ගන්න. හේතුව ඔහුගේ පවුල ඒ අවස්ථාවේදී එක්තරා ආගමක් අදහලා තියෙනවා. **"සෙමින් එසෙන්ස්"** කියන ආගමක්. එම නිසා ජේසු දරුවාට ඕන වෙලා තිබුණා මුල් ඉගැන්වීම් පිළිබඳ සොයා බලන්න.

ඔහු තමන්ගේ දෙමාපියන්ටත් නොකියා තවලමකට එකතු වෙලා පර්සියාවටත්, එතැනින් සුළු ආසියාවටත්, ඉන්දියාවටත් ගියා. ඉන්දියාවේ මාස කීපයක් සිටින අතරතුර ඔහුට විවිධ ගුරුවරුන් හමුවුණා. ඒත් ඔවුන්ගේ ඉගැන්වීම් ගැන සෑහීමකට පත් වුනේ නෑ.

අන්තිමේදී වාසනාවට මෙන් කාශ්මීර්යේ දී එක්තරා සර්වස්ත්‍රවාදී බෞද්ධ භික්ෂුන් වහන්සේ නමක් හමුවී තිබෙනවා. මේ භික්ෂූන් වහන්සේ තිබ්බතයේ ලාඩාක් නුවර හිමිස් ආශ්‍රමයට යමින් සිටි භික්ෂු නමක්.

ජේසුතුමා ප්‍රශ්න කීපයක්ම උන්වහන්සේගෙන් අසා

තිබෙනවා. එම භික්ෂුන් වහන්සේ ඒ ප්‍රශ්න සියල්ලටම ඉතා සාර්ථකව උත්තර දී තිබෙනවා.

**ජේසු දරුවා බලවත් සතුටට පත්වෙලා මේ දේ දැන ගැනීමට තමයි මම මේ තරම් දුරක් ආවේ.** කරුණාකරලා මං ඔබතුමාගේ අනුගාමිකයෙක් වශයෙන් පිළිගන්න කියලා ඉල්ලා තිබෙනවා. **ජේසුතුමා බෞද්ධ භික්ෂුවක් වශයෙන් එකතු වෙලා උන්වහන්සේ සමග ලාඩාක් නුවර හිමිස් ආශ්‍රමයට** ගියා.

ඔහු විවිධ ගුප්ත විද්‍යාවන් වගේම (ලැවකේෂන්) වගේ දේ ඉගෙන ගත්තා. **ඒ වගේම බුද්ධ ධර්මයද විවිධ ප්‍රතිකාර ක්‍රම ද මනෝමය සිරුරෙන් පිටවීම හා වෙනත් සිරුරු මැවීම් ආදී බොහෝ දේ ඔහු ඉගෙනත්තා.**

විසි නවවන වියේ දී ඔහු ආපසු සිය ගම් රට බලා ගියා. ඔහු තමන් උගත් ධර්මය දේශනා කළා. මේ අවස්ථාවේ මුහුදු රළ ගලන්නාක් සේ බොහෝ ජනතාව ඔහුගේ ඉගැන්වීමට වසඟ වුණා. මොකද? මෙය ඔවුනට විශ්වාසවන්ත හා පැහැදිලිව සිතන්නට ඉඩ දී තිබුණ දහමක් නිසා. එම නිසා මෙම දහම ඉතා ජනප්‍රිය වුණා වගේම බොහෝ දෙනෙක් අනුගමනය කළා.

**එම නිසා සතුරු පිරිස් ඔහුව මරා ගන්නට උත්සාහ කළා.** ජේසුතුමාට කොහොම හරි මේ ආරංචිය දැන ගන්නට ලැබුණා. තමන් කුරුසියේ තබා හානියට පත් කිරීමට සූදානමක් තිබෙන බව දැන ගන්නට ලැබුණා.

ඒ අවස්ථාවේදී ඔහු පලස්තීනය හැර දමා ඉන්දියාවට ගියා.

**ඒ අනුව ජේසුතුමා කුරුසියේ තබා ඇණ ගැසුවේ නැහැ.**

එම කියවීම් අනුව එහි සඳහන් වෙනවා **<u>ජේසුතුමා බුදුන් වහන්සේ වෙනුවෙන් මුලු ජීවිතයම කැප කළා කියලා. එතුමාගේ නම කිසි දිනක ලෝකයාට අමතක නොවන බව කියා නාඩි වාක්‍ය අවසන් කර තිබෙනවා.</u>** මට මේ වේලාවේ තවත් කාරණයක් මතක් වෙනවා.

දවසක් මා දන්නා හාමුදුරු වහන්සේ නමක් නේපාලයේ, කත්මන්ඩු නගරයට යෑම සඳහා මට ආරාධනාවක් කළා. මම ඊට පෙර නේපාලයේ ගිහිල්ලා නැහැ. එම නිසා එම ගමනට මම කැමති වුණා. අපි ගියේ බස් රියකින්. ගමනේ මැද හරියේදී බස් රථයේ සිටි අය බසයෙන් බැහැලා ගියා.

බසයේ සිටි එක මහත්තයෙක් මගෙන් ඇහැව්වා ඔබ වහන්සේ අර ස්ථානය බලන්න යන්නේ නැද්ද කියලා. මං ඇහුවා මොනවද එතන තියෙන්නේ කියලා. එතකොට ඒ මහත්තයා කීවා එතැන තමයි ජේසුතුමාගේ සොහොන තියෙන්නේ කියලා. එතැන ස්මාරකයක් ඉදිකරලා තියෙනවා.

පසුව මං පත පොතින් දුටුවා ජේසු නැමැති තැනැත්තාගේ සොහොන ඉන්දියාවේ කාශ්මීරයේ ශ්‍රී නගර් කිට්ටුව තියෙනවා කියලා. ශ්‍රී නගර්වල කැනීම් වලදී ශිලා ලේඛනයක් හමුවී තිබෙනවා. එහි සඳහන්ව තියෙනවා එහි ජේසුගේ (ඊසාගේ) සොහොන බවට **"Grave of Jesus"** නමින් පුවරුවක් ද සවිකොට එතැන ගෙයක් ඉදිකර තියෙනවා.

ජේසුතුමා බටහිර තිබ්බතයේ ලඩාක් නුවර හිමිස් ආරාමයේ කලක් ජීවත් වූ බව එකී ආරමයේ ඇති පොත් පත්වල සඳහන් වන බව ,රෝරික් ,නම් ලේඛකයා **"Heart of Asia"** කෘතියේ දක්වා තිබෙනවා.

**<u>ඒ අනුව නාඩි වාක්‍යවල ජේසුතුමා ගැන කියා ඇති දේ සත්‍යයි.</u>**

පලස්තීනයේ ජේසුවරුන් දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු සිටින්නට ඇති. අලුත් ගිවිසුමේ සඳහන් වන්නේ නියම පුද්ගලයා ගැන නොවේ.

කොටසක් ඔහුගේ ජීවිතය ගැනත්, තවත් කොටසක් තවත් අයෙකුගේ කුරුසියේ තබා ඇණ ගසා මරන ලද අයෙකුගේ කොටසක් එකතු කරලා කියලයි මම තේරුම්ගෙන තිබෙන්නේ.

ඒ ගැන මම හිතන්නේ එහෙමයි. මම කැමති නැහැ අන් අයගේ සිත් රිදවන්න.ඒ කියන්නේ ක්‍රිස්තියානි හා එවැනි ඇත්තන්ගේ.මේ පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කිරීම මෙතනින් නතර කරනවා.

**ප්‍රශ්නය:**

එතකොට ස්වාමීනි ඔබ වහන්සේගේ අත්දැකීම අනුව මෙම නාඩි වාක්‍ය ලබා ගැනීමෙන් අප වැනි සාමාන්‍ය මිනිස්සුන්ට ඇති ප්‍රයෝජනය මොකක්ද?

**නාහිමි :**

හොඳයි, මෙහෙමයි, ඔබේ නාඩි වාක්‍යයේ සඳහන් වෙලා තියෙනවා නම් **ඔබ නිතැතින්ම එතැනට යන්ට පෙළඹෙනවා, හිතෙනවා, ගිහිං වාක්‍ය ලබා ගන්න උත්සාහ කරනවා.**

යමෙකුගේ නාඩි වාක්‍ය **එහි නැත්නම් ඔහු නාඩි වාක්‍ය විශ්වාස කරන්නේ නැහැ. ඔහු එය ලබා ගැනීමට උනන්දු වන්නෙත් නැහැ. යන්නෙත් නැහැ.** ඔවුනට ඒ සඳහා අවස්ථාවක් ලැබෙන්නෙත් නැහැ.

අන්න එහෙමයි නාඩි වාක්‍යයේ කියා තියෙන්නේ.

මහත්තයා, ඔබ බෞද්ධ හෝ අබෞද්ධ හෝ වෙනත් ආගමිකයෙකු වෙන්න පුළුවන්. ඒත් තත්වය එකයි. අප මේ භවයේ උත්පත්තිය ලබන්නේ පෙර භවවලදී කරන ලද කුසල,අකුසල කර්මවල ඵලයක් වශයෙන්.

**අප පිළිගත්තත් නැතත්, කර්ම බලවේගය එකයි. එම තත්වය ඔබට, මට පමණක් නෙවෙයි, බුදුපසේ බුදු මහ රහතන් වහන්සේලාටත් එකයි. අන්‍ය ආගමික නායකයින්ටත්, ශාස්තෘන් වහන්සේලාටත් එකයි. අප මේ භවයේ උත්පත්තියක් ලබලා තියෙන්නෙත් පෙර භවවලදී කරන ලද කුසල අකුසල කර්ම අනුවයි.**

පෙර භවයේ මැරෙන මොහොතේ පහළ වන අන්තිම චුති චිත්තය අනුවයි උපත ලබන්නේ.පහල වන අන්තිම ජවන සිතේ ඇතිවෙන කුසල හෝ අකුසල කර්මය අනුවයි උත්පත්තිය ලබන්නේ. ඒකට කියන්නේ **චුති චිත්තය** කියලා.ඒ චුති චිත්තයේ යහපත් සිතිවිල්ලක් ඇති වූයේ නම් **යහපත් තැනක භවයක් ලැබෙනවා. අයහපත් අකුසල සිතක් ඇතිවූයේ නම්, ඊට ගැළපෙන ජීවිතයක් ලැබෙනවා.**

මේ භවය ලබන්නට අපට බලපාන්නේ සංසාරය පුරා අප කල කුසල අකුසල කර්මයි. එක් කුසල බීජයක් හෝ අකුසල බීජයක් පමණයි මේ භවය ලැබීමට බලපාන්නේ.

අනෙක් සියලුම කුසල, අකුසල කර්ම ගොනා බැඳපු කරත්තය වගේ අපේ පිටු පස්සෙන් එනවා. මේ විදිහට එක කුසලයක් හෝ අකුසලයක් මතු කළ කර්මයක් නිසා ලබන භවයේදී අපි තව තවත් කුසල අකුසල කර්ම රාශියක් අපේ භව ගමනට එකතු කර ගන්නවා.

උදාහරණයකින් මම කියන්නම්. අපේ ගබඩාවේ අබ ඇට කෙළ කෝටි ගණනක් තියෙනවා.ඉන් එක් ඇටයක්

අපි වගා කරනවා. ඒ බීජයෙන් තවත් සිය ගණනක් අබ ඇට බිහිවෙනවා. අන්න ඒ වගේ තමයි කුසල අකුසල කර්ම අපේ භවයට එකතු වෙන්නේ.

**මේ විදිහට අපේ භව ගමන සිඳ බිඳ දමන තුරු භවයේ අපි ගමන් කරනවා.**

නාඩි වාක්‍ය තුළින් කියැවෙන්නේ ඔබ පෙර භවයකදී කළ කුසල හෝ අකුසලකර්ම හේතුවෙන් මේ භවය ලැබී ඇති බවත්, **මේ භවයේ ඇති දුක් කම් කටොළු වලට හේතුව ඔබ පෙර භවයේදී ගත කළ ජීවිතය නිසා බවයි.**

ඒ අනුව නාඩි වාක්‍ය තුළින් උපදෙස් දෙනවා ඔබ මේ භවය යහපත් විදිහට ගත කළහොත් ඉදිරියේදී ඉදිරි භවයේදී මෙහි ප්‍රතිඵල ලැබෙනවා කියලා. ඔබ ඒ ගැන නොසිතා කටයුතු කළහොත් වෙන්නේ දුක් කම් කටොළුවලට මතු භවයේදී ඔබට මුහුණදීමට සිදුවීමයි.

ඔබ මේ මේ දේ කළොත් මේ මේ දේවෙනවා. ඔබ ඒවායින් මිදුනොත් එහි ප්‍රතිඵල ද ඔබට ලැබෙනවා.

**<u>සියලු දේම සිදුවන්නේ ඔබ දැන් ගෙවන ජීවිතය හා විශ්වාසයන් අනුවයි.</u>**

ඔබ ඉතා හොඳ ජීවිතයක්, බුද්ධිමත් ජීවිතයක් ගත කරනවා නම්, ඔබගේ බලවත් අතීත අකුසල් විනාශ කරලා යහපත් ප්‍රීතිමත් ජීවිතයක් ගත කරන්න අවස්ථාව උදා වෙනවා.

ඔබ වැරදි සහ අපරීක්ෂාකාරී ජීවිතයක් ගෙවනවා නම්, ඔබේ අතීත බලවත් අකුසල කර්මවල ප්‍රතිඵල ඔබට භුක්ති විඳීමට හේතු වෙනවා.



Scanned by TapScanner

**ප්‍රශ්නය :**

ස්වාමීනි, මීට පෙර ඔබවහන්සේගෙන් ඇසීමට බලාපොරොත්තු වූ අතිරේක ප්‍රශ්නයක්. ඒ නාඩි වාක්‍ය පිළිබඳ නෙවෙයි, ඔබ වහන්සේ ඉන්දියාවේ ඍෂිකේෂි හා හිමාල ආශ්‍රිත ප්‍රදේශවලට වැඩම කරලා, විවිධ භාවනා ක්‍රම ප්‍රගුණ කළ බව ප්‍රකාශ කළා. අපේ පාඨකයෝ, නරඹන්නෝ කැමතියි ඔබ වහන්සේ ඉන් ලද ඵල ප්‍රයෝජන ගැන දැන ගන්නට. මේ ප්‍රශ්නය ඇසීම මගේ නොදැනුවත්කම නිසා කෙරෙන්නේ නම් මට සමා වී ඊට පිළිතුරු නොදී සිටීම යහපති.

**නාහිමි:**

කෙනෙක් ප්‍රශ්නයකට පිළිතුරු සොයාගෙන ආවම, පිළිතුරු නොදී සිටීම මම කවදාවත් කරලා නැහැ. මම ඉන්දියාවේ යෝගීන් දෙදෙනෙකු යටතේ පුහුණු වුණා. **රමණි මහාඍෂි කංකල්ගමේ සිටි ස්වාමී නාරායනයන්** යටතේ ද පුහුණුව ලැබුවා.

ඒ ඉන්දියානු භාවනා ක්‍රමයක් වන **රාජයෝග සහ ප්‍රාණයාම යෝග භාවනා ක්‍රම ඉගෙන ගන්න.** ඒ භවනා ක්‍රම වලින් අපේ ශරීරයේ ඇති චක්‍ර අවධි කිරීමක් සිදුවෙනවා. චක්‍ර හතක් තියෙනවා.

**මම හයවන චක්‍රය දක්වා චක්‍ර අවධි කළා.මෙම භාවනා ක්‍රම තුළින්. කුන්ඩලනී ශක්තිය මම ලබා ගත්තේ නැහැ** එහෙම වුණොත් මගේ අනාගත ප්‍රාර්ථනාව ඉටුකර ගැනීමට බාධාවන් වන නිසා.



Scanned by TapScanner

## ප්‍රශ්නය:

ස්වාමීනි, මෙම ඉන්දියානු භාවනා ක්‍රමය ඉගෙනීමට ආශාවක් දක්වන අයට ඒ පිළිබඳ විස්තර ලබා ගන්න පුළුවන් ක්‍රමයක් තියෙනවද ස්වාමීනි.

## නාහිමි :

ඉන්දියාවේ නම් පත පොත බොහෝමයක් තියෙනවා. මුන්නැහේ ඒ පිළිබඳව උනන්දුවක් දක්වනවා නම් මට පුළුවන් මං මේ භාවනා ක්‍රමය ගැන කෙටි සටහන් ලියා ගත්තු පොතක කොපියක් දෙන්න. මට වෙලාවක් නෑ මේවා මුද්‍රණය කරන්න. මුන්නැහෙට පුළුවන් නම් මුද්‍රණය කරල මනුස්සයින්ට දෙන්න ඒක මටත් ලොකු පිංකමක් වෙනවා මුන්නැහේටත් ලොකු පිංකමක් වෙනවා.

මුන්නැහේ බලංගොඩ ආ වෙලාවක මතක් කළොත්, ඒකෙන් පිටපතක් මට දෙන්න පුළුවන්. ලියලා තියෙන්නේ නම් ඉංග්‍රීසි භාෂාවෙන්.

**(එකී අත් පොතේ පිටපතක් බලංගොඩ ගිය දිනෙක නා හිමියන්ගෙන් මම ලබා ගතිමි. උන්වහන්සේගේම අත් අකුරින් ලියැවුණු පිටු හා එහි සිංහල පරිවර්තනය මේ පොතෙහි අවසානයේ ඔබට කියැවීමට අවස්ථාව සලසා ඇති බව කරුණාවෙන් සලකන්න.)**

## ප්‍රශ්නය :

ගරු ස්වාමීන් වහන්ස, නාඩි වාක්‍ය කියන්නේ ඔබ වහන්සේ මීට පෙර විස්තර කරපු ආකාරයට කෙනෙකුගේ ජීවිතයේ අතීත, වර්තමාන, අනාගතය ගැන කියැවෙන සත්‍ය ඍෂි භාෂිතයක්. එම නිසා කවුරුත් නාඩි වාක්‍ය පිළිබඳ තමන්

ලැබූ අත්දැකීම් සහ විස්තර පිට කිසි කෙනෙකුට කියන්නේ නැහැ.

**එහෙම වුණත් පිංවත් ස්වාමීන් වහන්ස ඔබ වහන්සේගේ නාඩි වාක්‍ය කියැවීම හා ඊට සම්බන්ධ විස්තර දැන ගන්න බෞද්ධ බොහෝ දෙනා ඉතා ඉවසිල්ලෙන්, ආශාවෙන් සිටිනවා.**

මේ ප්‍රශ්නය ඇසීමෙන් ඔබ වහන්සේ අසීරුතාවකට පත් කළා නම්, මට සමාව වන ලෙසට ද ප්‍රශ්නයට පිළිතුරු නොදී සිටින ලෙසට ද ගෞරව නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනවා ස්වාමීනි.

**නාහිමි:**

ප්‍රශ්නයකට පිළිතුරු සොයා ගෙන ආ කිසිවෙකුට මම පිළිතුරු නොදී යවලා නැහැ. මා මීට පෙරත් මුන්නැහේට ඒක කිව්වා. හැම ප්‍රශ්නයකටම පිළිතුරුදීමේ ශක්තිය මට තියනවා.

**මම නාඩි වාක්‍ය ක්‍රම කිහිපයකින්ම විස්තර ලබා ගත්තා. මුලින්ම ලබා ගත්තේ පණ්ඩිත තංගවේලූ මහතා සතුව තියෙන කෞමාර නාඩි වාක්‍ය තුළින්. ඊට පස්සේ කමලමුණි. කාකබුජන්දර තවත් නාඩි වාක්‍ය ක්‍රම තුළින්ද විස්තර ලබා ගත්තා. ඒ හැම නාඩි වාක්‍යකම විස්තර සමාන විදිහටයි කියැවුණේ.**

මුන්නැහේ ඇහැව්වෙ නාඩි වාක්‍යවල මං ගැන කියලා තියන විස්තර මොනවද කියලා දැන ගන්න කැමතියි කියලානේද?.මෙහෙමයි කියලා තිබුණේ.

අතීතයේ එක්තරා භවයකදී මං කරලා තියෙන පාප කර්මයක් හේතුවෙන් මම මේ භවයේ උපත ලබන්නේ නගරයෙන් ඉතා ඈත ඉතා දුෂ්කර ගම්මානයක. මට මව් සෙනෙහස නැති වෙනවා. මහත් අමාරුවෙන් ඉගෙනීමේ කටයුතු කර ගන්න සිදුවෙනවා.

කිසිම දවසක නගරයේ උසස් පාසලකට ඉගෙනීමට වත් , උසස් අධ්‍යාපනයක් ලැබීමටවත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. පෙර කර්මය නිසා මට කොච්චර දස්කම් තිබුණත්, පත පොත පළ කළත්, ජනතාව අතර ප්‍රචලිත වෙන්නේ නැහැ. ප්‍රසිද්ධියක් ලැබෙන්නෙත් නැහැ. අවුරුදු 50 වනතුරු මේ තත්වය තියෙනවා.

**ප්‍රශ්නය:**

**ඒ සියල්ලලම සත්‍යවුණාද ස්වාමීනි,?**

**නාහිමි:**

**ඒ සියල්ල සත්‍යයයි.**

මං ඉපදුණේ 1896 අගෝස්තු මාසේ 24 වැනිදා. බලංගෙ ාඩ කිරිඳිගල කියන අති දුෂ්කර ගම්මානයේ. හරියට යන්න එන්න පාරක් තොටක් නැහැ. බොහෝම අමාරුවෙන් තමයි නගරයට යන්න වෙන්නේ.

මං ඉපදිලා සති දෙකෙන් අම්මා අන්ත්‍රා වෙලා තියෙනවා. ලොකු අම්මා තමයි මාව හදා වඩාගෙන තියෙන්නේ. අම්මා මැරුණ නිසා තාත්තා නිවිතිගලට ගිහිල්ලා පදිංචි වෙලා තියෙනවා. මට මව්පිය දෙදෙනාගේම සෙනෙහස අහිමි වුණා. ඒ අඩුව කිසිම ලෙසකින්වත් මට දැනුනේ නැහැ. මං හදා වඩා ගත්තේ ලොකු අම්මා මං හිතුවේ මගේම අම්මා කියලා. ඒත් මං ඉතා හොඳින්, සතුටින් හිටියේ.

**ප්‍රශ්නය :**

ඔබ වහන්සේ මේ තරම් දුෂ්කර තත්වයකට පත්වීමට හේතු වුණු පූර්ව කර්මයත් නාඩි වාක්‍යයෙන් කියවුණාද ස්වාමීනි.

**නාහිමි :**

නාඩි වාක්‍ය කියවන විට, සෑම විටම මේ භවය ගැන විස්තර දක්වලා, මේ භවයේ ඇති දුෂ්කරතාවන් ඇතිවීමට හේතු වුණු පූර්ව කර්මය ද පැහැදිලි කරනවා.

**මුන්නැහේ මගෙන් ඇහැව්වේ මං මේ භවයේ ගත කරන දුෂ්කරතාවලට හේතු වුණු පූර්ව කර්මයනේ...?**

**ප්‍රශ්නය:**

එහෙමයි,ඒ සියල්ල සත්‍ය වුනාද ස්වාමීනි?

**නාහිමි :**

**ඔව්,නාඩි වාක්‍ය වල තිබුණු දේවල් සියල්ලම සත්‍යයයි.**

නාඩි වාක්‍යයේ කියලා තිබුණේ මෙහෙමයි.

පෙර එක් භවයක මං රජ කෙනෙකුගේ අග්‍ර පුරෝහිත වෙලා රජුට බොහොම පක්ෂපාතීව, අවංකව, ගුරුහරුකම් දෙමින් රජුගේ විශ්වාසය,ගෞරවය දිනාගත් රාජ්‍ය නිලධාරියෙක් විදිහට කටයුතු කරල තියෙනවා.

රාජ සභාවේ සිටි සෙසු අමාත්‍යවරුන්ට මගේ ක්‍රියා පිළිවෙළ නිසා බොහෝම දුෂ්කරතා ඇති වුණා. ඒ ඇමැතිවරු රජයේ ධනය වංචාවෙන්, සොරකමින් තමන් සතු කර ගත්තා. මං නිසා ඔවුන්ට එම කටයුතු කරගෙන යෑමට අපහසු වුණා.

මේ ඇත්තෝ මං ගැන රජතුමාට ගතු කියලා, මා පිළිබඳ රජුගේ සිත බිඳෙව්වා. රජු මා අග්‍ර පුරෝහිත තනතුරින් වගේම, රාජ්‍ය සේවයෙන් ද අයින් කළා. ටික කාලයක් යනකොට, රජුට සත්‍ය තේරුණා.



Scanned by TapScanner

රජතුමා නැවතත් මා පුරෝහිත තනතුරට පත්කර ගත්තා. වංචා දූෂණ කළ ඇමැතිවරුන් තනතුරු වලින් පහ කළා. දේපළ රාජ සන්තක කළා. තමන්ගේ තනතුරු තාන්න මාන්න, දේපළ අහිමි වීම නිසා ඒ ඇත්තන්ගේ දරුවන් දුෂ්කරතාවට පත්වුණා. දරුවන්ගේ ඉගෙනීම කඩා කප්පල් වුණා.

පසුව මා රජුට කරුණු කියලා නැවතත් ඔවුන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට කටයුතු කළා. රාජ සන්තක කළ දේපළ ආපසු ඔවුන්ට දුන්නා.

මේ අකුසල කර්මය නිසා මා මේ අන්දමට දුෂ්කර ගමක ඉපදිලා තියෙන්නේ.උසස් අධ්‍යාපනය අහිමිවෙලා තියෙන්නේ.හැබැයි මට මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කියලා තිබුණේ නැහැ. මම විමසුවෙත් නැහැ.

**ප්‍රශ්නය :**

සමාවෙන්න ස්වාමීනි, ඔබවහන්සේ ප්‍රකාශ කළා, කෙනෙකු මිය යන දිනය, වේලාව පවා සටහන් කරලා තියෙනවා කියලා. ඔබ වහන්සේගේ නාඩි වාක්‍ය කොහොමද මේ අවස්ථාව කියලා තියෙන්නේ.

**නාහිමි :**

මගේ නාඩි වාක්‍යවල මං අපවත් වෙන දිනය කියලා තිබුණේ නැහැ. **ඒත් නාඩි වාක්‍ය හැම එකකම විස්තර අවුරුදු 80 දක්වා විතරයි කියල තිබුණේ.** ඒ නිසා මං දවසක් ප්‍රශ්ණ කාණ්ඩයෙන් මේ ගැන ඇහැව්වා.

උත්තරේට කිව්වේ අවුරුදු 80න් පස්සේ යෝගි භාවනා ක්‍රම තුළින් මට කැමති කාලයක් දීර්ඝායුෂ විඳින්න පුළුවන් කියලා. **මං කැමති විටෙක, කැමති වේලාවක,** මේ භවයෙන්



Scanned by TapScanner

ඉකුත් වෙන්න පුළුවන් කියලා.

දැන් මගේ වයස අවුරුදු 93 යි. (මේ 1992 දී කරන ලද ප්‍රකාශයකි)නාඩි වාක්‍යයට වඩා අවුරුදු 13 ක් වැඩිපුර මං ජීවත් වුණා. **තවම යෝගී භාවනා ක්‍රම, මෛත්‍රී භාවනාව මං වඩනවා.**

## ප්‍රශ්නයං:

ස්වාමීනි ඔබ වහන්සේ පෙර භවයේදී කළ අකුසල කර්මයක් නිසා මේ භවයේදී මේ අන්දමට භවයක් ලැබුණා කියලා ප්‍රකාශ කළා.මෙවැනි තත්ත්වයෙන් මිදීම සඳහා වෙනත් අයටත් ඍෂීන් වහන්සේලා උපදෙස් දීල තියෙනවද ස්වාමීනි?

## නාහිමි:

මහත්තයා නාඩි වාක්‍යයත්, හරියට බුදුන් වහන්සේ දේශනා කළ ජාතක කතා වගේ. **බුදුන් වහන්සේ ජාතක කතා දේශනා කලේ මීට අවුරුදු 2600කට විතර ඉස්සර නේ.**

**ඒත් මේ ඍෂිවරු නාඩි වාක්‍ය ප්‍රකාශ කළේ මීට අවුරුදු 5000කට, 6000කට විතර ඉස්සර.**

ඍෂිවරු මේ භවයේ උපත ලබන තැනැත්තාගේ වතගොත විස්තර පැහැදිලි කරලා දීලා, මේ භවයේ මුහුණ දීමට සිදුවී ඇති ගැටලු හා ඊට හේතු වූ පූර්ව කර්මය ද තේරුම් කරලා දෙනවා.ඒ විතරක් නෙවෙයි,මේ භවයේ මුහුණදීමට සිදුවන ලෙඩ දුක්,අපල උවදුරු, ප්‍රශ්න හා ඊට යෙදිය යුතු පිළියම්, පැළඳිය යුතු යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ආදියත් විස්තර කරලා තියෙනවා.

**ප්‍රශ්නය :**

ඔබ වහන්සේගෙන් මං අහන්න බලාපොරොත්තු වුණු ප්‍රශ්නය ළඟට ඔබ වහන්සේ මාව යොමු කළා. නාඩි වාක්‍ය කියවපු බොහෝ දෙනා කියනවා තමන්ට මුහුණාදීමට සිදුවන අපල උපද්‍රව ආදියට කළයුතු පිළියම් වශයෙන් විවිධ පුද පූජා පවත්වන්න තියෙනවා කියලා.

පුද පූජා පවත්වන්න කියලා තියෙන්නේ ඇතැම් හින්දු දෙවිවරුන්ටයි මේ තත්ත්වය පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් කළොත් වටිනවා ස්වාමීනි.

**නාහිමි :**

හොඳයි මේ නාඩි වාක්‍ය ප්‍රකාශ කළ බොහෝ ඍෂිවරු බෞද්ධයෝ නෙවෙයි. බුදුන් වහන්සේ උපත ලබන්නට අවුරුදු 3500කට විතර ඉස්සර ජීවත් වුණු අය. ඔවුන් හින්දු භක්තිකයෝ ඍෂිවරු පිහිට පැතුවේ දෙවිවරුන්ගෙන් සමහර දෙවිවරු ඍෂිවරුන්ට නාඩි වාක්‍ය ප්‍රකාශ කළා කියලා සඳහන් වෙනවා.

මීට පෙර මං කීවා. ශිව පාර්වතී, ස්කන්ධ ගණදෙවි, සරස්වතී, ලක්ෂ්මී ආදි දෙවිවරුන්ගේ පිහිට මේ ඍෂිවරුන්ටත් තිබුණා.

එම නිසා නාඩි වාක්‍ය කියවන අයට මේ දෙවිවරුන්ට පුද පූජා කරන ලෙසට එම ඍෂිවරු ලෝකවාසීන්ට කියලා තියනවා.

**ප්‍රශ්නය :**

ස්වාමීනි, ඇතැම් දෙනා මේ නාඩි වාක්‍ය කියලා තියෙන කළ යුතු පුද පූජා විධි අහලා, **මේ දේවල් උපහාසයකින් බැහැර කරලා, අමතක කරනවා. ඔබවහන්සේට මෙවැනි අත්දැකීම්**

**තියෙනවද ස්වාමීනි** මෙහෙම පුද පූජා කිරීම පැහැර හැරීම නිසා දුෂ්කරතාවට, අමාරුවට පත්වුණු අවස්ථා පිළිබඳව.

**නාහිමි :**

හොඳයි මං පිට අය ගැන විස්තර කියන්නේ නැහැ. මගේ නංගිට සිද්ධ වුණු සිද්ධියක් මං පැහැදිලි කරන්නම්. ඒ පවුලේ ඇත්තෝ දැන් මේ භවයෙන් ඉකුත්වෙලා. එම නිසා ඒ අයට අපහාසයක් සිදුවෙන්නේ නැහැ. මගේ නංගි රංමැණිකේ. මම කුඩා කාලයේ නංගිත් එක්කයි කෑවේ බීවේ නිදා ගත්තේ එකටයි. මම මහණ වෙන්න යනකොට නංගි නිදාගෙන හිටියේ.මම යන බව දැනගෙන නංගි අඬයි කියලා හිතලා නංගිට මං කථා කෙරුවේවත් නැහැ.

නංගි විවාහ වුණේ රත්නපුර ප්‍රදේශයේ හිටිය රටේ මහත්තයෙක් එක්කල. ඒ දවස්වල මේ රටේ මහත්තයාගේ තනතුර ඉතා ඉහළ තනතුරක්.ඒජන්ත ළඟට තියෙන තනතුරක්.උන්නැහේ හරි පෝසත්.ඒ කාලේ ඉඩම් වතුපිටි, කුඹුරු හරක බාන හිමි මහා ධනපතියෙක්. උන්නැහේට තිබුණා කාර් හතරක්. ඒ දවස්වල ඒජන්ත උන්නාන්සේටත් තිබුණේ කාර් එකයි. එතකොට ඒ පවුලේ අයගේ තත්ත්වය ගැන මුන්නැහේට හිතා ගන්න පුළුවන්.

අපේ නංගිට අවුරුදු හතළිස් එකක් වෙනකොට දකුණු කකුල උකුලෙන් පහළ පණ නැතිවෙලා, ඇඳට වැටුණා. රටේ මහත්තයා හුඟාක් වියදම් කරලා එක එක දොස්තර මහත්තුරුන්ට, වෙද මහත්තුරුන්ට පෙන්නලා බෙහෙත් කළා. ඒත් හරි ගියේ නැහැ.

දවසක් මං හම්බ වෙන්න රටේ මහත්තයා ආවා. ඇවිදින් කීවා ඉන්දියාවේ ගියාම මං සාස්තර අහන තැනින් විස්තර අහගෙන එන්න කියලා.

මං සාමාන්‍යයෙන් ඉන්දියාවට යනකොට ඔහොම අසරණ තත්ත්වයට පත්වුණු අය යම් දෙයක් කීවොත් ඒ දේ රෝගියාට කරන ගිලානෝපස්ථානයක් වශයෙන් සලකලා කරනවා.

**බෞද්ධ භික්ෂුන්ට, ගිහියන්ගේ පණිවුඩ පායික්කුඩම් කිරීම විනය විරෝධීයි. එහෙත් රෝගී සත්කාරයක් වශයෙන් සලකලා මං ඒ කාර්යය කළා.**

නංගිගේ නාඩි වාක්‍යයේ කියැවුණෝ පෙර භවයේදී කරන ලද අකුසල කර්මයක් හේතුවෙන් මෙම භවයේ හතළිස් එක් වැනි වියේදී දකුණු කකුල තුනටියෙන් පහළ පණ නැති වෙන බවත්, **මෙය කර්මජ රෝගයක්** නිසා කිසිදු වෛද්‍ය ප්‍රතිකර්ම වලින් සුව නොවන බවත් කියලා තිබුණා.

**ප්‍රශ්නය :**

පෙර භවයේ කළ අකුසල කර්මයක් නිසා වූ කර්මජ රෝග යක් කියලා කීවද ස්වාමීනි, ?

**නාහිමි :**

ඔව්, නංගි මීට පෙර භව දෙකකට පෙර යාපන ප්‍රදේශයේ මහා කුලවත් පවුලක කාන්තාවක් විදිහටයි ඉපදිලා තියෙන්නේ.

පෙර කරන ලද කුසල් හේතුවෙන් මෙම භවයේ බව භෝග සම්පත් ඇතිව ඉපදිලා තියෙනවා ,

ඒත්,ඇය ඒ භවයේ කුල මානයෙන් හිස උදුම්මාගෙන ඉඳලා තියෙනවා. දවසක් මහා බලසම්පන්න අඩු කුලයක සන්නාසියෙක් ආධාර ඉල්ලගෙන ගෙයි ඉස්සර පඩියක වාඩිවෙලා ඉඳලා තියෙනවා. මේ අවස්ථාවේ කේන්ති

ගත් ඇය අර බලසම්පන්න කුලහීන සන්නාසියාට දකුණු කකුලෙන් පහර දී දානමාන කිසිවක් නොදී එලවල දාල තියෙනවා.

එම පාප කර්මය නිසා මෙම භවයේ හතළිස් එක් වැනි වියේදී ඇයගේ තුනටියෙන් පහළ දකුණු කකුල අප්‍රාණික වෙනවා. වෛද්‍ය ක්‍රම කිසිවෙකින්වත් සුව වෙන්නේ නැහැ. මේක කර්මජ රෝගයක් කියලා නාඩි වාක්‍යයේ විස්තර කරලා තිබුණා.

**ප්‍රශ්නය :**

මේ කර්මජ රෝගයට ප්‍රතිකර්මයක් කියලා තිබුණද ස්වාමීනි,?

**නාහිමි:**

ඔව් මහත්තයා, පැහැදිලිව ප්‍රතිකර්මයක් කියලා තිබුණා.

**ප්‍රශ්නය:**

අපිත් දැන ගන්න කැමතියි ස්වාමීනි,

**නාහිමි :**

හොඳයි, ප්‍රතිකර්මය වශයෙන් කියලා තිබුණේ එදා ඒ සන්නාසියාට කළ පාප කර්මයෙන් මිදෙන්න තමන්ගේ ආගමට අනුව සිල්වත් පිරිස පස් දෙනෙක් නිවසට කැඳවලා, දහවල් දානය පිරිනමලා, ඒ සන්නාසියාට පෙර භවයේදී සිදුවූ වරද ඒ සිල්වත් අයට කියලා ඒ සන්නාසියා වෙනුවෙන් සමාව අයැද සිටින්න කියලා.

මෙම සත්කාරය තුන් මසක් අඛණ්ඩව සිදුකරන ලෙසත් කියා තිබුණා. මම මේ ගැන රටේ මහත්තයට කීවා.



Scanned by TapScanner

ඒ කටයුතු සූදානම් කිරීමට උදව් කරන්න කියලා රටේ මහත්තයා මගෙන් ඉල්ලා සිටියා. ඒ කාලේ මං බලංගෙ ාඩ පිරිවෙනේ හිටියේ. එම නිසා සිල්වත් හාමුදුරුවරු පස් නමක් දිනපතා යැවීමට කටයුතු කළා. රටේ මහත්තයා දිනපතාම කාර් එකක් පිරිවෙනට එවනවා. මේ කටයුතු සතියක් විතර කෙරුණා.

ඒ අතර මට බුරුමයේ සංඝායනාවට යාමට සිදුවුණා. අවුරුද්දකට වැඩි කාලයක් මම ඒ සංඝායනා වේ. කටයුතු වලට කැපවෙලා හිටියා. ඒක මහා භාරදූර කාර්යයක්. එම නිසා මට අනිත් ප්‍රශ්න ගැන හිත යොමු කරන්න වෙලාවක් තිබුණේ නැහැ. සංඝායනාව අවසන් වුණාම මට **අග්ග මහා පණ්ඩිත යන ගෞරව නාමයක්ද ලැබුණා.** බුරුම රටේ රජතුමා මට සන්නස් පත්‍රයක් ලංකාවට එවලා තිබුණා.

බලංගොඩ පන්සලට ආවට පස්සේ රටේ මහත්තයා මාව හම්බ වෙන්න ආවා.ඇවිල්ලා කීවා නංගිට හොඳටම අමාරුයි කොළඹ ඩර්ඩන්ස් ඉස්පිරිතාලේ නවත්තලා ඉන්නේ කියලා.

මං ඇහැව්වා අර නාඩි වාක්‍යයේ කියලා තිබුණු පූජාවල් කළා ද කියලා.උන්නැහේ කීවේ සති දෙකක් විතර කෙරුවා. වියදම් වැඩි හින්දා නවත්තලා දැම්මා කියලා.

මං ඇහැව්වා වස්තු සම්පත් දේපළ ද වටින්නේ, නංගිගේ ජීවිතය ද වටින්නේ කියලා.

ඊට සතියකට දෙකකට විතර පස්සේ උන්නැහේ ඇවිල්ලා කීවා නංගි අන්ත්‍රා වුණා නාඩි වාක්‍යයේ කියලා තිබුණු දිනයටම,වේලාවටම සිද්ධ වුණා කියලා.

මං කිව්වා දැන් ඕවා ගැන කතා කරලා වැඩක් නැහැ කියලා. නංගිගේ ජීවිතය බේර ගන්න තිබුණු ක්‍රමය කියලා



Scanned by TapScanner

දීලා තිබුනත්, වස්තු තණ්හාවට ඒ දේවල් කෙරුවේ නැහැ. අපරාදේ නංගිගේ ජීවිතය නැති වුණා කියලා මං කිව්වා.

**ඔය මගේ පවුලේ කෙනෙකුට වෙච්ච සිද්ධියක්.**

**ප්‍රශ්නය :**

ඒ සිද්ධිය නම් හරිම අනුවේදනීය සිද්ධියක් ස්වාමිනි.අහගෙන ඉන්න කොට දුක හිතෙනවා.

**නාහිමි :**

**ඒ ගැන කම්පාවීම අර්ථ විරහිතයි. බුද්ධ ධර්මයට, බුද්ධ භාෂිතයට පටහැනි බව සිතාගෙන මම සිත සනසා ගත්තා.**

**ප්‍රශ්නය :**

ස්වාමීනි, නාඩි වාක්‍යවල මරණය සිදුවන කාලය, දිනය, වේලාවත් සඳහන් කරලා තියෙන බව දැන ගන්න ලැබුණා. ඒත් සමහරුන්ගේ ඒ කරුණු මේ අයුරින්ම සිදුවෙන්නේ නෑ. සමහර කියපු දිනයට කලින් මැරෙනවා. තවත් සමහරුන්ගේ මරණය සිදුවන්නේ දිනයට බොහෝ කලකට පස්සේ.

**නාහිමි :**

ඒ දේ සිද්ධ වෙන්නේ මෙහෙමයි. මං කලිනුත් කීවා සෑම කෙනෙක්ම මෙලොව බිහිවෙන්නේ පෙර කර්මයක් නිසා කියලා. ඒක උප්පත්ති කර්මයයි. ඒ උප්පති කර්මයේම ඔහුගේ මරණයත් සටහන් වෙලා තිබෙනවා. **උත්පත්ති කර්මය අනුව මේ භව ගමන සිදුවෙනවා.**

**හැබැයි නාඩි වාක්‍යයෙන් කියලා දෙනවා උප්පත්ති කර්මය වෙනස් කර ගන්න හැටි. ඒ අනුව ඕනෑම කෙනෙකුට**



Scanned by TapScanner

**තමන්ගේ උප්පත්ති කර්මය අනුව ලැබිල තියෙන ජීවිතය වෙනස් කර ගන්න පුලුවන්.**

නාඩි වාක්‍ය මාර්ග දෙකක් කියනවා. ඔබ යහපත් විදිහට ජීවිතය ගත කළොත් ඔබට මේ මේ ප්‍රතිඵල ලැබෙනවා. ඔබ ජීවිතය වැරදි අන්දමට ගත කළොත් ඔබට මේ ආත්මේදීම එහි ඵල විපාක භුක්ති විඳින්න වෙනවා.

**තෝරා ගැනීම තිබෙන්නේ තමන් අතෙයි කියලා.**

මරණය පිළිබඳවත් එහෙමයි. දැන් උදාහරණයක් වශයෙන් මා පිළිබඳව හැම නාඩි වාක්‍යකම කියලා තියෙන්නේ අවුරුදු 80 දක්වා විතරයි. ප්‍රශ්න කිරීම්වලින් දැන ගන්න ලැබුණා යෝගී භාවනා කිරීමෙන් දීර්ඝායුෂ ලබන්න පුලුවන් කියලා. **දැන් මට වයස අවුරුදු 93 යි. අවුරුදු 13 මං වැඩිපුර ජීවත්වෙනවා. තවත් සිද්ධියක් මං කියන්නං.**

මගේ නංගිගේ මරණය සිද්ධ වුණෝ නාඩි වාක්‍යවල කියලා තිබුණ දිනේටම, ඒ වෙලාවටම. මේ කරුණ මට කීවේ රටේ මහත්තයා. ඒ කියන්නේ අපේ නංගිගේ ස්වාමි පුරුෂයා. නංගි වෙනුවෙන් කළ යුතුව තිබූ පූජා විධි නිසි අයුරින් කෙරුවේ නෑ. ඒ පුද පූජාවන් වත් පිළිවෙත් කලා නං ඇයට දීර්ඝායුෂ විඳින්න තිබුණා කියලා මට අදත් හිතෙනවා.

තවත් සිද්ධියක් මට සිහිවෙනවා ඉන්දියාවේ මහ කොමසාරිස් වෙලා හිටිය ඩී.බී.ජයතිලක මහත්තයා නාඩි වාක්‍ය ගැන දැඩිව විශ්වාස කළ කෙනෙක්.

එතුමාගේ නාඩි වාක්‍යවල කියලා තිබිල තියෙනවා කිසියම් වයසකදී කාලයකදී අසනීප වෙනවා. විදේශගතව සිටියොත් ඒ අසනීපයෙන්ම මිය යනවා. තමන්ගේ මව් රටට ගියොත් මරණයෙන් ගැලවෙන්න පුලුවන් කියලා. ඒ අනුව



Scanned by TapScanner

එතුමා වහාම ගුවන් මගින් ලංකාවට ඒමට පිටත් වෙලා තියෙනවා.

එහෙත් ඒ මහතාට මව්බිමට ඒමට වාසනාව අහිමි වුණා. නාඩි වාක්‍යයේ සඳහන් පරිදිම ගුවන් යානයේදී උන්නැහේ අභාවප්‍රාප්ත වුණා. මුන්නැහේ මගෙන් ඇහැව්වෙ සමහරුන්ගේ මරණය නාඩි වාක්‍යවල කියූ දිනයට වේලාවටම සිදුවෙනවා. සමහරුන්ගේ එහෙම සිද්ධ වෙන්නේ නෑ කියලා. එහෙම වෙන්නේ කොහොමද කියන එක නේද ප්‍රශ්නය.

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමීනි.

**නාහිමි :**

ඒක සිද්ධ වෙන්නේ මෙහෙමයි. මං මීට කලිනුත් කීවා අපි මේ භවයේ උප්පත්තිය ලබල තියෙන්නේ පෙර භවයක කර්මයක් මුල් කරගෙන කියලා. **එහෙම උප්පත්තිය ලබපු කෙනෙක්ගේ මරණයත්, ඒ සමඟම රැගෙන එනවා.**

එම පුද්ගලයා පව් පිං දෙකෙන්ම වැළකිලා මේ භවයේ ජීවත් වුණොත් ඒ තැනැත්තා ගෙනා ආයුෂ අවසන් කරලා නියම දිනේට දිවංගත වෙනවා.

**තවත් සමහරු මේ භවයේ උත්පත්තිය ලබල සත්ව ඝාතන කරමින් මසුන්, කුකුළන්, හරකුන් වැනි සතුන් ඝාතනය කරලා ජීවත් වුණොත් ඒ තැනැත්තා තමන්ට කර්ම බලයෙන් ගෙන ආ ආයුෂයට කලින් මියැදෙනවා.**

**තවත් සමහරු මේ භවයේ දැන හෝ නොදැන පිංකම් කරනවා. සතුන්ට අභයදාන දෙනවා. ඒ පිංකම් වලට දායක**

**වෙනවා. අඩුම තරමින් සතෙක් නිදහස් වෙන තැනක ඉඳලා ඒ පිංකම කරන මොහොතේ සාධුකාර දෙනවා.**

ඒ තැනැත්තාගේ ආයුෂ දීර්ඝ වෙනවා. ලෙඩ දුක් සුව වෙනවා.

එම නිසා සතුන්, කුරුල්ලන් වැනි මරණයට කැපවුනු සතුන් නිදහස් කළොත් එය මහත් පිංකමක් වෙනවා.උප්පත්තියේ දී ලැබුණු අකුසල කර්මයන් ප්‍රහීන වෙනවා. එවැනි පිංකමක් තමන්ට තනියම කරන්ඩ බැරි නං මුදලින් පුංචි ආධාරයක් කරලා සිත සනසා ගත්තොත් ඒකත් මේ භව ගමනේ සැපවත් වීමට හේතුවෙනවා, ඉදිරි භව ගමන යහපත් වෙන්නත් හේතු වෙනවා.

බොහෝ දෙනෙකුට අකල් මරණය සිදුවීමට හේතුවන්නේ පෙර භවයකදී සත්ව ඝාතනය කළ නිසා ඒවායේ ප්‍රතිඵල හේතුවෙන් මේ භවයේ අකාලයේ මිය යනවා.

**එම නිසා දීර්ඝායුෂ ලබන්න කැමැති ඇත්තෝ සත්ව ඝාතනයෙන් මිදී, සත්ව හිංසාවෙන් මිදී මරණයට කැපවෙලා ඉන්න හරක්, එළුවන්, කුකුලන් වැනි සත්වයින් ඉන් මුදවා ජීවිත දානය දීම, අභය දානය ලබාදීම මහත් ඵල මහා පිංකමක්. ඉන් මේ භවයේදී දීර්ඝායුෂත්, මතු භවයේ දීර්ඝායුෂත් ලැබෙනවා.**

මරණය පිළිබඳව ඍෂිවරුන්ට විතරක් නෙවෙයි ප්‍රකාශ කිරීමේ ශක්තිය තිබුණේ. **අපේ ගෞතම බුදුන් වහන්සේත් හුඟක් අවස්ථාවල තමන්ගේ විශිෂ්ඨ ඥානය තුළින් මනුස්සයන්ගේ මරණය සිදුවන අවස්ථාවන් දුටුවා.**

මට්ටකුණ්ඩලී කතාව එක අවස්ථාවක්. ඒ වගේ අවස්ථාවන් රාශියක්ම තියෙනවා. තවත් අවස්ථාවක බුදුන්වහන්සේ පිඬු සිඟා වඩින කොට එක බමුණෙක් මට

ඒ බමුණාගේ නම මේ මොහොතේ කල්පනාවට එන්නේ නෑ. බුදුන් වහන්සේ පසු පසින් ඇවිදින් ධර්මය දේශනා කරන ලෙස බල කරමින් උන්වහන්සේ පසු පසින් ආවා.

බුදුන් වහන්සේ දිවැසින් මේ තැනැත්තා දිහා බැලුවා. ඒ තැනැත්තාගේ ජීවිතය තව ස්වල්ප වේලාවකින් අහිමි වෙන බව දුටුව බුදුන් වහන්සේ පිඬු සිඟන අවස්ථාවේම දහම් පදයක් දේශනා කෙරුවා.

ඒ දහම් පදය අසා ප්‍රීතියෙන් දිව යන කොට පාරේ අයිනේ හිටිය ගොනෙක් මේ බමුණාට ඇනලා ඒ තැනැත්තා මරණයට පත්වුණා. ඒ තැනැත්තාට අනිත්‍ය මෙනෙහි වුණා. ඒ මොහොතේම බමුණා රහත් වුණා.

මේ වගේ බුදුන් වහන්සේ විතරක් නෙවෙයි, මහ රහතුන් වහන්සේලා පිළිබඳවත් විස්තර තියෙනවා. බොහෝ මහ රහතන් වහන්සේලා පිරිනිවන් පෑමට පළමු බුදුන් වහන්සේ දැක වැඳ පුදාගෙන පිරිනිවන් පෑමට තම ගම් පළාත්වලට වැඩියා.

සැරියුත් හාමුදුරුවොත් මේ විදිහට පිරිනිවන් පෑමට කලින් තමන්ගේ මව වන සාරි බැමිණිය අවිද්‍යාවෙන් මුදවාගෙන පිරිනිවන් පෑමට ගමට වැඩියා. තම මව අවිද්‍යාවෙන් මුදවා ගැනීමෙන් පස්සේ තමයි උන්වහන්සේ පිරිනිවන් පෑවේ.

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමීනි, සමාවෙන්න මේ අවස්ථාවේම මේ ප්‍රශ්නය අහන එක ගැන. පුද පූජා පැවැත්වීමෙන්, සුවපත් වුණ අවස්ථා එහෙම තියෙනවද?

**නාහිමි :**

මේ සිද්ධියත් වුණේ මගේ ඥාතියෙකුට. ඒ තැනැත්තා බොහොම දුප්පත් කෙනෙක්. රස්සාවට කෙරුවේ ඇඳුම් මැසීම, ටේලර් කෙනෙක්. මේ තැනැත්තාගේ වයස අමතකයි හිටි හැටියේම තුනටියෙන් පහළ අප්‍රාණික වුණා. දන්න කියන සිංහල,ඉංග්‍රීසි බෙහෙත් හේත් කළා. කිසිම සුවයක් ලැබුණේ නැහැ.

දවසක් මම ඉන්දියාවේ යන්න සූදානම් වෙලා ඉන්න කොට, පවුලේ කෙනෙක් මගෙන් ඉල්ලීමක් කළා, ඉන්දියාවේ මං දන්න සාස්තර කියන්නන්ගෙන් අහලා, කළයුතු දෑ පිළිබඳ අහගෙන එන්න කියලා.

ඒ අය මේ නාඩි වාක්‍ය ක්‍රමය ගැන දන්නේ නැහැ. ඒ මනුස්සයා ගැන අනුකම්පාවෙන් නාඩි වාක්‍යවල ප්‍රශ්න කාණ්ඩයෙන්,මම විමසීමක් කළා.පිළිතුරට ආවේ මෙහෙමයි.

දැනට මේ පුද්ගලයා කර්මජ රෝගයකින් ඔත්පල වෙලා යහන් ගත වෙලා ඉන්නවා.කිසිම වෛද්‍ය ප්‍රතිකර්මයක් කරලා ඵලක් නැහැ. කර්මජ රෝගයට අදාළ පුද පූජා කිරීමෙන් සුව වෙනවා කියලා.

**ප්‍රශ්නය :**

ස්වාමීනි, කර්මජ රෝගයට හේතුවත් නාඩි වාක්‍යයේ කියලා තිබුණද ස්වාමීනි.?

**නාහිමි :**

හැම කෙනෙකුගේම නාඩි වාක්‍ය කියවන කොට ඔහුට හෝ ඇයට බල පෑ පෙර භවයේ කර්මය පැහැදිලි කරලා දෙනවා. මේ තැනැත්තා ගැන විස්තර කළේ මෙහෙමයි.



Scanned by TapScanner

දැනට යහන් ගතව සිටින රෝගියා මීට පෙර භවයකදී අශ්ව වෙළෙන්දෙක් වශයෙන් මහා ධනයක් උපයාගෙන තිබෙනවා.ධන ලෝභයෙන් මේ තැනැත්තා අශ්වයින්ට හරි හැටි කෑම බීම දුන්නේ නැහැ. ඒ හේතුවෙන් බොහෝ අශ්වයින් කෘෂ වුනා.ඇතැම් අශ්වයින් ඒ හේතුවෙන් මැරිලා තියෙනවා. අශ්වයින් බලා ගන්න සේවකයින්ට නිසි පඩි නඩි නොදී ඔවුන් මහත් දුකින් ජීවිත ගෙව්වා. ඔවුන් ආහාර හිඟ නිසා කෘෂ වුණා.

ඒ හේතුව නිසා ඔහු මේ භවයේදී ඔහුගේ කොන්දෙන් පහළ පණ නැති වෙනවා.දුප්පත් වෙලා ඉපදිලා, අන් අයගේ වස්ත්‍ර අතපත ගෑමට සිද්ධ වෙනවා.


මං උපදෙස් දුන්නා පන්සලේ බෝධීන් වහන්සේට පූජා කරන්න කියලා

**ප්‍රශ්නය :**

ස්වාමීනි, ප්‍රති කර්මයක් කීවද ස්වාමීනි?

**නාහිමි :**

හැම නාඩි වාක්‍යයේදීම පෙර කර්මය පැහැදිලි කරලා, මේ භවයේදී අනුගමනය කළ යුතු පූජා විධි කියලා තියෙනවා.

පූජා විධි වශයෙන් කියලා තිබුණේ ඉතා සුළු ප්‍රතිකර්මයක්. දින හතක් සෙසු අයගේ ආධාරය, උපකාරය ඇතිව, තමුන්ගේ ආගමට අනුව පුද සත්කාර කරන තැනකට ගොස් හත්වරක් එම පූජනීය වස්තුව පැදකුණු කරලා, අවසාන පූජාව කරන සත්වන දිනයේදී සුවපත් වෙනවා කියලා.

ඒ පවුලේ අය මගෙන් ඇහැව්වා, ඒ පූජාව කරන විදිහ කොහොමද කියලා. ඒ අනුව මං උපදෙස් දුන්නා උදේ හවස පන්සලේ බෝධීන් වහන්සේට පුද පූජා කරලා, සත් වටක් දකුණු අත බෝධීන් වහන්සේ පැත්තට වෙන විදිහට පැදකුණු කරල බෝධි පූජාවක් කරන්න කියලා.ඒ

ඇත්තෝ ඒ විදිහට මහත් ගෞරවයෙන්, ශ්‍රාද්ධාවෙන් මේ බෝධි පූජාව කළා. ගමේ තරුණ පිරිස මේ රෝගීයාව බෝධි පූජාවට උස්ස ගෙන ගියා.

මහත්තයා පිළිගන්න එකක් නැහැ හත් වෙනි දවසේ අන්තිම බෝධි පූජාව කරලා, මේ රෝගියා දෙපයින් පන්සලට ආවා. මට වැඳ වැටුණා. මං සෙත් පිරිත් ටිකක් කියලා, පිරිත් පැන් ටිකක් දුන්නා. පිරිත් නූලකුත් බැන්දා. මේ මට ලැබුණු සැබෑ අත් දැකීමක්.

**ඕනෑම කෙනෙක් ඉමහත් ශ්‍රාද්ධාවෙන් බුදු පිළිමවලට ගරු සත්කාර කරනවා නම්, බෝධි පූජා කරනවා නම්, තමන්ට නොපෙනෙන අන්දමින් බලපාන අපල ග්‍රහ උපද්‍රව ආදිය අහෝසි වෙනවා.**

**ප්‍රශ්නය :**

හරි පුදුමයි ස්වාමීනි, විශ්වාස කරන්නත් අමාරුයි.

**නාහිමි:**



''විශ්වාස කළත්, නොකළත් ඒක තමයි ඇත්ත. මේ වගේ සිද්ධි බුදුන් වහන්සේගේ කාලයෙත් තිබුණා.



Scanned by TapScanner

**විශ්වාස කළත්, නොකළත් ඒක තමයි ඇත්ත.** මේ වගේ සිද්ධි බුදුන් වහන්සේගේ කාලයෙත් තිබුණා. මුන්නැහේ බුදුන් වහන්සේගේ, මහ රහතන් වහන්සේලාගේ දේශනා විශ්වාස කරනවාද?

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමීනි.

**නාහිමි :**

හොඳයි,මේ සිද්ධියත් ඒ වගේ අවස්ථාවක්. බුදුන් වහන්සේගේ කාලයේ මහ රහතන් වහන්සේලා, දහම් දෙසමින් ගම් දනව් සිසාර වඩිනවා.අනුරුද්ධ මහ රහතන් වහන්සේ, පන්සිය නමක් මහ රහතන් වහන්සේලා සමග ගම්දනව් සිසාරා තමන්ගේ උපන් ගමට, නෑදෑයින් වසන ගමට වැඩියා. නෑදෑයින් සියලුම දෙනා උන්වහන්සේ හමුවීමට පැමිණ වැඳ නමස්කාර කළා.

**ඒත් උන්වහන්සේගේ එකම නැගණිය රෝහිණි කුමරිය පැමිණියේ නැහැ.**

උන්වහන්සේ ඇහුවා කෝ නංගි කියලා. ඇයගේ මුළු ඇඟ පුරාම කුෂ්ඨ රෝගයක් වැළඳිලා,සැරව බේරෙනවා. ඇඳුම් අඳින්නත් බැහැ. දුහුල් ඇඳුම් විතරයි අඳින්නේ.ඒ ඇඳුම පිටින් තම සහෝදරියට මහ රහතන් වහන්සේ ඉදිරියට පැමිණිය නොහැකි බව ඔවුන් කීවා.

මහ රහතන් වහන්සේ පැහැදිලි කළා, වැඩමවා සිටින සියලුම භික්ෂූන් වහන්සේලා මහ රහතන් වහන්සේලා නිසා දුහුල් ඇඳුමකින් සැරසිලා වුනත් පැමිණ වන්දනා කොට පිං ලබාගන්නා ලෙසට.

ඒ අනුව රෝහිණි කුමරිය දුහුල් ඇඳුමින් සැරසිලා,



Scanned by TapScanner

මහ රහතුන්ට වන්දනා මාන කෙරුවා. මහ රහතන් වහන්සේ රෝහිණිගෙන් ඇසුවා මේ කර්මජ රෝගයෙන් සුවපත් වෙන්න කැමතිද කියලා. ඇය බොහෝ ආශාවෙන් කැමැත්ත පළ කළා.

එසේ නම් මහා සංඝයා වෙනුවෙන් දාන ශාලාවක් ඉදි කරලා, මහා සංඝයාට දානයක් පිරිනමන ලෙසට උපදෙස් දුන්නා. ඇය ඇසුවා, සැබවින්ම මට මුදල් නැහැ, මට මේ දේ තනියෙන් කරන්න බැහැ කියලා.

මහ රහතන් වහන්සේ කීවා, ඔබේ රන් ආභරණ විකුණලා, මුදල් සොයා ගන්න,නැදෑයින් ගොඩනැගිල්ල හැදීමට උදව් කරයි කියලා.ඒ අන්දමට රෝහිණි කුමරිය කටයුතු කළා.

ශාලාව සාදා ඉවර වෙන කොට ඇගේ කුෂ්ඨ රෝගය මුළුමණින්ම සුවපත් වුණා.

ඊට පසු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයාට දානයක් සූදානම් කළා.මේ දානයට බුදුන් වහන්සේට ද ආරාධනා කෙරුවා. බුදුන් වහන්සේ දානයට වැඩම කර, දානය දීමේ හේතුව විමසුවා. අනුරුද්ධ හිමියන් විසින් සියළුම විස්තර පැහැදිලි කරනු ලැබුවා.

බුදුන් වහන්සේ මේ කුෂ්ඨ රෝගයට හේතුව කුමක්දැයි කියා දැන ගන්න කැමතිදැයි පිරිසගෙන් ඇහුවා.

පිරිස පූර්ව කර්මය දැන ගන්න කැමැත්ත ප්‍රකාශ කළා.

බුදුන් වහන්සේ දේශනා කළා මීට පෙර භවයකදී රෝහිණී කුමරිය රජ කෙනෙකුගේ අග බිසව හැටියටයි ජීවත් වුණේ. රජතුමා තවත් හැඩරුව ඇති කාන්තාවක් අන්තඃපුරයට ගෙන ආවා. රජතුමාගේ ඇල්ම බැල්ම වැඩිපුරම අලුත ගෙනා රජ කුමරියට යොමු වුණා. අග

මෙහෙසිය මේ පිළිබඳ දැඩි නොසතුටින් සිටියේ.

දවසක් අග මෙහෙසිය කහඹිලියා යෙදූ වතුර ඇයට නෑමට ඉතා සුදුසු ඖෂධ ජලයක් ලෙස හඟවලා කහඹිලියා යෙදූ ජලය නෑමට සැලැස්සුවා. කහඹිලියා ජලය නිසා ඇගේ ඇඟ වණ වුණා.


තවත් දවසක කහඹිලියා යෙදූ යහනක ඇයට සැතපෙන්නට සැලැස්සුවා. ඒ නිසා ඇය අපමණ දුක් වින්දා.

මේ පාප කර්මය නිසා ඇය මේ භවයේදී මේ අයුරින් කුෂ්ඨ රෝගයකට භාජනය වුණා කියල. මේ දේශනාව කළේ බුදුන්වහන්සේ විසින්. පැමිණි සිටි මහ රහතන් වහන්සේලාත්, ජනතාවත්, මේ දේශනාව ඉතා ගෞරව සම්ප්‍රයුක්තව ශ්‍රවණය කළා.

**ප්‍රශ්නය :**

එහෙමයි ස්වාමීනි,

**නාහිමි :**



බුරුම සංගායනාවේ සභාපති අසුනේ වාඩි වූ විගස මගේ මතකයට ආවේ නාඩි වාක්‍යයේ කියා තිබූ මෙම සභාව නොවේද?

තවත් සිද්ධියක් මට මේ මොහොතේ මතක් වුණා. මම දවසක් කෞමාර නාඩියෙන් විස්තර විමසුවා. එක තැනක කියලා තිබුණා මම එක්තරා වයසක දී, මට වයස අමතකයි,

මහසභාවෙත්, මහ සභාවේ නායකකම අරගෙන කටයුතු කරනවා කියලා. 1955 බුරුම සංඝායනා සභාවේ මමත් සාමාජිකයෙකු ලෙස කටයුතු කළා.ලංකාවට ආපසු එන්න සූදානම් වෙනකොට සංඝායනා සභාවේ සභාපති ධුරය දැරූ මහා නා හිමියෝ අපවත් වුණා.

ඊට පස්සේ බුරුම රජය මට සංඝායනා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන්න කියල ආරාධනා කළා. ඒ අනුව මම එම ධර්ම සංඝයනා සභාවේ සභාපති ලෙස කටයුතු කළා.

**ඒ ආසනයේ වාඩි වුණ හැටියේම මට මතක් වුණේ අවුරුදු පහකට විතර කලින් නාඩි වාක්‍යයේ කියලා තිබු දේ සිද්ධ වුණා නේද කියලා.**

අවුරුදු ගාණකට කලින් (1951) මදුරාසියේ කෞමාර නාඩි වාක්‍ය ක්‍රමයෙන් විස්තර කියපු පණ්ඩිත තංගවේලු මහත්මයා කීවේ මේ සභාව ගැන නේද කියලා. එහි කියා තිබුණේ සංඝයා වහන්සේගේ සභාවේ නායකයා හැටියට කටයුතු කරනවා කියලයි.


මේසිද්ධිය නිසා නාඩි වාක්‍ය පිළිබඳව මගේ විශ්වාසය තවත් වැඩි වුණා.

මේ ගැන හිතන කොට මට හිතුනා මීට අවුරුදු පන්දාහකට හය දාහකට පෙර සිටි තුන්කල් දක්නා බල සම්පන්න ඍෂිවරුන් වහන්සේලා තමයි නාඩි වාක්‍ය ප්‍රකාශ කරලා තියෙන්නේ කියලා.

තවත් කාරණයක් මට කල්පනාවට එනවා. කෙනෙකුගේ

උප්පත්ති කර්මය බලවත් නම් ඒ තැනැත්තාට දීර්ඝායුෂ ලැබෙනවා. මේ අන්දමට උප්පත්ති කර්ම බලවත් අය උපත ලැබුවට පස්සේ භාවනා යෝගී ක්‍රම මාර්ගයෙන් දීර්ඝායුෂ භුක්ති විඳිනවා.

අර ඇමරිකන් තරුණයා සඳහන් කළබද්රිනාත් ප්‍රදේශයේ තමන්ට භාවනා උපදෙස් දෙන පව්හරිබාබාත් එවැනි කෙනෙක් විය යුතුයි කියල. "හර්මිට් ඔප් හිමාලයාස්" ( **HERMIT OF HEMALAYAS** ) පොතේ සඳහන් තායිලන්තයේ සිටින අවුරුදු හාරදාහක් වයසැති ඍෂිවරයාගේ කතාවත් ඇත්තක් විය යුතුයි. බුදුන් වහන්සේ පවා උන්වහන්සේගේ දේශනාවලදී දීර්ඝායුෂ විඳීම ගැන සඳහන් කරලා තියෙනවා. **උප්පත්ති කර්මය** බලවත් නම් ඒ ඇත්තං ඍද්ධි බල වැඩිමෙන් අවුරුදු කල්පයක් වුණත් ජීවත් වෙන්න පුලුවන් කියලා බුද්ධ දේශනාවල සඳහන් වෙනවා.



නා හිමියන් සමග සම්මුඛ සාකච්ඡාවක් පටිගත කල අවස්ථාවක්. මෙම ඡායාරූපයේ ප්‍රභාත් මානවසිංහ මහතාද ඒ මහතාගේ මෑණියන් වන මානවසිංහ මාතාවද, මෙම පොතේ සංස්කාරවරයාද වේ.

# සංස්කාරකගේ විශේෂ සටහනක්

මරණය පිළිබඳ මා ලද පෞද්ගලික විස්තරයක් මේ අවස්ථාවේ සටහන් කිරීම මැනවැයි හැඟේ. ලංකාවේ පළමු වරට නාඩි වාක්‍ය ප්‍රකාශ කරන ලද්දේ මහාලිංගම් නැමැත්තායි. මේ තැනැත්තා ප්‍රකාශ කළ පරිදි තමා ඩී.ඇස් සේනානායක, ඩඩ්ලි සේනානායක, ඇස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ආදී ප්‍රභූන් රැසකගේම නාඩි වාක්‍ය කියවා ඇත.

ඩී.එස්. සේනානායක මහතා සතුන් පිට යෑමෙන් අනතුරු සිදුවිය හැකි බවද ඉන් වැළකෙන ලෙසට අවවාද කල බවද ඔහු පැවසීය.

නිතරම රොස්මිඩ් පෙදෙසට ගිය මහාලිංගම් මහතා තමා බණ්ඩාරනායක පවුලේ කේන්ද්‍ර බැලූ අතර ඉන් ප්‍රබල කේන්ද්‍රය හිමිව තිබුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියට බවද තමා ඒ අවස්ථාවේ මේ බව බණ්ඩාරනායක මැතිණියට ද පැවසු බවද, එකී කේන්ද්‍රය අනුව චන්ද්‍රිකා දැරිය කවදා හෝ ලංකාවේ රජ වෙන බව තමා බණ්ඩාරනායක මැතිණියට පැවසු බවද ඔහු කීය.

මේ ප්‍රකාශය කරන විට බණ්ඩාරනායක මහත්මිය වයස අවුරුදු දොළහක් වූ දැරියක්ව සිටි බවද ඔහු පැවසීය. මෙකී සිදුවීම මා හා පවසන විට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය මහජන පක්ෂයේ නායිකාව වශයෙන් කටයුතු කරමින් සිටියාය.

මේ සියල්ල දත් ඔබ, ඔබගේ මරණය සිදුවන දිනය ගැන දන්නවාදැයි ඔහුගෙන් ඇසීමි. ඔහු පිළිතුරු දෙමින් කීවේ නාඩි වාක්‍යයට අනුව තමා අවුරුදු අසූහතරක් ආයුෂ භුක්ති විඳින බවත්, නියමිත දිනයේදී මියයන බවත්ය.



Scanned by TapScanner

එහෙත් ඊට පෙර ඉන්දියාවේ එක්තරා ගංගාවකින් ස්නානය කොට ඒ ආසන්නයේ ඇති කෝවිලට ගොස් ''ආයුර්හෝමම්'' පූජාව කළහොත් තවත් අවුරුදු ගණනාවක් දීර්ඝායුෂ ලබන බවයි.

තමා එම පූජාව කිරීමට තම ගමට යාමට අපේක්ෂා කරන බවත්, එහෙත් එසේ යාමට අවස්ථාව අහිමිව මෙරටදීම තමා මිය යන බවත් ඔහු කීය.ඊට වසර කීපයකට පසුව මට මහාලිංගම් මහතාගේ අභාවය පිළිබඳ ආරංචිය ලැබිණි. දේහය රේමන්ඩ් ආයතනයේ තැන්පත් කර තිබිණි.

එහිදී ඒ මහතාගේ දුවගෙන් සහ බෑණාගෙන් මරණය පිළිබඳව විමසීමි. ඔවුන් කියා සිටියේ මරණය සිදුවීමට සතියකට පෙර පූජා වත් පිළිවෙත් කිරීමට ඉන්දියාවට යාම සඳහා ගුවන් බලපත්‍ර සහ වීසා සූදානම් කර සිටි මුත් ඊට පෙර මරණය සිදුවූ බවයි.

මහාලිංගම් මහතාගේ දේහය ඉන්දියාවේ ඒ මහතාගේ ගමට ගෙන යාම සඳහා මෙරට ඔහුගෙන් සේවය ලබාගත් දේශපාලනඥයන් පමණක් නොව ධනවතුන් ද පෙරමුණ ගෙන කටයුතු කළ අතර ඉන් අනතුරුව ඒ මහතාගේ නාඩි වාක්‍ය අසා පුද පූජා කිරීම නොසලකා සිටි අය කඩිමුඩියේ තම පුද පුජාවත් පිළිවෙත් කළ බවට ආරංචි ද මා වෙත ලැබිණි.

(මහාලිංගම් මහතා ඇතැම් දෙනා සම්බන්ධයෙන් කළ විශ්මිත ප්‍රකාශන ඉසිවරුන් දුටු භව ගමන( 2 ) නම් වූ දෙවන ග්‍රන්ථයෙන් ඔබට කියවිය හැකිය.)

**ප්‍රශ්නය :**

ස්වාමීනි, ඔබ වහන්සේ නිතරම ප්‍රකාශ කරනවා දීර්ඝ

ආයුෂ විඳිමින් එනම් අවුරුදු දෙදාහක්වත් තුන්දාහක්වත් ආයුෂ විඳිමින් සෘෂිවරුන් නාඩි වාක්‍ය ප්‍රකාශ කළා කියලා. ඒ මීට අවුරුදු පන්දාහකට හයදාහකට ඉස්සර. ස්වාමීනි වර්තමානයේදිත් මේ විදිහට දීර්ඝායුෂ විඳින අය මේ ලෝකේ ඉන්නවාද?

මේ පිළිබඳ ඔබ වහන්සේට පෞද්ගලික අත්දැකීම් තියෙනවාද ස්වාමිනී?

**නාහිමි :**

හොඳයි, මම ඉන්දියාවට ගියේ ඉන්දියානු භාවනා ක්‍රම ඉගෙන ගන්න. සෘෂිකේෂි ආශ්‍රමයට. ආශ්‍රමයට වෙලා ඉන්න කොට විවිධ වයස්වල යෝගීන් මම දුටුවා. ඒ අයගේ වතගොත, වයස මම හෙව්වේ නැහැ.

මම තිරුවනමලේ අසපුවක භාවනා යෝගීව සිටිය රමණි මහා සෘෂිතුමා හමුවුණා. ඊට පස්සේ කංකල් ගමේ සිටිය ස්වාමි නාරායනන්ද යෝගියා යටතේ රාජයෝග භාවනා ක්‍රම ඇතුළු විවිධ ඉන්දියානු භාවනා ක්‍රම ඉගෙන ගත්තා. රමණි මහා සෘෂි හැර අනෙක් අය වයස් ගත අය නෙවෙයි.

මට මේ වෙලාවේ තවත් සිද්ධියක් මතක් වුණා. බරණැස් නුවර ඉසිපතනේ පිහිටි මහබෝධි සමාගමේ මම නතර වෙලා ඉන්න කොට වෙච්ච සිද්ධියක්. දවසක් සුදු තරුණ මහත්මයෙක් නවාතැන් බලාපොරොත්තුවෙන් මහාබෝධි සමාගමට ආවා.

මං ඒ ඇත්තන්ගෙන් ඇහුවා කොහේ ඉඳල ද එන්නේ කියලා. උන්නැහේ කීවා හිමාලයේ ගල් ගුහාවක ඉඳගෙන

භාවනා ක්‍රම ඉගෙන ගන්නවා කියලා. කා යටතේ ද පුහුණුව ලබන්නේ කියලා මං ඇහැව්වා. එතුමා මට ෆොටෝ එකක් පෙන්නුවා.

ඒ ෆොටෝ එක තරුණ පෙනුමක් තියෙන අයෙක්ගේ. මං කීවා හරි තරුණ ලාබාල කෙනෙක් නේද කියලා.

**එතකොට උන්නැහේ දුන්න උත්තරේ තමයි මෙයා අවුරුදු දෙදාහක් වයසයි කියලා. තුන්කල් දක්නා මහා බල සම්පන්න යෝගියෙක්.**

මම ඇහැව්වා මෙතරම් වයස් ගත අය තවත් මේ පළාතේ ඉන්නවද කියලා. **ඒ මහත්තයා කීවා හිමාලයේ ගල් ගුහාවල අවුරුදු දෙසීය, තුන්සීය,හාරසීය, පන්සීය තරම් වයස අය භාවනා යෝගීව ඉන්නවා කියලා.**

මට තවත් කාරණයක් මතක් වුණා. ඇමරිකාවේ ඉන්න මහත්තයෙක් ෆොටෝ කොපි ගහපු පොතක් මට එව්වා. ඒ පොත ප්‍රකාශයට පත් කරලා තියෙන්නේ ඇමරිකාවේ. ප්‍රකාශයට පත් කරලා ඉතා කෙටි කාලයකින් පොත විකිණී අවසන් නිසා මෙසේ ෆොටෝ කොපි ගහලා එව්වා කියල. ඒ මහත්තයා ලියලා තිබුණා.ඒ පොතේ නම **(හර්මිට් ඔෆ් හිමාලයාස්)** (**HERMIT OF HEMALAYAS** ) කියලා.

**මේ පොතේ එක තැනක තිබුණා තායිලන්තයේ කඳුකර වන ප්‍රදේශයක අවුරුදු හාරදාහක් වයස් ගත ඍද්ධි සම්පන්න යෝගියෙක් ඉන්නවා. අවුරුද්දකට දිනයක් දෙකක් නගරය ආසන්න වනයට එනවා. එතකොට භාවනා යෝගීන් ගිහින් හමුවෙලා අවවාද උපදෙස් ලබා ගන්නවා කියලා.**

මේ අනුව අප්‍රකටව, අප්‍රසිද්ධියේ අවුරුදු දහස් ගණන් වයසැති අය ඉන්නවා කියන කතාව මං පිළි ගන්නවා.



Scanned by TapScanner

(මේ පොත මහනායක හිමියන් කියවමින් සිටියේ බලංගොඩ පිහිටි උන්වහන්සේගේ ආවාසයේදිය. එම අවස්ථාවේ මෙම පොතේ සංස්කාරකවරයා වන මම ද, රාජගිරිය, මාදින්නාගොඩ මා මිත්‍ර ආරිය බණ්ඩාර සමරකෝන් මහතා ද සිටි බව මතකයට නැගේ. )

**ප්‍රශ්නය :**

ස්වාමීන් වහන්ස මීට කලින් ඔබ වහන්සේ ප්‍රකාශ කර සිටියා විවිධ නාඩි ක්‍රම මගින් ඔබ වහන්සේ විස්තර සොයා බැලුවා කියලා. ස්වාමීනි කොහොමද මේවා ගොනු කරලා තියෙන්නේ.

**නාහිමි :**

මෙහෙමයි, මං **අගස්ති කෞෂික, කමලමුණි, කාකබුජන්දර** ආදී නාඩි වාක්‍ය කියවා ගත්තා.

මේ එක් එක් නාඩි වාක්‍ය ගොනු කරලා තියෙන්නේ එකම ක්‍රමයකට නෙවෙයි. සමහර නාඩි වාක්‍ය එක ගොනුවක් විදිහට දිගට ලියැවිලා තියෙනවා. ප්‍රකාශ වෙනවා. සමහර නාඩි වාක්‍ය කොටස් දොළහක්, දාසයක් ආදි වශයෙන් ගොණු වෙලා තියෙනවා.

මේ අන්දමට ගොනු වෙලා තියෙන්නේ අපේ කේන්ද්‍රයේ තියෙන රාශි චක්‍රය මුල්කර ගෙන. අපේ කේන්ද්‍ර කොපිවල රාශි චක්‍ර දොළහක් තියනවා. නාඩි වාක්‍යවල ගොනුව නැත්නම් කාරණාව වෙන් වෙන්නේ ඒ රාශි අනුවයි.

උදාහරණයක් විදිහට අගස්ති කෞෂික නාඩි ක්‍රමය අනුව කොටස් දොළහක් මූලික වශයෙනුත්, තවත් හතරක් අතිරේකවත් දැක්වෙනවා.

ඒ අනුව පළමු කාණ්ඩයේ සටහන් වෙන්නේ තමන්ගේ උත්පත්ති වේලාවේ පිහිටි ග්‍රහචාරය පිළිබඳව. එහි තමන්ගේ නම, බිරිඳගේ නම, දෙමව්පියන්ගේ නම්, භික්ෂුවක් නම් උපාධ්‍යානන් වහන්සේගේ නම, ගෝලයින්ගේ නම්, තමන්ගේ කේන්ද්‍ර සටහනසහ විස්තර දැක්වෙනවා.

මේ ආදී වශයෙන් දෙවැනි කොටසින් ධනය පිළිබඳ, තුන්වන කොටසින් සහෝදර සහෝදරියන් පිළිබඳවත්, හතරවන කොටසින් ඉඩම්, වාහන, නිවාස ආදිය පිළිබඳව යනාදී වශයෙන් විස්තර දැක්වෙනවා.

**ප්‍රශ්ණය :**

එහෙමයි ස්වාමිනී .සෙසු කොටුවල මොනවද සදහන් වෙන්නෙ.

**නාහිමි:**

හත්වන ඡේදයෙන් විවාහය,අටවන ඡේදයෙන් මරණය සිදුවන කාලය,වේලාව, ආයුෂ ආදිය පිළිබඳවත් දොළොස්වන පරිච්ඡේදයෙන් පුනර්භවය සහ විදේශ ගමන් පිළිබඳවත් කියැවෙනවා.

අතිරේක ඡේද තුනක් හෝ හතරක් තියනවා.මීට ඉහත උපන් භවයත්, ලෙඩ රෝගත්, ඊට ප්‍රතිකර්ම කළයුතු ක්‍රමය, පාරම්පරික රෝග හා ඊට පිළියම් ද ග්‍රහයන්ගේ වෙනස්වීම අනුව ඔබට මේ භවයේ ලැබෙන බලපෑම් ද සඳහන් වනවා.

එකී නාඩි වාක්‍ය ක්‍රමය අනුව නාඩි කියැවීමට යන තැනැත්තා අනිවාර්යයෙන්ම පළමු කාණ්ඩය ගත යුතු



Scanned by TapScanner

වෙනවා. ඉන් පසුවයි ඔබට අවශ්‍ය සෙසු කාණ්ඩ කියවා ගත හැකි වෙන්නේ.


**ප්‍රශ්නය :**

ස්වාමීනි, ඔබ වහන්සේ ඉන්දියාවේදී ලබාගත් නාඩි කියැවීම් හැරුණු විට ලංකාවේ ඉන්න නාඩි වාක්‍ය කියවන්නන් හමුවුනාද?

**නාහිමි :**

ලංකාවේ ඉන්න නාඩි වාක්‍ය ගැන මට ප්‍රභාත් මහත්තයාගෙනුත්, දයාරත්න මහත්තයාගෙනුත් දැන ගන්න ලැබුණා. ලංකාවේ හෝටලයක නැවතිලා මේ ඇත්තෝ නාඩි වාක්‍ය ප්‍රකාශ කරන බව ද කිව්වා.


ඒ වාක්‍ය ක්‍රමය **අගස්තියර් කෞෂික නාඩි ක්‍රමය** බව මම දැන ගත්තා.



ඒ අනුව මා හිතවත් නාඩි වාක්‍ය පිළිබඳ මගෙන් විටින් විට කරුණු විමසූ මෛත්‍රී මහත්මයාට දැන්වූවා. ඒ මහත්මයා ඊට අවශ්‍ය දින, වේලාවල් වෙන් කරලා මට දැන්නුවා.ඒත් ඒ දිනවල මට තද සෙම් අමාරුවක් තිබුණා. මේ හේතුවෙන් මට පැමිණිය නොහැකි බව ඒ මහත්මයාට මම දන්වලා යැව්වා. වෙනත් දිනයක් පසුවට පිළියෙළ කර ගැනීමට මම හිතාගෙන හිටියා.

ඊට පසුව කොළඹ වෙළෙඳ ව්‍යාපාරික මහත්මයෙක් වන සෙනෙවිරත්න මහතා මේ අවස්ථාව මට සලසලා දුන්නා. ඒ අනුව නාඩි කියවන්නා බත්තරමුල්ල, චිත්ත විවේකාශ්‍රමයට ආවා. එහි ප්‍රධානී ජයශංකර් මහත්මය ප්‍රභාත් මානවසිංහ මහත්මයාටත් නාඩි වාක්‍ය ගැන නිතර කරුණු විමසන මෛත්‍රී මහත්තයටත් දැන්නුවා.

පළමු කාණ්ඩය පමණක් එදා මා කියවා ගත්තා. එහි නම් සහ සියලු විස්තර ද කේන්ද්‍ර පිටපත ද සටහන් වෙලා තිබුණා. එය කැසට් පටයකට පටිගත කොට මට දුන්නා. නාඩි වාක්‍ය තුළින් මගේ විස්තර සොයා ගැනීමට විනාඩි 10 ක පමණ කාලයක් ගත වුණේ .



ප්‍රාතෙය්‍ය කාණ්ඩය හරි පුදුමයි. ඔබ වචනයක්වත් කතා නොකර ඔබේ ප්‍රශ්නය සිතේ දරාගෙන ඒ අයට ඔබේ කේන්ද්‍ර පිටපත දෙන්න ඕන.

**ප්‍රශ්නය :**

ස්වාමීනි, පෙර දී මා ඔබ වහන්සේගෙන් විමසා සිටියා ඇතැම් අය කියනවා මෙසේ ප්‍රශ්න කිරීමෙන් ඔවුන් අපගේ විස්තර ලබා ගන්නවා කියලා කියනවා කියලා. ඔබ වහන්සේට එහෙම සැකයක් ඇතිවුණේ නැද්ද ස්වාමීනි?

**නාහිමි :**

නාඩි වාක්‍ය ක්‍රමය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නැති අය එහෙම සැකයක් ඇති කර ගන්නවා.

**මමත් මුලදී එනම් පළමු නාඩි වාක්‍ය ඉන්දියාවේදී කියවා ගන්න කොට සැකයෙන් තමයි හිටියේ.** ඒ විෂය ගැන දීර්ඝව කරුණු සොයා බලන කොට නාඩි වාක්‍යයේ ඇති ගැඹුරු බව මට අවබෝධ වුණා.

**ලෝකයේ තියෙන අරුම පුදුම විශ්මිත තොරතුරු තියෙන පොත් සමූහයක් තමයි නාඩි වාක්‍ය කියන්නෙ කියල මට අවබෝධ වුනා.**

**ඒක විශ්මිතයි. මිනිස් සිත දියුණු කිරීමෙන් ලබාගත හැකි ශක්තිය නාඩි වාක්‍ය තුළින් මට පැහැදිලි වුණා.**

**ප්‍රශ්නය :**

ස්වාමීනි අවසරයි මේ ප්‍රශ්නය අහලා ඔබ වහන්සේ අසීරුතාවට පත් වෙනවා නම් පිළිතුරු නොදීම ගැන මම අහිතක් හිතෙන්නේ නැහැ. ඔබ වහන්සේ කැමති නම් පමණක්, ඔබ වහන්සේ දෙවැනි වරට ලංකාවේදී ලබාගත් අගස්ති කෞෂික නාඩි වාක්‍ය තුළින් ඔබවහන්සේට කියලා තිබුන දේවල් ශ්‍රී ලංකාවේ පමණක් නෙවෙයි, ලෝකය පුරා සිටින බෞද්ධ අබෞද්ධ අය දැන ගන්න කැමතියි ස්වාමීනි.



Scanned by TapScanner

**නාහිමි:**

මම මීට පෙරත් මුන්නැහේට කියලා ඇති මගෙන් ප්‍රශ්නයක් අහපු කෙනෙකුට පිළිතුරු නොදී මම කිසිම දිනෙක මඟ ඇරලා ගියේ නැහැ කියලා. මම කියන්නම්.

අගස්තිය කෞෂික නාඩි වාක්‍යයේ පළමු කොටස මට කියවන්න ලැබුණේ බත්තරමුල්ල, චිත්ත විවේකාශ්‍රමයේදී. ඉතිරි කොටස කියැවීම සඳහා මම ඉල්ලලා තිබුණු කාණ්ඩ ඇතුළත් තල්පත් මිටි අරගෙන ජයශංකර් මහත්මයාත්, මානවසිංහ මහත්තයාත් බලංගොඩ පන්සලට ආවා

**ප්‍රශ්නය :**

මොනවද නායක හාමුදුරුවනේ කියලා තිබුණේ?

**නාහිමි :**

ඒ නාඩි වාක්‍යයේ දීර්ඝ විස්තර කියැවුණා. මං හිතන්නේ පැය තුන හතරක් විස්තර කියෙව්වා.

**ඒ නාඩි වාක්‍යයේ තිබුණු හැටියට අපේ ගෞතම බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වන වෙලාවේ ඒ බෝධියට අධිගෘහිත දෙවියන් විදිහට ඉඳලා තියෙන්නේ මමයි.**

ඒ අනුව මම මාර පරාජය තන්හා, රතී, රඟා යන අයගේ ක්‍රියා කලාප දැකපු කෙනෙක්. ඒ වගේම ඒ කාලයේ සිදුවූ හැම දෙයක්ම මම දැකලා තියනවා.

**ප්‍රශ්නය:**

පුහුදුන් අප තුළ නොයෙකුත් ප්‍රශ්න ඇති වෙනව ස්වාමීනි. බුදුන් වහන්සේ, උන් වහන්සේ පරාජය කරන්න මාරයා



Scanned by TapScanner

කියලා කෙනෙක් ආව සිද්ධිය බුදුන් වහන්සේගේ සිතේ උපන් අදහසක්. තන්හා, රතී, රඟා යනු බුදුන් වහන්සේගේ සිතේ ඇතිවුනු ක්ලේශ සමූහයක් කියලා සමහරු කියනවා. සමාවෙලා මේ කරුණු පැහැදිලි කරනවද ස්වාමීනි.

**නාහිමි :**

මේක ඉතාම සරළ ප්‍රශ්නයක්නේ මහත්තයෝ. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත්වුණා කියලා කියන්නේ සියලු කෙළෙස් ප්‍රහීන කරලා ලබපු උත්තරීතර තත්ත්වයට.

එහෙම තත්ත්වයකට පත්වුණු අයෙක්ගේ සිතේ කෙලෙස් කවදාවත් පහළ වෙන්නේ නැහැ. බුදුහාමුදුරුවෝ උදාන වාක්‍යයකින්ම ඒ ප්‍රීතිය ප්‍රකාශ කරලා තියනවා.

**මාරයා කියන්නේ සැබෑම කෙනෙක්. තන්හා, රතී, රඟා කියන්නේ මාරයාගේ දූතිකාවන්.**

**ඒ නම් වලින් හැඳින්වෙන්නේ බුදුන් වහන්සේගේ සිතේ ඇතිවුණ රාග සිතිවිලි කියලා කෙනෙක් කියනවා නම් බුදුන් වහන්සේට, බුද්ධත්වයට කරන ලොකුම අගෞරවය, අපහාසය ඒකයි.**

බුදුන් වහන්සේසේගේ අරහං ගුණය නොපිළිගැනීමක්.

**මාරයා කියන්නේ සැබෑ කෙනෙක්. ඒ තැනැත්තා දිව්‍ය පුත්‍රයෙක්. අපේ බණ පොත්වල දක්වන්නේ මාර දිව්‍ය පුත්‍රයා කියලා.**

**ප්‍රශ්නය :**

පිංවත් ස්වාමීනි ජෝතිෂ්‍යය පිළිබඳ  මහ ජනයා තුළ විවිධ මති මතාන්තර තියෙනවා මේවා බොරු. පිළිගන්න බෑ කියල කියනව.ඒකට හේතුත් තියෙනවා.එක එක ජ්‍යෝතිෂවේදීන්



Scanned by TapScanner

එකම කරුණ ගැන විවිධ මත ප්‍රකාශ කරනවා. මේ ගැන ඔබ වහන්සේ මොනවද කියන්නේ ස්වාමීන් වහන්ස?

**නාහිමි:**

මහත්තයො, ඔය ප්‍රශ්නය බෝධිසත්වයන් වහන්සේ මෙලොව බිහි වුනු වේලාවෙත් තිබුනා.ඉන්දියාව කියන්නෙ ජ්‍යෝතිෂ්‍ය ගැන මහා දැනුම් සම්භාරයක් තියෙන රටක්. බෝධිසත්වයන් වහන්සේට නම් දෙන දවසේ මහා බලසම්පන්න බ්‍රාහ්මණ පඬිවරුන් හත් දෙනෙක් ආව. ඉන් හය දෙනෙක්ම මත දෙකක් ප්‍රකාශ කළා.මේ තැනැත්තා ගිහිගෙයි සිටියොත් අනිවාර්යයෙන්ම සක්විති රජ කෙනෙකු බවට පත් වෙනවා. ගිහිගෙය අතහැරල මහණ වුනොත් බුදු වෙනව කියල.

ඒ අතර හිටිය බාලම බ්‍රාහ්මණ පඬිවරයා වූ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා විතරයි කීවෙ මේ තැනැත්තා අනිවාර්යයෙන්ම මහණ වෙලා බුදු වෙනව කියල.ඉතින් වර්තමානයේ විවිධ මති මතාන්තර ඇති වෙන එක පුදුමයක් නොවෙයිනේ

**ප්‍රශ්නය :**

ඒ කාරණය තවදුරටත් පැහැදිලි කරන ලෙස මම නමස්කාර පූර්වකව ඉල්ලා සිටිනව ස්වාමිනී.

**නාහිමි :**

ඒ දේ සිදු වන්නෙ මෙහෙමයි. **ජ්‍යෝතිෂ්‍ය කියන විෂය මහ ගැඹුරු විෂයයක්. හරියට සප්ත මහා සාගරය වගේ ගැඹුරු අධ්‍යාත්මික විෂයයක්. පෙර සිටි මහා බලපම්පන්න ඍද්ධිලාභි ඍෂිවරුන් තමයි මේ ශාස්ත්‍රය ලෝකෙට බිහි කලේ.**

එක් එක් ජ්‍යෝතිෂ්‍යවේදීන් තම තමන් මේ ශාස්ත්‍ර ග්‍රහණය කරගත් ප්‍රමාණයට තමයි නිවැරදි පලාපල කියන්න පුළුවන්. හරියට කන් හැන්දක් තියෙන කෙනා මහ සයුරෙන් ඒ හැන්දේ ප්‍රමාණයට ජලය ගන්නවා. තේ හැන්දක් තියෙන කෙනා එම ප්‍රමාණයට මුහුදු වතුර ගන්නවා. පොල් කටු හැන්දක් තියෙන කෙනා ඒ ප්‍රමාණයටයි වතුර ගන්නේ. ඊට වඩා ලොකු භාජන තියෙන ඇත්තෝ තමන්ගෙ භාජනයේ ප්‍රමාණයට වතුර ගන්නවා.

ඒ අනුව තම තමන් ශිල්පය හැදෑරූ ප්‍රමාණයට තමයි අනාගතය පිළිබඳව පුරෝකථනය කරන්න පුළුවන් වෙන්නෙ.ඒ ඇත්තො කියන්නෙ බොරු නෙමෙයි. තමන් ශිල්පය ග්‍රහණය කරපු ප්‍රමාණයටයි විස්තර කියන්නෙ.

මුන්නැහේ ජෝතිෂ්‍යය ගැන උනන්දු වෙනව නම් හෙන්දිරික් හෙට්ටිගොඩ මහත්තය ලියල තියෙන ''ජීවිතය හා ග්‍රහයෝ'' කියන පොත කියවන්න.ඒ පොත ආධුනිකයින්ට, වෛද්‍යවරුන්ට, හාමුදුරුවරුන්ට ගුරුවරුන්ට හොඳ අත් පොතක්. සරලව යම් යම් කරුණු තේරුම් බේරුම් කරගන්න පුළුවන්

**ප්‍රශ්නය :**

පැහැදිලියි ස්වාමීනි නාඩි වාක්‍ය තුළින් ඔබවහන්සේගේ අනාගත සිදුවීම් එහෙමත් කියලා තිබුණාද ස්වාමීනි.?

**නාහිමි :**

කියලා තිබුණා. මං ඒවා එච්චර හිතේ රඳවා ගත්තේ නැහැ. එක සිද්ධියක් විතරක් මතකයි.

**නාඩි වාක්‍යයේ කියලා තිබුණා හිරු නැගෙන රටක රජ කෙනෙක් මෙතෙක් කිසිම කෙනෙකුට නොදුන් ගෞරව**



Scanned by TapScanner

**නාමයක් මට ප්‍රදානය කරනවා කියලා.**

**ප්‍රශ්නය :**


ඔබ වහන්සේට දැන් කොච්චර විතර ගෞරව නාම ලැබිලා තියෙනවද ස්වාමීනි.

**නාහිමි :**

ලංකාවේ හුඟක් විශ්වවිද්‍යාලවලින් මට ගෞරව සම්මාන ලැබිලා තියනවා. මට මතක නැහැ. මං ඒවා එච්චර හිතේ තියාගෙන නැහැ.

**සම්මාන ලැබෙන්න ලැබෙන්න අපේ මානය වැඩි වෙනවා. ඒවට ඇලිලා හිටියොත් අපේ භව ගමන දීර්ඝ වෙනවා.** මේ සම්මාන එකකටවත් මං බැඳිලා නැහැ. මට එක සම්මානයක් විතරක් මතකයි. ඒ බුරුමයෙන් ලැබුණු අග්ග මහා පණ්ඩිත කියන සම්මානය. ඒකත් ලැබුණේ බුරුමයේ තිබුණු ධර්ම සංඝායනාවෙන් පස්සේ. ඒත් මම ඔය එක සම්මානයකටවත් ඇලිලා, ගැලිලා නැහැ.

(කර්තෘ සටහන - උන්වහන්සේ හැම විටම අත්සන් කරන්නේ බලංගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවීර යනුවෙන් පමණකි.)



**ප්‍රශ්නය :**

**ඔබ වහන්සේට අනාගතයේ ලැබෙන්න යන සම්මාන ඔබ වහන්සේ බාර ගන්නවද ස්වාමීනි.**

**නාහිමි :**

ගෞරව, නම්බුනාම, සම්මාන, උපාධි මේ කිසිවක් මං අපේක්ෂා කරන දේවල් නෙවෙයි. ඒ ඇත්තන් මට ලබා දුන්න දේවල්. ඒ දේවල් මං පිළි නොගත්තොත් ඒ අයට කනගාටුවක්, කලකිරීමක් ඇති වෙනවා. ඒවගේ තත්ත්වයන්ට ඒ අය පත් වෙනවට මම අකමැතියි. එම නිසා මම එම සම්මානත් පිළිගන්නවා.

**ප්‍රශ්නය :**

ඔබ වහන්ස්ගේ මීළඟ භවය ගැන දැන ගැනීමට අපේ බෞද්ධ ජනතාව මහත් කැමැත්තක් දක්වනවා ස්වාමීනි. ඊට පෙර ස්වාමීනි ඔබ වහන්සේ ගෞතම බුදුන් වහන්සේ බුදුවන අවස්ථාවේ ඒ සිද්ධි සමූහය දුටු දෙවි කෙනෙක්. අද ඔබ වහන්සේ සාමාන්‍ය ලෝකයේ ගෞරව ආදරයට පත් බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමක්.

මගේ ප්‍රශ්නය ඔබ වහන්සේට කරන අගෞරවයක් නොවේවායි ප්‍රාර්ථනා කරනවා. බොහෝ දෙනෙක් හිතන්න පුළුවන් බුදුන් වහන්සේ බුදුවන අවස්ථාව දුටු, බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන අවස්ථා දුටු ඔබවහන්සේ ඇයි නිවන් සුවය අත්පත් කරගත්තේ නැත්තේ කියලා.

**නාහිමි :**


ඒක සාධාරණ ප්‍රශ්නයක් මහත්තයෝ. මම භව ගමනේ සැරි සරන්නේ එක්තරා ප්‍රාර්ථනාවක් ඉටුකර ගන්න.

බෞද්ධයින්ට තියෙනවා තමන්ගේ නිවන් මඟ සාක්ෂාත් කර ගන්නා ක්‍රම තුනක්. **බුදු, පසේ බුදු, මහ රහත්** කියලා.

මගේ ප්‍රාර්ථනාව වන්නේ **සම්මා සම්බුද්ධත්වයට පත්වෙලා නිවන් අවබෝධ කර ගැනීමයි.**



Scanned by TapScanner



නාඩි වාක්‍යය විශ්මිතයි, හරි පුදුමයි. මිනිස් සිත දියුණු කිරීමෙන් ලබාගත් දැනුම් සම්භාරයක් තමයි නාඩි වාක්‍ය කියන්නේ.

එහෙම ප්‍රාර්ථනාවක් තියෙන කෙනෙකුට ඒ තත්වයට පත් නොවී නිවන් අවබෝධ කර ගන්නේ නැහැ.

මට මේ වෙලාවේ කාරණයක් මතක් වෙනවා මේ වගේම ප්‍රශ්නයක් මං වරක් භාවනා පුහුණු වෙන අවස්ථාවක මතුවුණා. මං කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයේ භාවනා පුහුණුවකට ගියා. ඒ මහාෂි ෂියාඩෝ නායක හාමුදුරුවෝ ලංකාවට එවපු සුජාත හාමුදුරුවන් යටතේ උන්වහන්සේගෙන් මම බුරුම භාවනා ක්‍රම පිළිබඳ පුහුණුවත් ලබාගත්තා.

එක භාවනාවක් අවසානයේදී මට භාවනාව සමෘද්ධි වෙන්නෙම නැහැ. භාවනා කරන අවස්ථාවල ඇතිවන වෙනස්කම් මම හැමවිටම සුජාත හාමුදුරුවන්ට කිව්වා. උන්වහන්සේ අටුවා පෙළ පොත් ආදියෙන් ඒ පිළිබඳ විස්තර කරලා හේතු පහදලා දෙනවා.

අවසන් අවස්ථාවේදී මගෙන් ඇහැව්වා ඔබවහන්සේට මේ භාවනා සමෘද්ධි නොවෙන්න හේතුවක් තියෙන්න ඕනෑ.. ඔබ වහන්සේට මොකක් හරි ප්‍රාර්ථනාවක් තියෙනවද කියලා. **මම කිව්වා මම බුදු බව ප්‍රාර්ථනා කරනවා කියලා.**

එවිට උන්වහන්සේ කීවා එහෙම නම් මේ භාවනාව සමෘද්ධි වෙන්නේ නැහැ ඔබවහන්සේ මෙතෙක් වැඩූ භාවනාවම කරගෙන යන්න කියලා.

ඒ හේතුව නිසාම වෙන්න ඇති බුදුන් වහන්සේ බුදුවන අවස්ථාව දැකලා, බුදු බණ ඇහිලා, මට නිවන් අවබෝධ නොවුණේ කියලයි මම හිතන්නේ.

**ප්‍රශ්නය :**

ස්වාමීනි, මේ භව ගමනින් පසු ඔබ වහන්සේගේ ඉදිරි භව ගමන පිළිබඳවත්, බෞද්ධ ජනතාව දැන ගැනීමට මහත් ආශාවෙන් ඉන්නවා. ඒ පිළිබඳවත් මට පැහැදිලි කර ගන්න පුළුවන් ද පින්වත් ස්වාමීනි. ?

**නාහිමි :**

හොඳයි මම කියන්නම්. පුහුදුන් මිනිස්සු තමන්ගේ භව ගමන ගැන හිතන්නේ නැතුව අනිත් අයගේ වතගොත හොය හොයා භව ගමන නිකරුණේ නාස්ති කර ගන්නවා. ඒක ඒ ඇත්තන්ට තේරෙන්නේ නැහැ. ඉන් ඒ ඇත්තන්ට ඵලක් නැති බව.

**මගේ ඉදිරි භව ගමන සිද්ධ වෙන්නේ මෙහෙමයි. මං අපවත් වුණාම කෙටි කාලයකට බ්‍රහ්ම ලෝකයක උප්පත්තිය ලබනවා. ඊට පස්සේ මම නැවතත් ශ්‍රී ලංකාවේ උපදිනවා.**

ඒකට හේතුවක් තියෙනවා. දැනට අපේ රටේ තියෙන අධ්‍යාපනය ක්‍රමය හැඩ ගැහිලා තියෙන්නේ බටහිර

සංකල්පවලට අනුව. වස්තුව, ධනය එක් රැස් කර ගන්න මානසික තත්ත්වයක් තමයි ඇති වෙන්නේ.

පුරාණයේ මේ රටවල ඉන්දියාවේ පවා බෞද්ධ සංකල්ප පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. ඒ අධ්‍යාපන ක්‍රමය තුළින් අපේ රටේ වෙහෙර විහාර, වැව් අමුණු, කුඹුරු ආදියෙන් සමෘද්ධිමත් වුණු රටක්ව පැවතීයා.

අද තියෙන්නේ බටහිර සංකල්පවලට ගැතිවුණු අධ්‍යාපන ක්‍රමයක් නිසා ආත්මාර්ථකාමී,අනෙක් සමාජය ගැන නොසිතන පිරිසක් බිහිවෙලා තියෙනවා.

මේ බටහිර අධ්‍යාපන ක්‍රමය නිසා අපේ දරුවන්ගේ සිත් සතන් වෙනස් වෙලා. **ආදරය, කරුණාව, දයාව, මෛත්‍රිය ගිලිහිලා ගිහිල්ලා.**

මේ තත්ත්වය වෙනස් කරන්න පුළුවන් බෞද්ධ අධ්‍යාපන ක්‍රමයකට පමණයි. ඉන්දියාවේ නාලන්දා මහා විශ්වවිද්‍යාලයේ පැවතියේ බෞද්ධ අධ්‍යාපන ක්‍රමයයි. අපේ ඉතිහාසය බැලුවත් බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් තමයි මේ රටේ සංස්කෘතිය, ආගම, භාෂාව රැකුණේ.

එම නිසා මම නැවතත් මේ රටේ උප්පත්තිය ලබලා මේ රටේ අධ්‍යාපන ඇමැති වෙනවා. මගේ කාර්යභාරය නිම කරලා මේ රටේ නැවතත් බෞද්ධ අධ්‍යාපන ක්‍රමය පිහිටුවලා මම මේ භවයෙන් සමුගන්නවා.

ඉන්පසු මං දිගටම බ්‍රහ්ම ලෝකේ රැඳී ඉන්නවා මගේ ප්‍රාර්ථනාව ඉෂ්ඨ වෙන කාලය දක්වාම.

# සංස්කාරගේ සටහන

අගස්තියර් කෞෂික නාඩි වාක්‍ය තුලින් ප්‍රකාශ කළ පරිදිම (හිරු නැගෙන පැත්තේ රාජ්‍යයකින්) **බුරුම රජතුමා විසින් මෙතෙක් කිසිදු අයෙකුට ප්‍රදානය නොකල ගෞරව සම්මාන උපාධියක් උන්වහන්සේට පිරිනැමිනි.**

**ඒ <u>අභිධජ මහා රට්ඨ ගුරු</u> යන සම්මාන උපාධියයි.එය සංඝ රාජ පදවියකි.**

මෙම සම්මාන උපාධිය ලබා ගැනීම සඳහා බුරුමයට වඩින ලෙසට උන්වහන්සේට තුන්වරක්ම මෙරට බුරුම තානාපතිතුමා ආරාධනා කර ඇත .

අවසාන අවස්ථාවේ උන්වහන්සේ එකී ආරාධනාව පිළිගෙන බුරුමයට වැඩියේ එරට රජුගේ සහ ජනතාවගේ සිත් රිදවීම සුදුසු නොවන නිසා බව නා හිමියෝ පැවසූහ.

අති පූජ්‍ය අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රය මහ නාහිමියනගේ ප්‍රකාශනය ඇතුළත් වීඩියෝ කැසට් පටියක් (අද මෙන් එකල CD හෝ DVD තැටි තිබුනේ නැත)

මතු පරපුරේ දැන ගැනීම සඳහා සහ පර්යේෂණ කරන අයගේ යහපත සලකා ජාතික කෞතුකාගාරයට ද, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවටද බාර දීමට ප්‍රභාත් මානවසිංහ මහතා සමග කටයුතු කරමින් සිටි අතර මහ නාහිමියන්ගේ අපවත්වීම ද මානවසිංහ මහතා දිවංගතවීම ද සිදුවිය.

මහ නාහිමියන් අපවත් වූ අවස්ථාවේ කිසියම් රූපවාහිනී නාලිකාවක නිවේදිකාවක විසින් මානවසිංහ

මහතාගෙන් ඉල්ලාගෙන ගොස් ඇත.

තවත් කැසට් පටි දහ අටක්ම පුස් අල්ලා භාවිතයට ගත නොහැකි තත්වයක පැවැතිනි. මේ කැසට් පටි පිරිසිදු කර ගැනීමේ ක්‍රමවේදයක් තිබේ නම් නාහිමියන් පිළිබඳ තවත් වටිනා විස්තර ඔබට දැන ගැනීමට හැකිවන බව කරුණාවෙන් සටහන් කරමි.

## මහ නා හිමියන් ඉන්දියාවේදී පුරුදු පුහුණු කළ භාවනා ක්‍රමය

**මහ නා හිමියන් ඉන්දියාවේදී පුරුදු පුහුණු කළ භාවනා ක්‍රමය** උන්වහන්සේ විසින්ම කෙටියෙන් පොතක සටහන් කර තිබිනි. සාකච්ඡා විමසීම අතරතුර දී මෙකී පොතේ පිටපතක් මා වෙත බලංගොඩ දී ලබාදුන් අතර වැඩි දෙනෙකුට එය කියවීමට අවස්ථාව ලබාදීමට හැකි නම් මැනවයි උන්වහන්සේ පැවසූහ.

**ඒ අනුව උන්වහන්සේගේ ඉල්ලීම ඉටුකරනු වස් මේ සමග එකී භාවනා ක්‍රම සහ උන්වහන්සේගේ අත් අකුරින්ම ලියැවූ සටහන ද පරිවර්තනය කළ සියලු සටහන් දක්වා ඇත.**

සිංහලයට පරිවර්නතය කළේ නන්දා අයිරාංගනී රත්නායක මහත්මිය විසින් බව සිහිපත් කරනු කැමැත්තෙමි.

නා හිමියන් සමග කරන ලද සාකච්ඡාවන්ට අතිරේකව අවශ්‍ය කරුණු උන්වහන්සේ විසින් ප්‍රකාශයට පත් කරන ලද ලිපි ලේඛන ආශ්‍රයට ගන්නා ලෙසට **මට දෙන ලද වාචික අවසරය ද ගෞරව නමස්කාර පූර්වකව සිහිපත් කරමි.**

## භාවනා කිරීම

### 1) සුඛාසනයෙන් හෝ පද්මාසනයෙන් වාඩි වෙන්න.

ඔබත් බිත්තියත් අතර අඩියක් පමණ පරතරයක් තිබෙන පරිදි **උතුරු දෙසට** හැරී වාඩි වෙන්න. **රූපියලේ**



Scanned by TapScanner

**කාසියක ප්‍රමාණය ඇති කලු පැහැති තිතක් (ලපයක්)** සාදා එය ඔබේ ඇසට හරි කෙලින් සිටින ලෙස බිත්තියේ එල්ලන්න.

හරි කෙලින් වාඩි වී කලු ලපය දෙස උවමනාවෙන් බලන්න. ඇස වෙහෙසවන පරිදි නොව සාමාන්‍යයෙන් බලන ලෙස ඇස පිය නොහෙලා බලන්න. කඳුළු ගැලුවොත් කඳුළු ඉවත් වන ලෙස ඇස පිය හෙලා නැවත කලු ලපය දෙස බැලීම අරඹන්න. මේ ලෙස විනාඩි පහළොවක් විස්සක්අතර කාලයක් දිනපතාම කරන්න.

විනාඩි පහළොවක් විස්සක් දක්වා වේලාවක් කඳුළු නොසලා ඇසිපිය නොහෙලා එක දිගට බලා සිටිය හැකි වුවහොත් හෝ ඔබේ ඇස් දෙක හා කලු ලපය අතර නොකැඩුනු ආලෝක ධාරාවක් ඇති බව ඔබට පැහැදිලි වුවහොත් හෝ

කලු ලපය මත ඇති ආලෝකය ය නිසල වුවහොත් හෝ ඔබේ ව්‍යායාමය සම්පූර්ණ වී ඇති බව ඔබට පිළිගත හැකිය.

## <u>මූලික ව්‍යායාමය</u>

මහපටඟිල්ලෙන් දකුණු නාස් පුඩුව වසන්න. වම් නාස් පුඩුවෙන් හුස්ම ගන්න. වාතය ඇතුළත නොරඳවා ගෙන එක් වරම දකුණු නාස් පුඩුවෙන් පිට කරන්න . නැවත වම් නාස් පුඩුවෙන් හුස්ම ගෙන එය දකුණු නාස් පුඩුවෙන් පිට කරන්න. මේ ලෙස හත් වරක් වම් නාස් පුඩුවෙන් හුස්ම ගෙන ඇතුළත රඳවා නොගෙන දකුණු නාස් පුඩුවෙන් හුස්ම පිට කරන්න.

මෙය සෙමින් ක්‍රම ක්‍රමයෙන් කරන්න. ඉක්මණින් නොකරන්න. ඔබට හැකි පමණ මේ ව්‍යායාමය කරන්න. එහෙත් අපහසුතාවයෙන් නොකරන්න. ඔබට අපහසුතාවයක් නොදැනේ නම් මේ ව්‍යායාමය 28 වතාවක් දක්වා (ආශ්වාස 14, ප්‍රශ්වාස 14)දක්වා වැඩි කර ගත හැකිය. මේ ව්‍යායාමය කරද්දී හුස්ම ඇතුළත රඳවා නොගත යුතුය. මේ ව්‍යායාමය අඩුම වශයෙන් දිනකට 3 හෝ 4 වතාවක් ආහාර ගත් විගස හැර ඕනෑම වේලාවක කළ හැකිය. හත්තයෝග ප්‍රදීපිකාවේ මේ ව්‍යායාමය භාෂ්රික යයි නම් කර ඇත. මේ ව්‍යායාමය සතියක් කරන්න.

## 2) දැන් ප්‍රාණයාමය ආරම්භ කරන්න.

ප්‍රාණයාමය කළ යුත්තේ අලුයම් වේලෙහි හා හිරු බැස යන සවස් භාගයේදීය.

## ව්‍යායාමය

මෙම ව්‍යායාමය කොටස් තුනකින් සමන්විතය. හුස්ම ගැනීම, රඳවා ගැනීම හා හුස්ම හෙලීම යනුවෙනි. දකුණු නාස් පුඩුව මහපටඟිල්ලෙන් වසා ගන්න. ඔබේ පෙනහලු වාතයෙන් පිරෙන තුරු වම් නාස් පුඩුවෙන් ඉතා සෙමින් හුස්ම ඇතුළට ගන්න. මේ ලෙස තත්පර පහක් හුස්ම ඇතුළට ගෙන ඉන්පසුව තත්පර දහයක් හුස්ම ඇතුළත රඳවා ගන්න.

මෙසේ කිරීමෙන් තත්පර පහක් ඇතුළත රඳවා ගැනීමත් තත්පර පහක් පිටත හෙලීමත් සිදුවේ. මෙය ඔබේ ව්‍යායාමයේ පළමු අවධියයි. ඔබ ආශ්වාස කරන විටත්,

ප්‍රාශ්වාස කරන විටත් ''ඕම්'' ශබ්දය ඒ තුළින් නිපදවීම ගැන සිතමින් මෙය කරන්න. ඔබ තුළින් ''ඕම්'' ශබ්දය නිකුත් වේ දැයි සොයා බැලීමට උත්සාහ කරන්න. ඔබේ සිත හැකිතාක් දුරට එම ශබ්දය කෙරෙහිම රඳවා තබා ගැනීමට උත්සාහ කරන්න. තරමක පුහුණු වීමකින් පසුව ඔබට පළමු අවධිය සම්පූර්ණ කළ හැකි වේ. ඉන් පසුව දෙවන අවස්ථාවට යාමට උත්සාහ කරන්න.

## 3) දෙවන අවධිය

හුස්ම ගැනීම, රඳවා ගැනීම, හුස්ම හෙලීම සඳහා ගත කරන කාලය වැඩි කරන්න. හුස්ම ගැනීමට තත්පර හතේ සිට දහය දක්වා කාලයක් ගත කරන්න. ඇතුළත රඳවා ගැනීමට තත්පර පහලොවක් පමණ ද හුස්ම හෙලීමට තත්පර හතේ සිට දහය දක්වා කාලයක් ද ගත කරන්න. කිසිම විටෙක ඉක්මන් නොවන්න. ක්‍රම ක්‍රමයෙන් කාලය වැඩි කරන්න. සති දෙකක පමණ කාලයකදී ඔබට මේ අවස්ථාවන් සම්පූර්ණ කර ගත හැකි වනු ඇත. ''ඕම්'' ශබ්දය කෙරෙහි සිත සමාධි ගත කිරීම (රඳවා තබා ගැනීම) ප්‍රාණයාම ව්‍යායාම්වල සෑම අවධියකදීම අවශ්‍යය.

## 4) තෙවන අවධිය

ක්‍රමික පුහුණුවීම් මගින් අවශ්‍ය කාලය වැඩි කර ගැනීමේ යෙදෙන්න. ඔබට තත්පර දහයේ සිට තත්පර පහලොවක් අතර කාලයක් තුළ දී හුස්ම ගත හැකි නම් තත්පර පහලොවෙ සිට විස්ස අතර කාලයක් හුස්ම රඳවා ගත හැකි නම් ඔබ තෙවන අවධිය ද සම්පූර්ණ කළ බව සැලකිය හැකිය. දෙවන අවධිය සම්පූර්ණ කර සතියකින්



Scanned by TapScanner

හෝ බොහෝවිට සති දෙකක් තුළ දී ඔබට තෙවන අවධිය සම්පූර්ණ කළ හැකි වෙයි. මේ අවධියේ ඔබේ නහරවල යම් සෙලවීමක් ඔබට දැනෙනු ඇත. එහෙත් නොනවත්වාම මේ ව්‍යායාමයේ යෙදෙන්න.

## 5) සිව්වන අවධිය

හුස්ම ගැනීමට, රඳවා ගැනීමට, හෙලීමට ගත කරන කාලය තවදුරටත් වැඩි කරන්න. හුස්ම ගැනීමට තත්පර තිහක කාලයක් ද රඳවා ගැනීමට විනාඩි එකක (තත්පර හැටක) කාලයක් ද හුස්ම හෙලීමට තත්පර තිහ දක්වා කාලයක් ද ගත කරන්න. මෙවැනි ප්‍රාණයාමයක් කිරීමට විනාඩි දෙකක පමණ කාලයක් ගත වේ. ඔබට හුස්ම ගැනීමට තත්පර තිහකුත් රඳවා ගැනීමට විනාඩි එකකුත් හෙලීමට තත්පර තිහකුත් ගත කළ හැකි වූ විට ඔබ මේ අවධියත් සම්පූර්ණ කළ බව සැලකිය හැකිය.

ඔබ මේ සියලු අවධි ඔබේ ස්ථිර හා විධිමත් පුහුණුවීම් මගින් සම්පූර්ණ කළවිට ඔබට ඔබ තුළම පුදුම සහගත වෙනස්වීමක් දක්නට ලැබෙනු ඇත. **ඔබේ මුහුණ පැහැපත් වනු ඇත. ඔබේ චරිත ස්වභාවයේ ආකර්ෂණ ශක්තියක් ඇතිවනු ඇත. ඔබේ කට හඬේ අනුන් වසඟ කර ගැනීමේ ශක්තියක් ඇති වනු ඇත.**

**ඔබේ දෙනෙතෙහි ආකර්ෂණ ශක්තියක් දිස්වනු ඇත. මිනිසුන් ඔබ කෙරෙහි වසඟ වනු ඇත. දැන් ඔබට අන් අය මෝහනය කළ හැකි වනු ඇත. ලෙඩ රෝග සුව කිරීමේ කලාව (Art of healing) ඔබට ප්‍රගුණ කළ හැකි වනු ඇත.**

මේ ව්‍යායාම් කරන අතරතුර ඔබේ ආහාර පුරුදු ගැන



Scanned by TapScanner

සැලකිලිමත් විය යුතුය. කිරි මෝරු (Butter - Milk) සහ පළතුරු වැඩි වශයෙන් ගත යුතුය. ගම්මිරිස්, තෙල් කෑම, මස්, ඇඹුල් වර්ග වලින් වැළකිය යුතුය. හැකිතාක් දුරට බ්‍රහ්මචාරීව විසිය යුතුය.

## උසස් ව්‍යායාම

### පළමු වන ව්‍යායාමය :-

ඔබේ මේසය ඉදිරිපිට පුටුවක වාඩිවන්න.ඔබ ඉදිරියෙන් කැඩපතක් තබා ගෙන ඔබේ ඇහි බැම දෙස බලා සිටින්න. ඇසි පිය නොහෙලා බලා සිටින්න. එහෙත් ඔබේ ඇස් දෙස නොබලන්න. ඇසට කඳුළු එනවිට ඒවා ඉවත් වන සේ ඇසිපිය හෙලා නැවත බලා සිටින්න.

ඔබට ඇසිපිය නොහෙලා ඇහිබැම දෙස විනාඩි විස්සක් හෝ ඊට වැඩි කාලයක් බලා සිටිය හැකි නම් මේ ව්‍යායාමය සම්පූර්ණ කළ ලෙස සලකන්න.

ඔබ මීට පෙර කළ ව්‍යායාමය සම්පූර්ණ කර තිබේනම් මේ ව්‍යායාමය සම්පූර්ණ කිරීමට ඔබට ගත වන්නේ ටික දිනකි. සඳ ඇති රැයක සඳ දෙස බලා සිටීමෙන් හෝ ඔබට මේ ව්‍යායාමය සම්පූර්ණ කළ හැකිය. මේ ව්‍යායාමය මගින් ඔබේ ඇස් පෙනීම දියුණු වේ.

ඔබේ ඇස්වල ආකර්ෂණ ශක්තියක් (අනුන් තමා වෙත ඇද ගැනීමේ ශක්තියක්) ඇති වේ.



Scanned by TapScanner

## දෙවන ව්‍යායාමය :-

ඔබ පුහුණු වන කාමරය තුළ සුපුරුදු ලෙස වාඩිවෙන්න. පපුව, පිට, බෙල්ල හොඳින් කෙලින් තබා ගන්න. දෙඇස් වසා ගන්න. ඔබේ මනසේ ඇති සිතුවිලි සියල්ලම ඉවත් කරන්න.

ඔබේ මනස ඉදිරිපිට ඔබ වඩාත්ම ආදරය කරන තැනැත්තාගේ රූපය මවා ගන්න. මෙම රුව දෙස ගෞරව සහිතව අවධානය යොමුකර විනාඩි පහේ සිට පහළොව දක්වා ඒ දෙස බලා සිටිමින් මේ ව්‍යායාමය අරඹන්න.

මානසික රූපයක් මවා ගන්න. එය පැහැදිලිව ස්ථිරව ඔබ මනස ඉදිරියේ තබා ගැනීමට උත්සාහ කරන්න. ඒ රූපය කෙරෙහි ඔබේ සිත අවධානයෙන් යොමු කරන්න. මුලදී එය පැහැදිලිව ස්ථිරව තබා ගැනීමට ඔබ අපොහොසත් වනු ඇත.

එහෙත් සිත අධෛර්යය කර නොගන්න. යමක් නැවත නැවත කිරීමෙන් විශාල බලයක් ඇති වේ. ඉක්මණින් හෝ කල්ගත වීමෙන් හෝ ඔබට මේ රූපය ඔබේ මනස ඉදිරියේ පැහැදිලිව ස්ථිරව තබා ගැනීමට ඔබ පොහොසත් වනු ඇත.

මෙම රූපය ඔබේ මනස ඉදිරියේ ඔබ පැහැදිලිව හා ස්ථිරව තබා ගත යුතුමය.මෙය විනාඩි විස්සක් තිහක් දක්වා අතර කාලයක් ස්ථිරව පැහැදිලිව මනසේ රඳවා ගත හැකි නම් මේ ව්‍යායාමය ද සම්පූර්ණ කළ ලෙස සලකන්න.



Scanned by TapScanner

## <u>තුන් වන ව්‍යායාමය :-</u>

ඇස් වසා ගන්න. ඔබේ අවධානය නාසයේ පහළ කෙළවරට යොමු කරන්න. මේ ලෙස ටික වේලාවක් ඒ කෙරෙහි සිත එකඟ කර ගෙන සිටින්න. **<u>මෙසේ ටික දිනක් ගතවන විට ඔබට නොයෙක් සුවඳ දැනෙන බව හැඟී යනු ඇත. ඔබේ ආඝ්‍රාණ ශක්තිය බොහෝ දියුණු වනු ඇත.</u>**

**<u>ඒ නිසා අන් අයට නොදැනෙන නොයෙක් සුවඳ ඔබට දැනෙනු ඇත.</u>**

**මේ ලෙසම දිවේ මුල කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ඔබගේ රස දැනීමේ හැකියාව බොහෝ දියුණුවනු ඇත.**

**මේ හැකියාවන් දියුණු වන අතරම ඔබේ සිත ද එකඟව තබා ගැනීමට ඔබට හැකිවනු ඇත.**

## <u>හතර වන ව්‍යායාමය :-</u>

ඔබට පහසු ඉදියව්වකින් සිටින්න. සිතෙහි ඇති සියලුම සිතුවිලි ඉවත් කර ඇස් වසා ගන්න. මනසින් ''ඕම්'' ශබ්දය අසන්න. එය කටින් නොකියා ඔබට ඒ වචනය ඇසෙන බව මෙනෙහි කරන්න. ඔබ හුස්ම ගන්නා විටත්, හුස්ම පිටකරන විටත් මේ වචනය ඔබට ඇසෙන බව මෙනෙහි කරන්න. ඔබට මනසින් ඇසෙන ඒ ''ඕම්'' හඬ කෙරෙහි ඔබේ අවධානය විනාඩි පහළොවක් විස්සක් දක්වා යොමු කරන්න. ඔබේ හදවතින් මේ ''ඕම්''' ' හඬ එන බව මෙනෙහි කරන්න.

ඔබ හුස්ම ගන්නා විටත්, පිට කරන විටත් මේ ''ඕම්'' හඬ දෝංකාර දෙන බව ඔබට හැඟී යනු ඇත. ඔබේ මුලු

අවධානයම ඒ දෝංකාරය ඇසීම සඳහා යොමු කරන්න. ඔබ දැඩි ලෙස උත්සාහ කළොත් ඔබට මේ ව්‍යායාමය කරන අතරතුර ''ඕම්'' ශබ්දය හැර වෙන කිසිම දෙයක් නොඇසෙන බව හැඟී යනු ඇත.

මේ ව්‍යායාමයේ ප්‍රතිඵලයක් ලෙස ඔබ තුළ අමුතු සතුටක් ඇති වන බව දැනෙනු ඇත. **මේ ව්‍යායාමය නිසා ඔබේ සතුට ඔබ තුළ පැතිරී යනු ඇත. කටහඬ මිහිරිවනු ඇත. මීට පෙර නොතිබූ ලෙස කටහඬ ආකර්ෂණීය වනු ඇත.**

## පස්වන ව්‍යායාමය :-

ඔබ පුහුණු වන කාමරය තුළ වාඩි වන්න. ඔබේ සිතට කිසිම සිතිවිල්ලක් පහළ වීමට ඉඩ නොදෙන්න. යම්කිසි සිතිවිල්ලක් පහළ වූ වහාම එය පලවා හැරීමට උත්සාහ කරන්න. ඔබේ සිත හිස්ව තබා ගන්න.

ඔබට විනාඩි පහළොවක්-විස්සක් දක්වා කාලයක් ඔබේ සිත හිස්ව තබා ගැනීමට හැකි වූ විට මේ ව්‍යායාමය සම්පූර්ණ කලා නම් වෙයි. .

**සාමය අත්පත් කර ගැනීමට ඉතාම සුදුසු ව්‍යායාමය මෙයයි.**

## හය වන ව්‍යායාමය :-

සුපුරුදු ලෙස වාඩිවන්න.

ඔබේ හදවත නොපිබිදුණු ඉතාම පැහැදිලි, දීප්තිමත්



Scanned by TapScanner

නීල වර්ණ ආලෝක ධාරා ඉන් පිටවන බව ඔබට දැනෙන්න අරින්න.

එහි ප්‍රතිඵලයක් ලෙස ඔබ තුළ සතුටක් ඇතිවන බව දැනෙන්න අරින්න.

ඔබ තුළ ඇතිවන සියලුම සිතුවිලි පලවා හැර ඒ කෙරෙහිම සිත සම්පූර්ණයෙන්ම එකඟ කර ගෙන විනාඩි පහළොවක් - තිහක් අතර කාලයක් සිටිය හැකි නම් මේ ව්‍යායාමය සම්පූර්ණ කළ ලෙස සැලකිය හැකිය.

ඔබේ හදවතින් පිටවන මේ දීප්තිමත් ආලෝකය කෙරෙහි ඔබේ මනස සම්පූර්ණයෙන්ම යොමු කළවිට බාහිර වශයෙන් ඔබ සිහි නැති තත්වයකට පත්වනු ඇත.

ඔබේ ඇතුළත සම්පූර්ණයෙන්ම අවදිවනු ඇත. ඔබේ ශරීර අභ්‍යන්තර ක්‍රියාදාමය ඔබේ කැමැත්ත අනුව සිදුවනු ඇත. මේ ව්‍යායාමය සම්පූර්ණ කළවිට විස්තර කළ නොහැකි බලවත් සතුටක් ඔබ තුළ ඇති වන බව ඔබට දැනෙනු ඇත.

**නිරන්තරයෙන් මේ ව්‍යායාමයේ යෙදීමෙන් අතීතය, වර්තමානය, අනාගතය, දැන ගත හැකි තත්ත්වයකට ඔබ පත්වනු ඇත.**

උදෑසන ඔබේ වැඩකටයුතුවලට නික්මීමට පෙර හෝ විවේකී අවස්ථාවල හෝ මෙම වාක්‍යයන් තෙවරක් හෝ ඔබට හැකි වැඩි වාර ගණනක් හෝ සිතින් කියවන්න. එසේ කිරීමෙන් ඔබට සතුටක් මෙන්ම පහසුවක් ද දැනෙනු ඇත.

## යෝජනාවන්

1) මම සෑම විටම ක්‍රමානුකූලව වැඩ කරමි. කිසිම විටෙක

කම්මැලිකම මා වෙත ඒමට ඉඩ නොදෙමි. මම සෑම විටම මගේ වැඩවල ස්වාමියා වෙමි.

2) යහපත් මෙන්ම අයහපත් වාතාවරණවලදී මම මා පාලනය කර ගනිමි.

3) මම කිසිම විටක මට අහිතකර වාතාවරණවලදී බිය නොවෙමි.ධෛර්යයෙන් හා සතුටින් ඒවාට මුහුණ දෙමි.

4) මම කිසිවිටෙක කලබල නොවෙමි. කෝපයට හෝ නොරිස්සීමට මා තුළ කිසිම ඉඩක් නොදෙමි.

5) මම කිසිම විටෙක නොපැකිලෙමි.අවිනිශ්චිත නොවෙමි. මම කළ යුතු දේ ඉක්මණින්ම තීරණය කරමි. ඒ අනුව කටයුතු කරමි.

6) මම මගේ වැඩ සටහන හෝ කිරීමට බලාපොරොත්තු වන දේ ඉතා දැඩි ලෙස (තදින්) ක්‍රියාවට නගමි.

7) මම මගේ කටයුතුවලදී සෑමවිටම අනුන්ට සත්‍යවාදී වෙමි. අවංක වෙමි.

8) මම කිසිම විටෙක කිසිම කෙනෙකුට අකාරුණික නොවෙමි. මම සියලු දෙනාම නොපැකිලව මුණ ගැසෙමි. ඔවුන්ට කාරුණික, ප්‍රිය, සුහද වචනයෙන් කතා කරමි.

9) මම මගේ එදිනෙදා ජීවිතයේදී මේ ප්‍රතිපත්ති පිළිපදිමි. මා මේ ප්‍රතිපත්ති වලින් වෙනස් කිරීමට කිසිම බලවේග යකට නොහැකි වනු ඇත.

**(ඉහත දැක්වෙන වාක්‍යයන් මුද්‍රණය කොට බෙදා හැරීමද කාර්යාල වල ප්‍රදර්ශනය කිරීමෙන්ද නිතර ඇස ගැටෙන තැන්වල ප්‍රදර්ශනය කිරීම ද මැනවි.)**



Scanned by TapScanner

# රෝග ඉවත් කිරීමේ පුහුණුවීම්

**සුපුරුදු ලෙස වාඩි වෙන්න. ''ප්‍රාණ'' යට අමතන්න. හුස්ම ගන්නා ගමන් මෙසේ සිතන්න. ''ඉතාම නිදහස් තත්වයක පිටවී මා වටා ඇති ප්‍රාණය, මා තුළට චුම්භක ශක්තිය (magnatic) හෝ රෝග සුවපත් කිරීමේ ශක්තිය පිටතින් මා තුළට ගෙන එන්න. එතැන් සිට ඒ ශක්තිය මා පිරිසිදු කරයි. සියලුම රෝගාබාධ හා ගිලන් බව මා කෙරෙන් ඉවත් කරයි.''**

තත්පර කීපයකට ඔබ තුළ හුස්ම රඳවා ගන්න. එසේ නැතිනම් අපහසුවක් නැතිව ඔබට හුස්ම ඇතුළත රඳවා ගත හැකි වේලාවක් එසේ කරන්න. එසේ කරන අතර මුලින් කී යෝජනාවන් කෙරෙහි ඔබේ මුළු අවධානයම යොමු කරන්න.

**දැන් හුස්ම පිට කරන්න. එසේ කරන ගමන් මෙසේ සිතන්න.''මම මා තුළ ඇති සියලුම අපවිත්‍ර දෑ හා සියලුම රෝගාබාධ මගේ සිරුරින් පිට කරමි. ප්‍රාණය ඒවා පළවා හැරීමට පටන් ගෙන ඇත. ඒවාට තවදුරටත් මා තුළ රැඳී සිටිය නොහැකිය.''**

දැන් නැවත හුස්ම ගෙන ඇතුළත රඳවා ගෙන ඒ සිතුවිලි කෙරෙහි මුලින් යෝජනා කළ පරිදි ඔබේ අවධානය යොමු කරන්න. මේ ලෙස නැවත නැවත හුස්ම ඉහළ පහළ හෙලන්න. මේ අතර ඔබට අවශ්‍ය පරිදි ඔබ හැඩ ගැසෙන බව සිතන්න. ඇත්ත වශයෙන්ම ඔබ තුළ ඇති දුර්වලකම්, රෝග ආදී සියල්ලම ඉවතට විසි වී ඇති බව ඔබට හැඟී යනු ඇත.



Scanned by TapScanner

මේ ව්‍යායාමය විනාඩි දහයක් විස්සක් දක්වා වාර ගණනක් කළ පසුව නවත්වන්න. ඉන්පසුව ඔබට කැමති තත්වයෙන් ඔබේ රූපය මානසිකව මවා ගන්න. මෙය දිනපතා පුහුණු කරන්න.

## පුහුණුව :

1) ඔබේ පූජාසනය ඉදිරිපිට **උතුරු දිශාව** බලා පහසු ඉරියව්වකින් වාඩිවන්න. උසස් ගුප්ත (සැඟවුනු) බලයන් කෙරෙහි ඔබේ ගත හා සිත පත් කර ගැනීම සඳහා පහත සඳහන් ගුප්ත ඇදහීම නැවත නැවත ප්‍රගුණ කරන්න. මෙය ඔබට හඬ නගා හෝ සිතින් හෝ ඔබට කට පාඩම් වනතුරු සාමාන්‍ය ලෙස හෝ කියවිය හැකිය.

**''විශ්වයේ උසස් විෂයයන් වන සත්‍යයේත්, සුන්දරත්වයේත්, යහපතේත්, නැණවත් බවේත් සැඟවුණු (ගුප්ත) මූලධර්ම කෙරෙහි මම දැන් මාව කැප කරමි. විශ්වය පිළිබඳ සැඟවුණු (ගුප්ත) බලයන් මම දැන් මා වෙත ඇද ගනිමි. මම දැන් ඉතා බලවත් වෙමි.''**

**''මගේ මොළයේ සෛලවලටත්, මගේ ශරීරයටත් දැන් ක්‍රියාශීලී ජීව බලය හා ශක්තිය කවන ලෙස විශ්ව ශක්තියේ සැඟවුණු බලයෙන් මම දැන් ඉතා ඕනෑකමින් ඉල්ලමි. යාඥා කරමි.''**

**''මම මගේ මොළයේ හා ශරීරයේ සෑම පිබිදීමකින්ම ජීවය පැහැදිලිව සටහන් කරමි. මම දැන් ඉතාම සජීවි**

**ලෙස ක්‍රියාශීලි වෙමි. නිරෝගී වෙමි. ශක්තිමත් වෙමි. ක්‍රියාශීලි බවින් තරුණ වෙමි. බලවත් වෙමි.''**

**''දැන් විශ්වයේ උසස් බලයයන්ට මම ආයාචනා කරමි. සියලුම සරු බව හා සමෘද්ධිය නිපදවන මැවීමේ මුලධර්මයන් වෙත මම දැන් පැමිණ සිටිමි.''**

**2 ''ඉහත සඳහන් ආයාචනය කියවා ඉවර වූ පසුව නිහඬ භාවනාවේ විනාඩි කීපයක් යෙදෙන්න. ඔබේ මනස, ශරීරය හා ආත්මය (ප්‍රාණය) විශ්වය පිළිබඳ බලයෙන් නහවමින් සූර්යයාගේ රන්වන් ආලෝකය පෘථිවිය දෙසට ගලන ආකාරය මනසින් දකින්න. ඔබ රන්වන් ආලෝකයේ වේගවත් සුලියක් මැද සිටගෙන සිටින ආකාරය මනසින් මවාගෙන දහ වතාවක් හුස්ම ගන්න. සෙමින් හුස්ම හෙලන්න ''.**

''ඔබේ මොළයේ සියලුම සෛල අතරින් හා ශරීරයෙන් මේ ආලෝකය ගලා යන සැටි දකිමින් පහත සඳහන් ආයාචනය නැවත නැවත කියවන්න ''.

'' මගේ මොළයේ සෑම සෛලයක් තුළින්ම හා ශරීරයෙන් සැඟවුනු බලයේ රන්වන් ආලෝකය මම දැන් උරා ගනිමි. මම සැඟවුණ බලයේ අති විශාල තාරකා මණ්ඩලයේ කේන්ද්‍රයක් වෙමි. මගේ මනසේ උසස් මධ්‍යස්ථාන වලින් ඒවා පැහැදිලිව සටහන් කරමි. එයින් මට අනන්ත බලයක් ලැබේ. සියලුම රහස් දැනගත හැකි වේ. ඉතා බලවත් විය හැකිවේ. **ප්‍රාතිහාර්ය පෑමට හැකි වේ. ''**

''දැන් ඉටිපන්දම දල්වා ඒ ඉදිරිපිට වාඩි වී ටික වේලාවක් සම්පූර්ණ නිශ්ශබ්දතාවයෙන් සිටින්න. විශ්වය පිළිබඳ වූ ආකරයෙන් නිකුත් කරන උසස් මනස පිළිබඳ ගැස්ම

(නාඩි වැටීම) ඔබේ මනසට ඉක්මණින් තේරුම් ගැනීමට ඉඩ හරින්න. ''

''ඔබ ඔබේ මනස හිස් කරන විට රූප හා සිතුවිලි ඔබේ මනසේ කේන්ද්‍රවලට ගලා ගෙන එනු ඇත. මේවා සොබා දහම අනුව සිදුවන ඒවා විය හැකිය. මේ මගින් ඔබට භාවිතා කළ හැකි වැදගත් තොරතුරු දැනගත හැකි වනු ඇත ''.

''ඔබ ගැඹුරු භාවනා තත්වයකට පත්වන තුරු වෙනස් මනස්වල උසස් සිතුවිලි බලයන් මත ඔබ මෙය නොනවත්වා කරගෙන යන්න. එමගින් ඔබට ඔබේ යහපත සලසන රහස් දැනගත හැකි වනු ඇත. ''

''නිශ්ශබ්දව වාඩි වී සිටිමින් නියත උපදෙස් හෝ මඟපෙන්වීම් ඉල්ලන්න.

ඔබේ භාවනාවේදී ඔබට ලිඛිත ආයාචනා මගින් උපදෙස් හෝ මඟපෙන්වීම් ඉල්විය හැකිය. ඒවා මෙවැනි ප්‍රශ්න විය හැකිය ''

''මගේ ගැටලුව විසඳා ගත හැක්කේ කෙසේද?''

''මීට වඩා හොඳ රැකියාවක් සම්බන්ධව සෙවිය යුත්තේ කොහේද?''

''මගේ බිල් ගෙවීමට අවශ්‍ය රුපියල් 10000 ක මුදල ලබා ගන්නේ කෙසේද?''


''මේ තැනැත්තා මගේ අනාගත විවාහයට ගැලපේද?''

''මා ජීවත් විය යුත්තේ නගරයේද? ගමේද?''


# භාවනාව

## සුඛාසනයෙන් හෝ පද්මාසනයෙන් වාඩිවෙන්න.







භාවනාව සඳහා කාන්තාවන් මෙලෙස අර්ධ පර්යංකයෙන් වාඩි වීම මැනවි.



සුඛාසනයෙන් වාඩි වීම.



පද්මාසනයෙන් වාඩි වීම.



**බුරුමයේ රජතුමා විසින් අභිධජ මහා රට්ඨ ගුරු අග්ග මහා පණ්ඩිත අති පූජ්‍ය බලන්ගොඩ ආනන් මෛත්‍රෙය මහනාහිමියන් වෙත පිරිනමන ලද සන්නස් පත්‍රය**

# Meditation

1. sit in Sukhasana or Padmasana.

Seat yourself at a distance of about 2 feet facing the wall towards north. Prepare a black spot of the size of a Rupee and hang it on the wall in such a manner that the blot on the wall comes exactly in the line with your eyes.

Sit erect and gaze on the black spot. Don't strain open your eyes but gaze naturally and without blinking. If water

29

while sitting in the silence
ask for definite instruction
or guidance. You can take
with you in your meditat-
ion written requests on
which you wish advice
and guidance. These can
be such questions as;
How can I solve my
problems? Where
should I look for
a better job? How can I
get $ 1000 that I need to
pay my bills? Is this
person suited to me for
future marriage? Should
I live in the city or the
country?"

## බලගතු ආරක්ෂක පිරිතක්

වරක් බුරුමයේ ලැව් ගින්නක් ඇති විය. මුළු ප්‍රදේශයක්ම ඉන් දැවී ගිය නමුදු එක් කඳු මුදුනක් පමණක් නොදැවී ඉතිරි විය. පුරා විද්‍යාඥයන් එහි රහස සොයා බැලීමේ දී එම කඳු මුදුනේ තිබී දඹ රන් බුදු පිළිමයක් හමුවී ඇත. සියළු ආරක්ෂාවනට කියන මෙම බලගතු ඇරක්ෂක පිරිත එම බුදු පිළිමය යට තැන්පත්ව තිබී හමු වී තිබේ .

තිස්සරණ වනයේ වැඩ විසූ ප්‍රධාන කම්මට්ඨානාචාර්ය අති පූජ්‍ය පණ්ඩිත මාතර ඥානාරාමාධිපති වහන්සේද භාවිතා කළ ඇරක්ෂක පිරිතකි .

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

( තුන් වරක් කිව යුතුයි )

ඕං නමෝ ඉතිපි පිටකත්තයං අනිච්ච දුක්ඛ අනත්තා

සප්තබොජ්ජංඝො අට්ඨංගිකොමග්ගො චතු සතිපට්ඨානං

සබ්බත්ත ඉන්ද්‍රො සහස්සසුරියෝ ඕං නමෝ සත්තානං

රාජ භයං, චෝර භයං, අග්ගි භයං, උදක භයං ,සත්ත භයං , සබ්බ භයං ,ජේයෙයා ජේයතු මංගලම්


අනිච්චං සංඛතං පටිච්චසමුත්පන්නං ඛය ධම්මං, වය ධම්මං, විරාග ධම්මං ,නිරෝධ ධම්මං, ඛමතු .

මෙම බලගතු ආරක්ෂක පිරිත නිතර ඔබ ඇස ගැටෙන තැනෙක තබා ගන්න. නිතර නිතර කියවන්න . ඔබ කාර්යාලයේ විදුරුව යට තබා ගන්න .ගමනක් බිමනක් යන විට කියවා යන්න. සෑම සුබ කටයුත්තකටම පෙර මෙම බලගතු පිරිත සිහිපත් කරගන්න. ඔබට නිතැතින්ම බුද්ධ,ධම්ම,සංඝ යන තෙරුවන් සරණේ ආරක්ෂාව අනිවාර්යෙන්ම ලැබෙනු ඇත . මෙම මන්තරය දැනට අපේ රටේ භාවිතා කෙරෙන රුවන්මැලි මහා සෑයේ නිදන් කර ඇති බුද්ධ මන්ත්‍ර ගාථාවන් සේම බලවත්ය . මෙම බුද්ධ මන්තරය පිටපත් කර ධර්ම දානයක් වශයෙන් බෙදා දෙන්න .


(බදුල්ලේ මෛත්‍රී රත්නායක) - ( 071-9633422 ) ( 0112 - 917572 )



Scanned by TapScanner



මහ නා හිමියෝ විවේක සුවයෙන් සිටින අවස්ථාවක ගන්නා ලද ජායාරූපයකි.



මහ නා හිමියන් මැදබැද්දේ නන්දරතන හිමිනම සමග ජායාරූපයට පෙනී සිටි අවස්ථාවක්.



මහ නා හිමියන් අප රූපවාහිනී කණ්ඩායම සමග ජායාරූපයකට මුහුණ දුන් අවස්ථාවක්.



Scanned by TapScanner